# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,499 - 2026 ජූලි මස 24 සිකුරාදා - 2026.07.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු … … | - |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | - |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 අගෝස්තු මස 14 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජූලි මස 31 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය [www.documents.gov.lk](http://www.documents.gov.lk) වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


0000 - B 82812 - (2026/07)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ෴ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයින් සඳහා නීති සහ උපදෙස්

1976 අංක 19න් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ විධිවිධානයන්ට සහ වරින්වර පනවනු ලබන නීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට සියලු විභාග අපේක්ෂකයින් බැඳී ඇත.

1976 අංක 19 සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ 20 වගන්තිය මගින් විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත කොන්දේසි හා සීමා කිරීම් නියම කරනු ලැබේ.

සියලු විභාග අපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතු අතර මෙම නීති කිසිවක් උල්ලංඝනය කරන විභාග අපේක්ෂකයකුට විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි පහත දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකි ය.

(i) විමර්ශනයට භාජනය වූ මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම
(ii) විමර්ශනයට භාජනය වූ විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සකු කිරීම
(iii) මුළු ජීවිත කාලයටම විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන සියලු විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(iv) නිශ්චිත කාලවකවානුවක් සඳහා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(v) අත්හිටවූ විභාග තහනමක් සහිතව ලිපියක් නිකුත් කිරීම
(vi) සහතික පත්‍රය යම්කිසි කාලසීමාවක් තුළ තහනම් කිරීම
(vii) ප්‍රසිද්ධ විභාග පනත යටතේ අපරාධ නඩුවක් පැවරීම සඳහා විභාග අපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ එම ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම
(viii) විභාග අපේක්ෂකයා රජයේ සේවකයකු වන අවස්ථාවකදී විභාග අපේක්ෂකයාගේ ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් අදාළ විභාග අපේක්ෂකයාගේ පත්වීම් බලධාරියා වෙත (විනය ක්‍රියා මාර්ග ගැනීම සඳහා) වාර්තා කිරීම

විභාගයට පෙර හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ මොනයම් අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

1. සියලුම විභාග අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී සහ විභාග පරිශ්‍රය තුළදී විභාග ශාලාධිපතිට සහ ඔහුගේ කාර්ය මණ්ඩලයට ද අනෙකුත් විභාග අපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස හැසිරිය යුතුය. එසේම, විභාග අපේක්ෂකයන් විභාග පරිශ්‍රයේ දේපළවලට හෝ විභාග කාර්ය මණ්ඩලයේ පෞද්ගලික දේපලවලට කිසිදු අන්දමකින් හෝ අලාභ හානි නොකළ යුතු ය.

2. විභාග අපේක්ෂකයින් විභාගය පවත්වාගෙන යන කාලසීමාව තුළදීත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතිගේ සහ ඔහුගේ කාර්ය මණ්ඩලයේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම ආරම්භ කර පැය භාගයක් ගත වූවාට පසු කිසිදු විභාග අපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කර ගනු නොලැබේ. විභාගය අවසන් වන තුරු ද කිසිම අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටව යාමට ඉඩ ලබා දෙනු නොලැබේ. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට නියමිත වේලාවට සහභාගී වීමට කටයුතු කළ යුතු ය.

4. සෑම විභාග අපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුය. තමන්ට නියම කරන ලද අසුන හැර වෙනත් තැනක අසුන් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදු වේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළතදී විභාග කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතා බහ කිරීම හෝ පණිවිඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම  තහනම් වේ.

6. විභාග අපේක්ෂකයකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ අපේක්ෂකයාගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම ලිවීම, උත්තර පත්‍රය හඳුනාගත හැකි වන අයුරින් යම් සලකුණක් හෝ සටහනක් යෙදීම, උත්තර පත්‍රවල අසභ්‍ය හෝ අනවශ්‍ය දේ ලිවීම, උත්තර පත්‍ර සමග මුදල් නෝට්ටු ඇමිණීම සපුරා තහනම් වේ. අන්‍ය විභාග අපේක්ෂකයකුගේ විභාග අංකය තම උත්තර පත්‍රයේ ලිවීම ද වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංක ලියා ඇති උත්තර පත්‍ර ද ප්‍රතික්ෂේප කිරීම සිදු කෙරෙනු ඇත.

7. තමන් වෙත විභාග ශාලාවේදී සපයන කඩදාසි (විභාගය පැවැත්වෙන දිනයට අදාළව නිරීක්ෂකගේ කෙටි අත්සන හා දිනය යොදා ඇති පිළිතුරු ලිවීමේ කඩදාසි) හැර ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙනත් තැනක හෝ කිසිවක් නොලිවිය යුතු ය. මෙම උපදෙස්වලට පටහැනිව කටයුතු කිරීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සලකනු ලැබේ.

8. විභාග අපේක්ෂකයින් වෙත සපයනු ලබන කඩදාසි හෝ පිළිතුරු ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක් ම පැහැදිලිව කපා හැර උත්තර පත්‍රයට ඇමිණීම හෝ විභාගය අවසානයේ පිළිතුරු පත්‍ර සමග භාරදීම හෝ ලබා දෙන උපදෙස් පරිදි සිදු කළ යුතුය. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටතට ගෙනයාම තහනම් වේ. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක නැවත ලියවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතු ය.

9. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම් ය. මෙම සියලු ද්‍රව්‍යයන් විභාග කොමසාරිස් ජනරාල් සතුවන අතර මෙම නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන ලිපි ද්‍රව්‍ය හා එක් එක් විභාගයේදී ළඟ තබා ගැනීමට ලිඛිතව අවසරදී ඇති ද්‍රව්‍යයන් හැර වෙනත් සටහන් පොත්, සටහන් ඇතුළත් කොළ හෝ කොළ කැබලි යනාදිය විභාග ශාලාව තුළ විභාගයට පෙනී සිටින අවස්ථාවේදී තමා සන්තකයේ හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතු ය. එසේම විභාග ශාලාව තුළ දී ජංගම දුරකථන, විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) තමා සන්තකයේ හෝ සමීපයෙහි තබා ගැනීම සහ එම උපකරණ / උපාංග භාවිතා කර බාහිර පාර්ශ්වයන්ගේ උදව් ලබා ගැනීම හා විභාගය පැවැත්වෙන අතරතුර වෙනත් පාර්ශ්ව හා සමාජ මාධ්‍ය වෙත තොරතුරු යැවීම වංචනික ක්‍රියාවක් සේම දඬුවම් ලැබිය හැකි වරදක් වන්නේ ය.

11. විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග ඉහත 10 ඡේදයේ විස්තර කර ඇති කාර්යයන් සඳහා භාවිතා කර අසු වුවහොත් එම උපකරණ / උපාංග අදාළ විමර්ශන කටයුතු  අවසන් වන තුරු විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ භාරයට ගැනීමට කටයුතු කරනු ලැබේ.

12. විභාග ශාලාවේ අසුන් ගැනීමෙන් පසු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී කිසිම විභාග අපේක්ෂකයකු ළඟ, විභාගය සඳහා ගෙන ඒමට අවසර ලබාදී නොමැති කිසිදු ද්‍රව්‍යයක් හෝ උපකරණයක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් ම තහනම් ය. විභාග ශාලාධිපති හෝ කාර්ය මණ්ඩලය නියම කළහොත් සෑම අපේක්ෂකයකුම තම සන්තකයේ තිබෙන දෑ සහතික කිරීමට සහ පරීක්ෂා කිරීමකට යටත් වන අතර මෙම අවශ්‍යතා කඩ කිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට උත්සහ දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. යම් අපේක්ෂකයකු වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ සංඥා මගින් හෝ වෙන කිසිවකින් හෝ කොපි කිරීම හෝ කොපි කිරීමට ප්‍රයත්න දැරීම හෝ වංචා සහගත ලෙස කටයුතු කිරීම හෝ වරදක් වන්නේ ය. වෙන අයදුම්කරුවකුට උදව් දීම ද වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ විභාග කාර්ය මණ්ඩලයෙන් හෝ උදව් ලබා ගැනීම ද වරදක් වන අතර උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසියට යටින් තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතු ය.

14. විභාගය ආරම්භ වී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයකුට ඉඩ දෙනු නො ලැබේ. එහෙත් වැසිකිළි/කැසිකිළි යාමට අවශ්‍යතාවයක් උදෙසා විභාග අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටතට යන්නට වුවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර කාර්ය මණ්ඩලයේ නිලධාරියකුගේ සුපරීක්ෂාකාරිත්වය යටතේ අපේක්ෂකයාට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එලෙස පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු/ඇය සෝදිසියකට භාජනය විය යුතු ය.

15. විභාග ශාලාවේ පිළිතුරු ලිවීමට පටන් ගැනීමට පෙර හෝ පසුව නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් වන්නේය. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ ව්‍යාජ අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීම වංචනික ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

16.විභාග අපේක්ෂකයකු හෝ විභාග අපේක්ෂකයකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

17. විභාග අපේක්ෂකයන් පහත උපදෙස් පරිදි ක්‍රියා කළ යුතු ය. ː

(i) සෑම විභාග අපේක්ෂකයෙකුම තම ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කර ගැනීමත්, ඉල්ලුම් කරන ලද විෂයයන් හා ප්‍රවේශ පත්‍රයේ සඳහන් විෂයයන් අතර නොගැලපීමක් පවතින්නේ නම් විභාග දෙපාර්තමේන්තුව විමසා විභාගයට පෙර සංශෝධනය කර ගැනීමත් සිදු කළ යුතු ය.

(ii) විභාගය පටන් ගැනීමට පැය බාගයකට (1/2) පෙර විභාග ශාලාව වෙත පැමිණීම සුදුසු වන අතර විභාග ශාලාව නිශ්චිතව නොදන්නා විට විභාගය පටන් ගන්නා දිනට කලින් ඒ පිළිබඳ සොයා බලා නියම ස්ථානය නිශ්චිතව හඳුනා ගැනීම යෝග්‍ය වේ.

(iii) විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍රය ඉදිරිපත් කර තම අනන්‍යතාව තහවුරු කළයුතු ය.

(අ). අනන්‍යතාව ඔප්පු කිරීමට අවශ්‍ය ලේඛන විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට කටයුතු කරන අතර, යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ පිළිබඳ විභාග ශාලාධිපති දැනුවත් කර විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීම කටයුතු කළයුතු ය.

(ආ). සෑම අපේක්ෂකයකුම තම අනන්‍යතාව පැහැදිලිව පෙනෙන ලෙස සම්පූර්ණ මුහුණ හොඳින් හඳුනාගත හැකිවන අයුරින් විභාගය පැවැත්වෙන කාලසීමාව තුළ විභාග ශාලාවේ රැඳී සිටිය යුතු ය.

(iv) විභාග අපේක්ෂකයන් බ්ලූටූත් වැනි විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) භාවිතා නොකරන බව සහතික කර ගැනීම සඳහා විභාග ශාලාවේදී තම දෙකන විවෘතව පැහැදිලිව පෙනෙන ලෙස තබාගත යුතු ය.

(v) විභාග ශාලාවේදී ඔබට ලබා දෙනු ලබන  කඩදාසි හැර වෙන මොන ම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුය. ඉතිරිවන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ මේසය මත තබා යා යුතු ය.

(vi) විභාග අපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, මකන, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතු ය.

(vii) තමන් භාවිතා කරන පිළිතුරු ලිවීමේ පොත සහ සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය පැහැදිලිව සඳහන් කළ යුතු ය. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද, පිරිසිදුව ද උත්තර ලිවිය යුතු ය. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු එම ප්‍රශ්නයේ ම අනෙක් කොටස පටන් ගැනීමට පෙර එක් රූලක්වත් හිස්ව තිබිය යුතුය. සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

(viii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන් කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුය. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතු වන බැවින් ප්‍රශ්න අංක නිවැරදිව යෙදීමට කටයුතු කළ යුතු ය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද, සෑහෙන පමණ විශාලව ද තිබිය යුතු ය.

(x) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරාගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින් සඳහන් කර ඇති උපදෙස් හොඳින් කියවා බැලිය යුතුය. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට අනුව පිළිතුරු ලබාදී නොමැති අවස්ථාවලදී ලකුණු ලබා දීම සිදු කරනු නොලැබේ.

(xi) එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද පොතට අමතරව ලියන කඩදාසි පිටු අංක පිළිවෙළ අනුව එකතුකර වම් පැත්තේ ඉහළ කෙළවරේ නොගැලවෙන සේ ගැටගැසීම / ඇමිණීම කළයුතුය. පිළිතුරු පත්‍රය භාරදීමට පෙර සියලුම පිළිතුරු ලියූ කොළ අමුණා තිබේද යන්න තහවුරු කරගත යුතුය. පිළිතුරු පත්‍ර භාරදුන් පසුව විභාග මධ්‍යස්ථානයෙන් බැහැරට ගෙන ගිය කිසිදු පිළිතුරු ලියූ කඩදාසියක් ඇගයීමට ලක් කරනු නොලැබේ.

(xii) ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්යය මණ්ඩලයේ නිලධාරියකුට භාරදිය යුතුය. උත්තර පත්‍ර එකතු කරන තුරු ඔබගේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම්විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකි ය.

(xiii) යම් කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුට කථා කිරීමට අවශ්‍ය වූ විට අන් අයට බාධාවක් නොවන සේ දෙවරක් මේසයට තට්ටු කිරීමෙන් සංඥා කළ යුතු ය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව**

නවාතැන් බංගලා සහායක තනතුර සඳහා අයදුම්පත් කැඳවීම - 2026

1. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ පිහිටි නවාතැන් බංගලා සඳහා නවාතැන් බංගලා සහායකයින් විසි දෙනෙකු (20) බඳවා ගැනීම පිණිස නියමිත සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. බඳවා ගැනීමේ සුදුසුකම්:

2.1 අධ්‍යාපන සුදුසුකම්: අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක්(02) ක් සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම.

2.2 වෘත්තීය සුදුසුකම්: ක්ෂේත්‍රයේ ලබා ඇති වෘත්තීය සුදුසුකම් විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

2.3 පළපුරුද්ද: ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

2.4 කායික සුදුසුකම්: සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

2.5 වයස් සීමාව: අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

2.6 වෙනත් සුදුසුකම්:

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා සලකා බැලෙන සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

3. තනතුරට අදාළ වැටුප් පරිමාණය:

3.1 වැටුප් කේත අංකය: රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 දක්වා ඇති පරිදි වැටුප් කේත අංක PL 1 -2025

3.2 වැටුප් පරිමාණය: රු. 40,000 – 10x450 -10x490 -10x540 -12x590 – රු. 61,880/- (මාසික) වන අතර එම වැටුප ඔබට හිමිවන්නේ 2027.01.01 දින සිටය. පත්වීම ක්‍රියාත්මකවන දින සිට මෙම චක්‍රලේඛයේ උපලේඛන 111 හි විධිවිධාන පරිදි ඔබට වැටුප් ගෙවනු ලැබේ.(ඉහත පත්වීමේ දින සිට වසර 03ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.).

4. සේවා කොන්දේසි:

4.1 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු ය.

4.2 මෙම තනතුරට බඳවා ගනු ලබන්නන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් නවාතැන් බංගලාවක සේවය කිරීමට බැඳී සිටී.

4.3 තෝරාගනු ලබන අපේක්ෂකයින් තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් විධිවිධානවලටද, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට හා දුම්රිය දෙපාර්තමේන්තුවේ රීතීන්, චක්‍රලේඛවලට හා නීති රෙගුලාසිවලටද යටත් විය යුතු ය.

4.4 මෙම තනතුරට පත්කරනු ලබන නිලධාරින් පත්වීම් දින සිට වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වනු ඇත.

4.5 තනතුරට බඳවා ගැනීමෙන් පසු ඔබ පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූ භාෂා මාධ්‍යට අනුව වසර තුනක්(03) ක් ඇතුළත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා අනුශාංගික චක්‍රලේඛයන්හි විධිවිධාන පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු ය.

5. බඳවා ගන්නා ක්‍රමය: ඉහත 02 වැනි ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර ඉහළම ලකුණු ලබා ගන්නා අනුපිළිවෙලින් පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගනු ලැබේ. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් පරිදි ලකුණු ප්‍රදානය කෙරේ.

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 |

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| වෘත්තීය සුදුසුකම් | 25 |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද | 40 |
| බාහිර ක්‍රියාකාරකම් | 10 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය | 05 |
| **එකතුව** | **100** |

5.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටිය පහත දක්වා ඇත.

| | |
|---|---|
| <u>**අතිරේක අධ්‍යාපන සුදුසුකම්( මුළු ලකුණු 20)**</u><br>මූලික අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු ලබා නොදේ (අ.පො.ස. සා.පෙ. විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී සම්මාන දෙකක් සහිතව විෂයයන් 06ක් සමත් වීම) | ලකුණු |
| අ.පො.ස. සා.පෙළ විභාගයේ දී සම්මාන සාමාර්ථ 02කට වඩා සම්මාන ලබා ඇති විෂයයන් සඳහා එක් විෂයකට ලකුණු 02 බැගින් උපරිම විෂයයන් 05ක් සඳහා | 10 |
| අ.පො.ස. උ.පෙළ විභාගයේ දී සමත් වී ඇති විෂයක් සඳහා ලකුණු 01 බැගින් ද සම්මාන සාමාර්ථ ලබා සමත් වී ඇති විෂයක් සඳහා ලකුණු 02 බැගින් ද විෂයයන් 03ක් සඳහා(ඉංග්‍රීසි විෂයය හැර) | 6 |
| ඉංග්‍රීසි විෂය සම්බන්ධයෙන් ලබා ඇති සහතික/ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | 2 |
| වෙනත් භාෂාවක් සම්බන්ධයෙන් ලබා ඇති සහතික/ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | 2 |
| <u>**වෘත්තීය සුදුසුකම්( මුළු ලකුණු 25)**</u><br>පිළිගත් ආයතනයකින් ආහාර සකස් කිරීම(Professional Cookery), හෝටල්, රෝහල්, කාර්යාල සහ නිවාස වැනි ස්ථානවල පිරිසිදු කිරීම සහ නඩත්තු කිරීම(Housekeeping Services), හෝටල්, අවන්හල්, කෑමපාන ලබාදෙන ස්ථානවලදී ආහාරපාන සපයන සහ අමුත්තන්ට සේවය ලබා දීම (Food & Beverage Associate/ Crew member) හෝ තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති නිපුණතාවයන් සලකා බලනු ලැබේ (ලබා ඇති ඉහළම එක් නිපුණතාවයක් සඳහා පමණක් ලකුණු හිමිවේ.) | ලකුණු |
| තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ලබා ඇති NVQ 04 හෝ ඊට වැඩි පාඨමාලාවක් සඳහා | 25 |
| තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ලබා ඇති NVQ 03 පාඨමාලාවක් සඳහා | 20 |
| වෙනත් පාඨමාලා සඳහා | 10 |
| <u>**තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද( මුළු ලකුණු 40)**</u><br>ආයතන, හෝටල්, නවාතැන් බංගලා, රෝහල්, ගබඩා ක්ෂේත්‍රයේ පිරිසිදු කිරීම, අතුගෑම, වැකුම් කිරීම, සේදීම, මොප් කිරීම, නාන කාමර පිරිසිදු කිරීම හා නිදන කාමර පිරිසිදු කිරීම හා පිළිවෙලට සකස් කිරීම, ගෘහ භාණ්ඩ, අනෙකුත් උපකරණ පිරිසිදු කිරීම හා නඩත්තු කිරීම, භාණ්ඩ ඇණවුම් කිරීම හා සටහන් තැබීම, ආහාර පිසීම, සංග්‍රහ කිරීම, අපද්‍රව්‍ය නියමිත පරිදි බැහැර කිරීම හෝ තනතුරට අදාළ ක්ෂේත්‍රයක ලබා ඇති සේවා පළපුරුද්ද සලකා බලනු ලැබේ.(සේවා පළපුරුද්දක් සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන සේවා සහතික 02 ක් පමණක් සලකා බලනු ලැබේ.) | ලකුණු |
| සේවා පළපුරුද්ද වසර 04 හෝ ඊට වැඩි නම් එක් සේවා සහතිකයකට ලකුණු 20 බැගින් සේවා සහතික දෙකක්(02) සඳහා | 40 |
| සේවා පළපුරුද්ද වසර 02 හෝ ඊට වැඩි වසර 04 ට අඩු නම් එක් සේවා සහතිකයකට ලකුණු 10 බැගින් සේවා සහතික දෙකක්(02) සඳහා | 20 |
| සේවා පළපුරුද්ද වසර 01 හෝ ඊට වැඩි වසර 02 ට අඩු නම් එක් සේවා සහතිකයකට ලකුණු 05 බැගින් සේවා සහතික දෙකක්(02) සඳහා | 10 |

| | |
|---|---|
| සේවා පළපුරුද්ද මාස 06 හෝ ඊට වැඩි වසර 01 ට අඩු නම් එක් සේවා සහතිකයකට ලකුණු 2.5 බැගින් සේවා සහතික දෙකක්(02) සඳහා | 05 |
| <u>**බාහිර ක්‍රියාකාරකම්( මුළු ලකුණු 10)**</u> | **ලකුණු** |
| ක්‍රීඩා/ ශිෂ්‍යභට ආදී කුසලතා සම්බන්ධයෙන් ලබා ඇති පිළිගත හැකි සහතික දෙකකට ලකුණු 02 බැගින් | 4 |
| සෞන්දර්ය කුසලතා සම්බන්ධයෙන් ලබා ඇති පිළිගත හැකි සහතික එකක් සඳහා | 2 |
| සමාජ සේවා කටයුතු සම්බන්ධ සහතික/ දහම් පාසල් තරඟ විභාග සහතික එකක් සඳහා | 2 |
| ඉහත ලකුණු සඳහා ඉදිරිපත් කර නොමැති වෙනත් බාහිර කුසලතාවක් සම්බන්ධයෙන් ලබා ඇති පිළිගත හැකි සහතික එකක් සඳහා | 2 |
| <u>**සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය( මුළු ලකුණු 5)**</u> | **ලකුණු** |
| සන්නිවේදනය -පැහැදිලිව, ආචාරශීලීව, විශ්වාසයෙන් කතා කිරීම | 2 |
| සවන්දීම - හොඳින් ඇසීම හා තේරුම් ගැනීම | 2 |
| මනා නිරූපණය - යෝග්‍ය ඇඳුම්, ශරීර භාෂාව, සහ ස්වභාවය | 1 |

(ඉහත ලකුණු ලබා දීම සඳහා සලකා බලනු ලබන සියලුම සුදුසුකම්(සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය හැර) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සම්පූර්ණ කර තිබිය යුතු යි.)

6. අයදුම් කළ යුතු ආකාරය :

6.1 පහත දක්වනු ලබන ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව සකස්කර ගත් අයදුම්පත් 2026 අගෝස්තු මස 25 වැනි දිනට හෝ එදිනට පෙර " දුම්රිය සාමාන්‍යාධිකාරී, දුම්රිය මූලස්ථානය, ඕල්කට් මාවත, තැ.පෙ. 355, කොළඹ 10" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "නවාතැන් බංගලා සහායක තනතුරට බඳවා ගැනීම - 2026" යනුවෙන් සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

6.2 අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවෙකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු හෝ ලවා සහතික කරනු ලැබ තිබිය යුතු ය.

6.3 දැනටමත් රාජ්‍ය /අර්ධ රාජ්‍ය හා පළාත් රාජ්‍ය අංශයේ සේවයේ නියුතු ඉහත 02 යටතේ සුදුසුකම් සම්පූර්ණකර ඇති නිලධාරීන්ට ද මෙම තනතුර සඳහා ඉල්ලුම් කළ හැකිය. එවැනි අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර තම අංශ ප්‍රධානියා මගින් එවිය යුතු ය.

7. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත. තවද සිංහල, ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍යයෙන් පළ වන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**රවීන්ද්‍ර පත්මප්‍රිය,**
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2026 ජූලි මස 14 වැනි දින,
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,
ඕල්කට් මාවත,
තැ.පෙ. 355,
කොළඹ 10.

**ආදර්ශ අයදුම්පත**

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

***ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ නවාතැන් බංගලා සහයක තනතුර සඳහා***
***බඳවා ගැනීම - 2026***

1. සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යය (සිංහල/ දෙමළ): ..........................................................................................

2. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):..........................................................................................
..........................................................................................

3. මුලකුරු සමඟ නම (සිංහලෙන්/ දෙමළෙන්):..........................................................................................

4. මුලකුරුවලින් හැඳින්වෙන නම (සිංහලෙන්/ දෙමළෙන්):..........................................................................................
..........................................................................................

5. ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)(ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ):

..........................................................................................
..........................................................................................

6. දුරකථන අංකය:

 6.1 පෞද්ගලික දුරකථන අංකය (නිවස/ ජංගම):..........................................................................................

 6.2 WHATSAPP දුරකථන අංකය:..........................................................................................

 6.3 රාජකාරී දුරකථන අංකය: ..........................................................................................

7. ස්ත්‍රී/පුරුෂ භාවය: ..........................................................................................

8. ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................................

9. විවාහක/ අවිවාහක බව :..........................................................................................

10. උපන් දිනය: වර්ෂය........................... මාසය.............................දිනය................................

11. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස: අවුරුදු..................මාස....................දින............

12. අධ්‍යාපන සුදුසුකම්:

අ.පො.ස.(සා/පෙළ)(පළමුවර)

වර්ෂය : ………………….. මාධ්‍යය :.......................... විභාග අංකය : ……………………

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

අ.පො.ස.(සා/පෙළ)(දෙවනවර)

වර්ෂය : ………………….. මාධ්‍යය:......................... විභාග අංකය: ……………………

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

අ.පො.ස.(උ/පෙළ)
වර්ෂය : ………………….. මාධ්‍යය:......................... විභාග අංකය: ……………………

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

13. ක්ෂේත්‍රයට අදාළ වෘත්තීය පාඨමාලා:

| පාඨමාලාව | ආයතනය | විෂයයන් | ප්‍රතිඵල |
|---|---|---|---|
| | | | |

14. ක්ෂේත්‍රයට අදාළ සේවා පළපුරුද්ද:

| *තනතුර* | *ආයතනය* | *සේවා කාලය* | *ඉටුකළ රාජකාරි* |
|---|---|---|---|
| | | | |

15. දැනට යම්කිසි තනතුරක් දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර:

I. තනතුර හා ශ්‍රේණිය: ..............................................................................................

II. පත් වූ දිනය: ..........................................................................................................

III. ආයතනය: .............................................................................................................

16. අයදුම්කරුගේ අත්සන:

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, මෙම සම්මුඛ පරීක්ෂණය පිළිබඳ විධිවිධාන ඇතුළත් සේවා ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීම ගැන මම එකඟ වෙමි. තව ද මෙම තනතුර සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ප්‍රකාශ කරමි.

දිනය : ............................... අත්සන.............................................

17. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම:

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන.............................................................................................................................. ......................................................(සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලික හඳුනන බවත්,............................ දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

දිනය : ............................... අත්සන.............................................

නම: ......................................................
තනතුර : ..............................................
ලිපිනය : ............................................
(නිල මුද්‍රාව)

18. ආයතන ප්‍රධානියාගේ සහතිකය (රාජ්‍ය/ පළාත් රාජ්‍ය/ අර්ධ රාජ්‍ය සේවයේ නියතු අයදුම්කරුවන් සඳහා පමණි.):

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ................................................................ මයා/මිය/ මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ........................................ ලෙස සේවය කරන අතර ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ හැකිය.

දිනය : .................................. ආයතන ප්‍රධානියාගේ අත්සන...........................
නම : ..................................................
පදවි නාමය : ..........................................
දිනය : ..................................................
(නිල මුද්‍රාව)

07 - 362

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### නීති නිලධාරි (විධායක නිලධාරි ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම -2026 සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

කෘෂිකර්ම,පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ පවතින සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ නීති නිලධාරි තනතුරේ පවතින පුරප්පාඩුව පිරවීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. **බඳවා ගැනීමේ ක්‍රමය :**

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු ලබාදීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

පත්වීම ක්‍රියාත්මකවන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

02. **අවශ්‍ය සුදුසුකම් :**

(i) අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් :

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) පළපුරුද්ද :

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු නීතිඥවරයකු වශයෙන් වසර තුන (03) කට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. (සක්‍රීය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පළපුරුද්ද ලබා ගත් කාලය, සහතික කරන්නාගේ නිලමුද්‍රාව හා සහතික කළ දිනය පැහැදිලිව සඳහන් කර තිබිය යුතු ය.);

*හෝ*

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීතිමය තනතුරක* වසර තුන (03) කට නොඅඩු පහත දැක්වෙන කාර්යයන්ට අදාළ පළපුරුද්ද ලබා තිබීම. (ලේකම්/ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානි විසින් නිකුත් කළ ලිපියකින් සනාථ කර තිබිය යුතු ය.)

- නඩු සම්බන්ධයෙන් නීති කටයුතු හා නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- ගිවිසුම් හා සම්බන්ධ නෛතික කටයුතු
- අදාළ අණපනත් සම්බන්ධ නෛතික කටයුතු
- පනත් කෙටුම්පත්, චක්‍රලේඛ, රෙගුලාසි වැනි නීත්‍යානුකූල ලියවිලි සම්පාදන කටයුතු
- විවිධ ව්‍යවස්ථාපිත ආයතනවලින් පවත්වනු ලබන නීති හෝ අධිකරණ කටයුතු හෝ පරීක්ෂණ කටයුතු

*සටහන:* මූලික සුදුසුකම සනාථ කෙරෙන ලේඛනවල අයදුම්කරු විසින්ම සහතික කළ පිටපත් අයදුම්පත්‍රයට අමුණා තිබිය යුතු ය. **සේවා කාලය ආරම්භවන හා අවසානවන දිනය පැහැදිලිව සඳහන් සහතික අමුණා නොමැති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.**

* නීතිමය තනතුරක් යනු නීති උපාධිය හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දී තිබීම බඳවා ගැනීමේ මූලික සුදුසුකමක්වන තනතුරු ය.

(iii) කායික යෝග්‍යතාවය :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු අතර, මනා ශරීර සෞඛ්‍ය තත්ත්වය වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මගින් සනාථ කළ යුතු ය.

(iv) වෙනත් සුදුසුකම් :

- ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.
- අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.(ඒ බව අයදුම්කරු පදිංචි වසමේ ග්‍රාම නිලධාරි වෙතින් මාස 06 ක් තුළ ලබාගත් DS 04 සහතිකයකින් හා තවත් චරිත සහතිකයකින් සනාථ කළ යුතු ය.)
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

03. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය. තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් ආකාරයට පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii) 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ හා උපදෙස්වලට ද ඒවාට අදාළව වරින් වර නිකුත් කරනු ලබන සංශෝධනවලට ද ඔබ යටත් විය යුතු වේ.

(v) අයදුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍ය වනුයේ, ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය වේ.

**04.** **වයස් සීමාව:**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.(උප්පැන්න සහතිකයේ මුල් පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.)

**05.** **වැටුප් පරිමාණය:**

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන 11 අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 82,150 - 10 x 2,400 – 8 x 2,940 – 17 x 3,900 – රු.195,970 (SL-1-2025) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන 111 හි සඳහන් පරිදි වේ.

**06.** **යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.**

| *අනු. අංකය* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| **01** | **අතිරේක අධ්‍යාපන සුදුසුකම් :** | | **25** |
| | (*අ*) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 A වගන්තිය යටතේ පිළිගත් නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය | 25 | |
| | (*ආ*) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 A වගන්තිය යටතේ පිළිගත් නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ උසස් නීති අධ්‍යාපන ආයතනයෙන් ලබාගත් පශ්චාත් නීති ඩිප්ලෝමාවක් | 20 | |

<table>
<tr><th>අනු. අංකය</th><th>විෂයය</th><th>ලකුණු</th><th>උපරිම ලකුණු</th></tr>
<tr><td></td><td>(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 A වගන්තිය යටතේ පිළිගත්,<br><br>• පළමු පන්තියේ සාමාර්ථය සහිත නීතිවේදි උපාධිය<br>• දෙවන පන්තියේ ඉහළ සාමාර්ථය සහිත නීතිවේදි උපාධිය<br>• පන්ති සාමාර්ථයක් සහිත නීතිවේදි උපාධිය<br>• සාමාන්‍ය සාමාර්ථයක් සහිත නීතිවේදි උපාධිය<br><br>(ඈ) නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථය<br>නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථය<br><br>සටහන I: නීති විද්‍යාලයේ අවසන් විභාගය ගෞරව සාමාර්ථයක් සහිතව සමත් වී ඇත්නම් පමණක් ඉහත ලකුණු 05 ලබා දෙනු ලැබේ.<br>සටහන II: ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.</td><td><br><br><br><br><br>15<br>10<br>07<br>05<br><br>10<br>05</td><td></td></tr>
<tr><td>02</td><td>අතිරේක පළපුරුද්ද :<br><br>නඩු වලට අදාළ ලේඛන සකස් කිරීම සහ විවෘත අධිකරණයේ කරුණු දැක්වීම.<br><br>
<table>
<tr><th></th><th>නඩු ගොනු කිරීම් (එක් නඩුවක් සඳහා)</th><th>අධිකරණය ඉදිරියේ පෙනී සිට කරුණු දැක්වීම් සඳහා ලකුණු (එක් නඩුවක් සඳහා)</th></tr>
<tr><td>ශ්‍රේෂ්ඨාධිකරණය</td><td>2</td><td>5</td></tr>
<tr><td>අභියාචනාධිකරණය</td><td>2</td><td>4</td></tr>
<tr><td>මහාධිකරණය</td><td>2</td><td>3</td></tr>
<tr><td>දිස්ත්‍රික් උසාවි</td><td>4</td><td>5</td></tr>
<tr><td>විනිශ්චයාධිකාර</td><td>2</td><td>3</td></tr>
</table>
<br>සටහන -<br>ඉහත සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ නඩු තීන්දුවල පිටපත් හෝ අවසන් වරට නඩුව පැවති දිනයේ නඩු වාර්තාවේ සහතික පිටපතක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය.</td><td></td><td>35</td></tr>
<tr><td>03</td><td>තොරතුරු තාක්ෂණය/ තොරතුරු තාක්ෂණ නීතිය පිළිබඳ දැනුම :<br><br>(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක්** ලෙස හදාරා තිබීම.<br><br>(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබා ගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීතිය පිළිබඳ ඩිප්ලෝමාවක්.</td><td><br><br>10<br><br><br><br>08</td><td>10</td></tr>
</table>

| *අනු. අංකය* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| | (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ සුදුසුකමක් හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබා ගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ NVQ 5 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක්. | 05 | |
| | (ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීති ක්ෂේත්‍රයේ පාඨමාලා හදාරා/ පුහුණු වැඩසටහන්වලට සහභාගී වී ලබා ගත් සහතික පත්‍ර.(එක් සහතිකයකට ලකුණු 02 බැගින් උපරිම සහතික දෙකකට ලකුණු ලබා දෙනු ලැබේ.)<br><br>***සටහන :*** ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | 04 | |
| **04** | **භාෂා හැකියාව** | | **15** |
| | (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක්** ලෙස ඇතුළත් ව ලබාගත් උපාධිය | 15 | |
| | (ආ) පිළිගත් අන්තර්ජාතික හෝ ජාතික මට්ටමේ ආදර්ශ අධිකරණ තරඟවල දී (Moot court competitions) දක්වා ඇති ඉංග්‍රීසි භාෂාවේ ව්‍යක්ත බව<br><br><u>කේවල</u><br>i. ප්‍රථම ස්ථානය/හොඳම කුසලතාව -12<br>ii. දෙවන ස්ථානය -10<br>iii. තෙවන ස්ථානය/වෙනත් කුසලතා - 08<br><br><u>කණ්ඩායම්</u><br>i. ප්‍රථම ස්ථානය/හොඳම කුසලතාව -10<br>ii. දෙවන ස්ථානය -08<br>iii. තෙවන ස්ථානය/වෙනත් කුසලතා -06 | 12 | |
| | (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් ඩිප්ලෝමාවක් හෝ වෙනත් රජය පිළිගත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF 3 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක් හෝ රජයේ පුහුණු ආයතනයකින්/ රජයේ පුහුණු ආයතනයකට අනුබද්ධ ආයතනයකින් අවම වශයෙන් අධ්‍යයන පැය 1500 ක පාඨමාලාවක් හදාරා ලබා ගත් ඉංග්‍රීසි භාෂාව සඳහා වූ ඩිප්ලෝමාවක්. | 10 | |
| | (ඈ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී හෝ Edexcel හෝ Cambridge උසස් පෙළ විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අධි සාමාර්ථයක් ලබා තිබීම හෝ අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර 02 ක් ඇතුලත IELTS සමස්ත ලකුණු 6.5 (සෑම විෂයකටම අවම ලකුණු 06ක් සහිතව) හෝ ඊට ඉහළ, TOEFL-IBT 79 හෝ ඊට ඉහළ, TOEFL-CBT 213 හෝ ඊට ඉහළ හෝ TOEFL-PBT 550 හෝ ඊට ඉහළ ලබා තිබීම. | 08 | |
| | (ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබා ගත් උසස් සහතික පත්‍රයක් හෝ වෙනත් රජය පිළිගත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF 2 මට්ටමේ සහතිකයක්<br>***සටහන :-*** ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | 05 | |

| *අනු. අංකය* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| **05** | **සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව :**<br>තනතුරෙහි භූමිකාව ඉටු කිරීමට උපස්ථම්භවන අයදුම්කරුගේ ;<br>• ශක්තීන් (Strength questions) (ලකුණු 02),<br>• අවස්ථානුකූල ව තීරණ ගැනීමේ හැකියාව (Situational questions) (ලකුණු 03) හා<br>• දක්ෂතාව (Competency questions) (ලකුණු 10)<br>ඇගයීමට ලක් කිරීම අරමුණු කර ගත් ප්‍රශ්නවලට ලබා දෙන පිළිතුරු අනුව ලකුණු පිරිනමනු ලැබේ. | | **15** |
| | එකතුව | | **100** |

*සටහන :* **සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කරනු ලබන සහතික පත්වල අදාල කාල සීමාවන් පිළිබඳව සඳහන් නොවන්නේ නම්, එවැනි සහතික පත්‍ර වලට අදාළ කාල සීමාවන් අදාළ ආයතන මඟින් ලිඛිතව තහවුරු කරවාගෙන ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ වගකීම වේ. එසේ කාලසීමාවක් සඳහන්ව නොමැති සහ කාලසීමාව තහවුරු නොකළ සහතික පත්‍ර ලකුණු ලබා දීම සඳහා සලකා බලනු නොලැබේ.**

**මෙහි ප්‍රධාන විෂයයක් ලෙස අදහස් වන්නේ,උපාධියේ මුළු විෂය ඒකක (සම්භාර) සංඛ්‍යාවෙන් තුනෙන් එකක්වත් (1/3) ආවරණය වන පරිදි හදාරන ලද විෂයයක් වේ.

**07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :**

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික පත්‍රවල මුල් පිටපත් හා අයදුම්කරු විසින්ම සත්‍ය පිටපත් බවට සහතික කරන ලද ඡායා පිටපත් ගොනු 02කින් ඉදිරිපත් කළ යුතු ය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(1) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
(2) වලංගු විදේශ ගමන් බලපත්‍රය;
(3) වලංගු රියදුරු බලපත්‍රය.

**08. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය**

(i) අයදුම්පත් **2026 .08.14** වැනි දිනට හෝ ඊට ප්‍රථම "අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ.පෙ.13, ගැටඹේ, පේරාදෙණිය" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 3.2 දක්වාත් දෙවැනි පිටුව 04 සිට 9.4 දක්වාත් තෙවැනි පිටුව 10 සිට 13 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහල වම් කෙළවරේ **"නීති නිලධාරි 111 ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතු ය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු / සාමදාන විනිශ්චයකාරවරයෙකු / දිවුරුම් කොමසාරිස්වරයකු / නීතිඥවරයකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයකු හෝ රු.82,150/- ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(vi) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

**09.** **සාවද්‍ය තොරතුරු සැපයීම :**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**10.** පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**11.** මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

**12.** මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ග තුළ කිසියම් ගැටළුකාරී තත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණය වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
කෘෂිකර්ම, පශු සම්පත් ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය.

2026 ජූලි මස 15 වැනි දින.

**ආදර්ශ අයදුම්පත**

***කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයට අයත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ නීති නිලධාරී තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම-2026***

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි )
අයදුම් කරන මාධ්‍යයට අදාළ අංකය කොටුව තුළ ලියන්න.
සිංහල -2/ දෙමළ-3/ ඉංග්‍රීසි -4 ☐
සටහන :- අයදුම්කරනු ලබන මාධ්‍ය වෙනස් කළ නොහැක.

---

**1.0.** **1.1.** සම්පූර්ණ නම :- (මයා/මිය/මෙය) : ...........................................................................................
(සිංහලෙන්/දෙමළෙන්) : ...........................................................................................

**1.2.** සම්පූර්ණ නම : ...........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

**1.3** මුලකුරු සමඟ නම (මයා/මිය/මෙය) : ...........................................................................................
(සිංහලෙන්/දෙමළෙන්) උදා:- එම්.ජී.බී.එස්.කේ.ගුණවර්ධන

**1.4** මුලකුරු සමඟ නම : ...........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

**2.0.** **2.1** ස්ථිර ලිපිනය : ...........................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

**2.2** ස්ථිර ලිපිනය : ...........................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

**2.3** තැපැල් ලිපිනය : ...........................................................................................................
(ඉංග්‍රීසියෙන්)

**3.0.** ස්ථිර පදිංචි ස්ථානය අයත් :

**3.1** පළාත් පාලන ආයතනය : ……………………

**3.2** දිස්ත්‍රික්කය : ……………………

**4.0.** **4.1.** ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක්ද යන බව : ........................

**4.2 .** ජාතිය (සිංහල/ ශ්‍රී ලංකා ද්‍රවිඩ/ ඉන්දියානු ද්‍රවිඩ/ මුස්ලිම්/ වෙනත්) : ...........................

**5.0.** **5.1.** ස්ත්‍රී / පුරුෂ භාවය: පුරුෂ 0 ස්ත්‍රී 1 ☐ (අංකය කොටුව තුළ ලියන්න)

**5.2.** විවාහක/ අවිවාහක/ වැන්දඹු යන වග : විවාහක - 1 ☐ (අංකය කොටුව තුළ ලියන්න)
අවිවාහක - 2
වැන්දඹු - 3

**5.3.** උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

**5.4** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස: අවුරුදු : ☐☐☐☐ මාස : ☐☐ දින : ☐☐

**5.5.** ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

**6.0.** දුරකථන අංකය : ස්ථාවර ☐☐☐☐☐☐☐☐☐☐

ජංගම ☐☐☐☐☐☐☐☐☐☐

**7.0.** **අධ්‍යාපන සුදුසුකම් :**

**7.1.**

| *උපාධිය* | *ආයතනය* | *දිනය* |
|---|---|---|
| .......................................... | ............................................... | ........................... |
| .......................................... | ................................................. | ........................... |

**8.0.** ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දුන් දිනය :.....................................................

**8.1.** ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම්දීමෙන් පසු වසර 03ක පළපුරුද්ද සම්පූර්ණ කරන දිනය:........................

**8.2.** රාජ්‍ය ආයතනයක නීතිමය තනතුරක වසර 03ක පළපුරුද්ද සම්පූර්ණ කරන දිනය:........................

* මූලික සුදුසුකම් සනාථ කෙරෙන පහත සඳහන් සහතික/ලේඛන අයදුම්කරු විසින්ම සත්‍ය බවට සහතික කර අයදුම්පත සමඟ අමුණා ඉදිරිපත් කළ යුතු ය.

i. නීතිවේදි උපාධි සහතිකයේ /ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දුන් සහතිකයේ ඡායා පිටපත;
ii. පළපුරුද්ද සනාථ කරන සහතිකවල ඡායා පිටපත්;
iii. උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක්;
iv. වලංගු ජාතික හැඳුනුම්පත / වලංගු විදේශ බලපත්‍රය / වලංගු රියදුරු බලපත්‍රයේ ඡායා පිටපතක්.

**9.0.** අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 06 යටතේ වූ එක් එක් සුදුසුකම් ලබා ගැනීමට අදාළ විස්තර:

**9.1.** අතිරේක අධ්‍යාපන සුදුසුකම්:..........................................................................................................

**9.2.** අතිරේක පළපුරුද්ද: ..........................................................................................................

**9.3** තොරතුරු තාක්ෂණය/තොරතුරු තාක්ෂණ නීතිය පිළිබඳ දැනුම:.........................................................

**9.4**. භාෂා හැකියාව: ..........................................................................................................

*අතිරේක සුදුසුකම් සනාථ කෙරෙන ලේඛන අයදුම්පත හා එවිය යුතු නොවන අතර එම ලේඛන සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීමට සූදානම්කර තබා ගැනීම අයදුම්කරුගේ වගකීමකි.

**10.0**. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(ඔව් නම් විස්තර කරන්න)
……………………………………………………………………………………………………………………
..…………………………………………………………………………………………………………………

**11.0. අයදුම්කරුගේ සහතිකය:**
මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්,පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට වන බව මා දන්නා බවත්, සියලු නීතිරීතිවලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

.................................................... ……………………………………........,
දිනය අයදුම්කරුගේ අත්සන.

**12.0. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ......................................................මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද ඔහු ඇය මා ඉදිරිපිට දී..................දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද, සහතික කරමි.

...............................................................
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන
සම්පූර්ණ නම :
තනතුර:
දිනය:
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

**13.0. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සඳහා පමණි.)**

ඉහත විස්තර සඳහන් ........................................................................මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවය කරන බවත්,ඔහු/ ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්,වැඩ හා පැමිණීම සතුටුදායක බවත්,ඔහුට/ඇයට විරුද්ධව කිසිඳු චෝදනාවක් නොවන බවත්,මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි. (අදාළ නොවන වචන කපා හරින්න)

................................................
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන
නම :
පදවි නාමය :
ලිපිනය :
දිනය :
(නිල මුද්‍රාව යොදන්න )

## ආරක්ෂක අමාත්‍යාංශය

යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව වෙත කෙඩෙට් නිලධාරි/නිලධාරිනි තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව වෙත කෙඩෙට් නිලධාරි/ නිලධාරිනි තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් / අයදුම්කාරිනියන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ දී පුහුණු කරවනු ලැබේ.

2. ශ්‍රී ලංකාවේ පුහුණුවීම් කාලසීමාව සාර්ථක ලෙස නිම කිරීමෙන් පසුව විසිර යනු ලබන කෙඩෙට් නිලධාරින්/ නිලධාරිනියන්හට **හමුදා අධ්‍යයන ඩිප්ලෝමාව පිරිනැමේ.** ඔවුන් දෙවන ලුතිනන් වන ආරම්භක නිලයෙන් අධිකාරිට පත්කොට යෝග්‍යතාවයන් මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අවශ්‍යතාවයන් ද අනුව යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව වෙත ඇතුළත් කරනු ලැබේ.

3. **මූලික සුදුසුකම්:**

| | | | |
|---|---|---|---|
| (අ) | **පුරවැසිභාවය** | : | **ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු යි.** |
| (ආ) | විවාහක/අවිවාහක බව | : | අවිවාහක |
| (ඇ) | වයස | : | **2026.07.30 දිනට පිරිමි වයස අවුරුදු 18ත් 26ත් අතර, කාන්තා වයස අවුරුදු 18ත් 24ත් අතර විය යුතු යි.** |
| (ඈ) | උස | : | **පිරිමි අඩි 5 යි අඟල් 6 ට (170.6 cm) නොඅඩු විය යුතු යි.** |
| | | : | **කාන්තා අඩු 5 යි අඟල් 3ට (162 cm) නොඅඩු විය යුතු යි.** |
| (ඉ) | බර | : | **පිරිමි කි.ග්‍රෑ. 50 (රාත්තල් 110) ට නොඅඩු විය යුතු යි.**<br>**කාන්තා කි.ග්‍රෑ. 45 (රාත්තල් 99) ට නොඅඩු විය යුතු යි.** |
| (ඊ) | **දෘෂ්ටි තීක්ෂණත්වය** | : | **6/6 විය යුතු ය (උපැස් සහ කාච රහිතව).** |
| (උ) | **ශරීර ස්කන්ධ දර්ශකය** | : | **පිරිමි 18.5 kg/m² – 24.9 kg/m² ත් අතර විය යුතු ය.** |
| | | : | **කාන්තා 18.5 kg/m² – 24.9 kg/m² ත් අතර විය යුතු ය.** |

4. අධ්‍යාපන සුදුසුකම්:

(අ) අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පිළිගනු ලබන අ.පො.ස. (සා.පෙළ) විභාගය හා සමානව සලකනු ලබන වෙනත් ජාත්‍යන්තර විභාගයකින් (Person, Edexcel, GCSE, CGE හෝ Cambridege) දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි විෂයය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව ගණිතය හා සිංහල / දෙමළ ඇතුළුව විෂයයන් හයක් (06) සමත් වීම.

(ආ) අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් හෝ ඒ හා සමාන සුදුසුකමක් සහිතව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පිළිගනු ලබන අ.පො.ස. (උ.පෙළ) විභාගය හා සමානව සලකනු ලබන වෙනත් ජාත්‍යන්තර විභාගයකින් (Person, Edexcel, GCSE, CGE හෝ Cambridege) එක්වරකදී විෂයයන් තුනක් (03) සමත්වීම සහ සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා 30% ක ප්‍රතිශතයක් ලබා තිබීම.

(ඇ) උසස් අධ්‍යාපන සුදුසුකම් හෝ ක්‍රීඩා තරඟවලින් ජයග්‍රහණ ලබා තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

5. වෙනත් සුදුසුකම්:

(අ) ජාත්‍යන්තර/ජාතික/පළාත්/දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩා, නායකත්ව, වෙනත් ජයග්‍රහණ සහ වෙනත් භාෂා (සිංහල හා ඉංග්‍රීසි හැර) හැසිරවීම විශේෂ සුදුසුකම් ලෙස සලකා බලනු ලැබේ.

6. පොදු කරුණු:

(අ) යම් තැනැත්තෙක් යුද්ධ හමුදාධිපතිවරයා විසින් නියම කරනු ලැබූ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම් සම්බන්ධයෙන් වූ කොන්දේසි සපුරාලන්නේ නම් පමණක් ඔහු/ඇය ස්වේච්ඡා බලසේනාවේ නිලධාරියෙකු/නිලධාරිනියක වශයෙන් අධිකාරියක් ලැබීම සඳහා සුදුස්සෙක් වන්නේ ය.

(ආ) 1956 සැප්තැම්බර් මස 25 වන දින හෝ ඊට පසු ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාවට අධිකාරිලත් සියලුම නව ප්‍රවේශක නිලධාරින්/නිලධාරිනියන් විසින් රාජ්‍ය භාෂාව සම්බන්ධයෙන් වූ නියමිත ප්‍රවීණතාවය ලබාගත යුතු අතර, 1956 අංක 33

දරන රාජ්‍ය භාෂා පනතේ නියමයන්ට සහ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා සහ අනාගතයේ දී ඉදිරිපත් කරනු ලැබිය හැකි කවර හෝ නියෝගයකට *නැතහොත්* නියමයකට අනුකූලව ක්‍රියාකළ යුතු ය.

(*ඇ*) යම් කිසි නිලධාරියෙකුගේ/නිලධාරිනියකගේ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් නැතිවී ගිය විටක දී ඔහු හෝ ඇය විසින් වහාම ඒ බව යුද්ධ හමුදාධිපතිවරයා වෙත දැනුම් දිය යුතු ය.

(*ඈ*) ස්වේච්ඡා බලසේනාවේ සේවයේ යෙදී සිටිය දී කිසිම නිලධාරියෙකු/නිලධාරිනියක ශ්‍රී ලංකා නාවික හමුදාවට හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට නොබැඳිය යුතු ය.

(*ඉ*) නිත්‍ය හමුදාවේ, නිත්‍ය උපසේවයේ, ශ්‍රී ලංකා පොලීසියේ හෝ ශ්‍රී ලංකා බන්ධනාගාර සේවයේ කිසිම සාමාජිකයෙකුට ස්වේච්ඡා හමුදාවේ සේවයට අධිකාරිය ලැබිය නොහැක.

(*ඊ*) රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන යටතේ නිත්‍ය බලසේනාවෙන් රාජ්‍ය සේවයෙන්, රාජ්‍ය සංස්ථාවකින්, රාජ්‍ය ආයතනයකින් හෝ සංස්ථාපිත මණ්ඩලයකින් විශ්‍රාම ගත් හෝ අස්කළ කිසිවෙකු ස්වේච්ඡා බලසේනා රෙජිමේන්තුවක හෝ ඒකකයක සේවයට අධිකාරිය නොලැබිය යුතු ය.

(*උ*) සාපරාධී වරදක් සම්බන්ධයෙන් වරදකරුවෙකු කරනු ලැබූ කිසිවෙකු ස්වේච්ඡා බලසේනාවේ රෙජිමේන්තුවක හෝ ඒකකයක සේවයට අධිකාරිය නොලැබිය යුතු ය.

(*ඌ*) පුහුණුවීම් ලබන කාලය තුළ දී කෙඩෙට් නිලධාරින්/ නිලධාරිනියන්හට විවාහවීමට අවසර දෙනු නොලැබේ.

(*එ*) මනා ශාරීරික සෞඛ්‍ය තත්වයේ සිටිය යුතු වේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන සියළුම අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් බඳවා ගැනීමට පෙර ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මගින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලබන අතර, ඉන් සමත් විය යුතු ය.

7. සේවා කොන්දේසි.

(*අ*) පුහුණු කාලසීමාව ඇතුළුව වසර 05 ක් අනිවාර්යයෙන්ම යුද්ධ හමුදා සේවයේ යෙදී සිටිය යුතු ය. ඒ සඳහා යුද්ධ හමුදාව සමග ඇපබැඳුම්කරයකට සහ ගිවිස්නාවකට යටත් කරනු ලැබේ.

(*ආ*) පුහුණුවීම් ලබන කාලසීමාව තුළ දී කෙඩෙට් නිලධාරියෙකු/නිලධාරිනියකගේ මාසික වැටුප රු. 109,015.08 කි. (සියලු දීමනා සහිතව) කෙඩෙට් නිලධාරියෙකු/නිලධාරිනියක් වශයෙන් සේවය කරන කාලය තුළ දී ඔවුන්හට කිසිදු වැටුප් වැඩිවීමකට හිමිකමක් නොමැත.

(*ඇ*) කෙඩෙට් නිලධාරින්/ නිලධාරිනියන්හට මාස 15 ක කාලයක් ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ දී පුහුණුවීම්වල නිරත වීමට සිදු වේ.

(*ඈ*) පුහුණුවීම් කාලය තුළ දී කෙඩෙට් නිලධාරින්/ නිලධාරිනියන්ගේ තරාතිරම සෙසුනිලයින් හා සමාන වන අතර, ඔවුන් යුද්ධ හමුදා නීතියට සහ සිවිල් නීතියට යටත් වනු ඇත.

(*ඉ*) පාඨමාලාවෙන් ඉවත්වීම/ඉවත් කිරීම.

(1) පුහුණුවීම් කාලසීමාව තුළ දී කෙඩෙට් නිලධාරියෙකු/ නිලධාරිනියක සිය කැමැත්තෙන්ම අධිකාරිය සඳහා වූ තම අපේක්ෂකත්වය අවසන් කළහොත් එතෙක් එම කෙඩෙට් නිලධාරින්/නිලධාරිනියන් වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය මගින් දරන්නට යෙදුනු සියලුම වියදම් භාරකරු හෝ ඇපකරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ආපසු ගෙවිය යුතු යි.

(2) කෙඩෙට් නිලධාරියෙකු/නිලධාරිනියක පාඨමාලාවේ නියුතුව සිටින කාලය තුළ කිනම් අවස්ථාවක හෝ විෂමාචාර හේතූන් නිසා අස්කිරීම, තම අයහපත් ආරක්ෂක නිෂ්කාශන, තමන් විසින් වළක්වාලිය හැකි හේතූන් නිසා හෝ අධිකාරිය පිරිනැමීමට නුසුදුසු යැයි නිලධාරින් විසින් වාර්තා කරනු ලැබුවහොත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින් ඔහු/ඇය වෙනුවෙන් දරන්නට යෙදුනු සියලුම වියදම් භාරකරු හෝ ඇපකරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ආපසු ගෙවිය යුතු යි.

(3) තවද ඉහත 01 හා 02 ඡේද අනුව කෙඩෙට් නිලධාරියෙකු/නිලධාරිනියක අත්සන් කරන ලද ඇප බැඳුම්කරයට අනුව ගිවිසුම් ගත කාලයට පෙර යුද්ධ හමුදාවෙන් ඉවත්වී යන්නේනම් සම්පූර්ණ ඇප බැඳුම්කර වටිනාකම ගෙවිය යුතු ය.

(4) ඉල්ලා අස්වන ලද, ඉවත් කරන ලද හෝ වෛද්‍ය හේතූන් මත නුසුදුසු යැයි පුහුණුවෙන්

ඉවත් කරන ලද කෙඩෙට් නිලධාරියෙකු/නිලධාරිනියක නැවත අවස්ථාවක යුද්ධ හමුදාව වෙත කෙඩෙට් නිලධාරියෙකු/නිලධාරිනියක වශයෙන් බැඳීමට නොහැක.

8. *වැටුප් හා දීමනා :* ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ නිලධාරින්/නිලධාරිනියන් වශයෙන් දෙවන ලුතිනන් වන ආරම්භක නිලයෙහි අධිකාරියට පත්කරනු ලැබීමේ දී, ඔවුන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාමේ නිලධාරින්/නිලධාරිනියන්ට අදාළ වන පහත දැක්වෙන වැටුප් තලයෙහි/පරිමාණයෙහි තබනු ලැබේ.

| *අ/අ* | *නිලය* | *රාජ්‍ය කළමනාකරණ චක්‍රලේඛ 5/2025 ට අනුව* | |
|---|---|---|---|
| | | *මූලික වැටුප 2026.01.01 දින සිට* | *සියලු දීමනා සහිත වැටුප* |
| 1. | කෙඩෙට් නිලධාරි/ නිලධාරිනියන් | රු. 51,244.00 | රු. 109,015.08 |
| 2. | දෙවන ලුතිනන් | රු. 60,709.00 | රු 123,718.30 |
| 3. | ලුතිනන් | රු. 74,438.00 | රු. 137,447.30 |
| 4. | කපිතන් | රු. 86,601.00 | රු. 149,610.30 |
| 5. | මේජර් | රු. 94,710.00 | රු. 158,419.30 |
| 6. | ලුතිනන් කර්නල් | රු. 97,192.00 | රු. 165,776.30 |
| 7. | කර්නල් | රු. 117,857.00 | රු. 189,566.30 |
| 8. | බ්‍රිගේඩියර් | රු: 124,446.00 | රු. 201,980.30 |
| 9. | මේජර් ජෙනරාල් | රු: 136,575.00 | රු. 214,109.30 |

9. අනෙකුත් දීමනා :

(අ) පහත සඳහන් දීමනා මූලික වැටුපට අමතරව මාසිකව ගෙවනු ලැබේ.

(1) සුදුසුකම් දීමනා.
(2) නොමිලේ ආහාර හෝ ආහාර දීමනාව.
(3) වික්ෂේපණ දීමනාව (විවාහක නිලධාරි/නිලධාරිනියන් කඳවුර ඇතුළත විසීමට නියෝග ලබා සිටින විට) විවාහක නිලධාරි/නිලධාරිනියන්හට පමණක් හිමි වේ.
(4) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව.

(ආ) පහත සඳහන් පහසුකම් සපයනු ලැබේ/ දීමනා ගෙවනු ලැබේ.

(1) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට නොමිලේ නේවාසික පහසුකම්,
(2) කුලී නිවාසයක වාසය කරන විට සීමිත ගෙවල් කුලී දීමනාව;
(3) නොමිලේ නිල ඇඳුම්;
(4) විවාහක නිලධාරි/නිලධාරිනියන්හට අනුගාමික දීමනා/අවිවාහක නිලධාරි/ නිලධාරිනියන්හට අනුගාමික සේවය;
(5) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින නිලධාරි/නිලධාරිනියන්හට රාජකාරි ස්ථානයේ සිට නිවස දක්වා මසකට වරක් රාජකාරි දුම්රිය බලපතක්.

10. මෙහි පහත 11 වැනි ඡේදයෙහි දක්වා ඇති පරිදි දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ප්‍රකාශන පත්‍රයකට අත්සන් කළයුතු වන අතර, එය අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු වේ. තෝරාගත් අපේක්ෂකයින්/අපේක්ෂිකාවන්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් එකී අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් පත් කිරීමට පෙර ප්‍රකාශන පත්‍රයෙහි අඩංගු කරුණුවලට අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයත් සමඟ ඇප බැඳුම්කරයකට අත්සන් කළ යුතු ය. විශේෂ අවස්ථාවලදී හැර පියා ජීවතුන් අතර සිටින කෙඩෙට් නිලධාරියෙකුගේ/නිලධාරිනියකගේ භාරකරු පියා විය යුතු අතර, ඔහු නොමැති නම් පමණක් මවට හෝ භාරකරුහට භාරකාරිත්වය හිමිවනු ලැබේ.

11. අයදුම්කරුවන්ගේ/කාරිනියන්ගේ මව, පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාමේ කෙඩෙට් නිලධාරි/නිලධාරිනි ඉල්ලුම්කරුගේ .........ගේ පියා/මව/භාරකරු මම වෙමි.

(ආ) ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයක දී පුහුණුවීමේ පාඨමාලාවක් හැදෑරීම සඳහා ඉහත නම සඳහන් අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් තෝරාගනු ලැබුවහොත් මෙහි පහත සඳහන් කරුණු සම්බන්ධ වගකීම මම භාර ගනිමි.

(1) පුහුණුවීමේ කාලසීමාව තුළදී අයදුම්කරුවන්/අයදුම්කාරිනියන්ට දරන්නට වන සියලුම පෞද්ගලික වියදම් දැරීමට.

(2) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කරු/ අයදුම්කාරිනියන් සිය කැමැත්තෙන්ම අධිකාරය සඳහා වූ තම අපේක්ෂකත්වය අවසන් කළහොත්, ඔහු/ඇය වෙනුවෙන් රජයට දැරීමට සිදුවූ සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමට.

(3) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කරු/ අයදුම්කාරිය කිනම් අවස්ථාවක වුවත් (විෂමාචාරය හෝ ඔහුට/ඇයට තමන් විසින්ම වළක්වාලිය හැකි හේතූන් මත) අධිකාරිය ලැබීමට නුසුදුසු යැයි බලධාරින් විසින් වාර්ථා කරනු ලැබුවහොත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින් ඔහු/ඇය වෙනුවෙන් දරන්නට වූ වැයකිරීම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ආපසු ගෙවීමට.

(4) තවද අයදුම්කරු/අයදුම්කාරිය අත්සන් කරන ලද ඇප බැඳුම්කරයට අනුව ඡේද අංක 2 සහ 3 යටතේ සඳහන් හේතූන් මත ගිවිසුම් ගත කාලයට පෙර යුද්ධ හමුදාවෙන් ඉවත්වී යන්නේනම් සම්පූර්ණ ඇප බැඳුම්කර වටිනාකම ගෙවිය යුතු ය.

* නොගැළපෙන වචන කපා හරින්න.

.........................................,
මව/පියා/භාරකරුගේ අත්සන.

නම සහ ලිපිනය පැහැදිලි අකුරෙන්:..........................................................................................................

දිනය :...................................
.....................................,
සාක්ෂිකරුගේ අත්සන :

නම සහ ලිපිනය පැහැදිලි අකුරෙන් :.......................................................................................................

12. *භාෂා අවශ්‍යතා :* ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහා විශේෂයෙන්ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනත හා සංශෝධන ප්‍රකාරව විධිවිධාන ක්‍රියාවේ යෙදවීම සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මතු පනවනු ලබන ව්‍යවස්ථාවලටද අනුකූලව තෝරාගත් අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ක්‍රියා කළ යුතු වේ.

13. අනන්‍යතාව තහවුරු කිරීම.

(අ) අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් විසින් ඔවුන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත සහ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන 'රියදුරු බලපත්‍රය' පිළිගනු ලැබේ.

(ආ) රාජ්‍ය සේවයේ දෙපාර්තමේන්තු, සංස්ථා, සිවිල් ආයතන සහ පුද්ගලික ආයතනයන්හි රාජකාරියේ නියුතු අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් බඳවා ගැනීමට තෝරා ගතහොත් පූර්ණ කාලීනව යුද්ධ හමුදා සේවයට නිදහස් කළ හැකි බවට අදාළ ආයතන ප්‍රධානියා (දෙපාර්තමේන්තු, සංස්ථා, සිවිල් ආයතන) විසින් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

14. *ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරන ආකාරය .-* ඉල්ලුම් පත්‍රය පහත දැක්වෙන ආකෘතියට අනුව ඉල්ලුම්කරුගේම අත් අකුරින් ලියා 2026 ජූලි මස 30 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ 'බඳවා ගැනීමේ නිලධාරි ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානය, යුද්ධ හමුදා කඳවුර, සීතාවක, කොස්ගම' යන ලිපිනයට එවිය යුතු වේ. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා කෙඩෙට් නිලධාරි/නිලධාරිනි තනතුර සඳහා' ඉල්ලුම් පත්‍රය යනුවෙන් සඳහන් කළ යුතු වේ. ඉල්ලුම් පත්‍ර භාරගනු ලබන අවසාන දිනයට හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ දැක්වෙන අවශ්‍යතාවන්ට අනුකූල නොවන

ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ. මෙම මුලස්ථානය මගින් ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීමක්ද සිදුකරනු නොලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර සහ අයදුම්පත www.army.lk හෝ slavf.join us අඩවියෙන් ලබා ගත හැක.

15. ඉල්ලුම් පත්‍ර සමඟ පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් එවිය යුතු ය:

(අ) උප්පැන්න සහතිකය;
(ආ) ඉදිරිපත් කර ඇති අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීමේ සහතික; (අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත්කර ඇති අ.පො.ස. (සා/පෙළ) හා අ.පො.ස. (උ/පෙළ) සහතිකයන් විය යුතු යි)
(ඇ) පාසල් හැරයාමේ සහතිකය;
(ඈ) ග්‍රාම නිලධාරි සහතිකය;
(ඉ) පොලිස් නිෂ්කාශන සහතිකය;
(ඊ) ක්‍රීඩා හා විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ සහතික;
(උ) අයදුම්කරු/අයදුම්කාරිනිය හඳුනනු ලබන චරිත සහතිකයක් නිකුත් කිරීමට සුදුසුකම් සහිත පුද්ගලයන් දෙදෙනෙකු වෙතින් මෑතකදී ලබා ගන්නා ලද චරිත සහතික දෙකක් හා අයදුම්කරු/අයදුම්කාරිනිය අවසානවරට ඉගෙනීම ලැබූ පාසලේ විදුහල්පතිගෙන් ලබා ගන්නා ලද චරිත සහතිකයක් තිබිය යුතු වේ;
(ඌ) අදාළ වෙනත්/උසස් අධ්‍යාපන සහතික;
(එ) තවද, ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් ද මෑතක දී ලබාගත් 2″x2 1/2″ ප්‍රමාණයේ ඡායාරූපයක් ග්‍රාම නිලධාරි හෝ සාමදාන විනිශ්චයකරුවෙකු විසින් සහතික කර එවිය යුතු ය.

**16. සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.**

(අ) ඉහත සඳහන් අවශ්‍යතාවන් සපුරාලන ලද තෝරාගත් අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් යුද්ධ හමුදාධිපති විසින් නියම කරනු ලබන පරීක්ෂණවලට පෙනී සිට සමත් වීමෙන් පසු ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් අවසාන තෝරා ගැනීම සිදු කරනු ලබයි.

(ආ) තේරීම් මණ්ඩලය මගින් සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන්හට සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය විද්‍යුත් ලිපිනයට දැනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මුලස්ථානය, යුද්ධ හමුදා කඳවුර, සීතාවක, කොස්ගම දී පවත්වනු ලබන අතර, මේ සම්බන්ධයෙන් දරනු ලබන ගමන් වියදම් හෝ වෙනත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා ජනරජය මගින් ගෙවනු නොලැබේ.

(ඇ) අයදුම්කරුවෙකු/ අයදුම්කාරිනියක නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුව ද එසේ කළ යුත්තේ ඔහුට/ඇයට සහතිකයක් දීමෙනි. අයදුම්කරුවෙකු/ අයදුම්කාරිනියක තෝරා ගැනීම සඳහා කවරාකාරයකින් හෝ පෙළඹවීම *නැතහොත්* බලපෑම් කිරීමට උත්සහ දැරීම අපේක්ෂකයා/අපේක්ෂිකාව නුසුදුස්සෙකු ලෙසට පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කරනු ඇත.

(ඈ) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවෙකු/අයදුම්කාරිනියක වෙත ඒ බව දන්වනු නොලැබේ. එවැනි අයදුම්කරුවන්ගෙන්/අයදුම්කාරිනියන්ගෙන් ඒ පිළිබඳ කරුණු සැලකිරීම භාරගනු නොලැබේ.

*සටහන:* මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පළ වේ. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

ඩබ් කේ ජී එච් එල් රොද්‍රිගෝ ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී අයිජී
ලුතිනන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති,

2026 ජූලි මස දින,
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මුලස්ථානය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
අකුරේගොඩ පාර,
බත්තරමුල්ල.

07 - 381

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර සඳහා අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2026

01. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් හෝ ආයතනයක් මගින් උපාධිය ලබා ඇති පහත සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. තනතුරට අදාළ අධ්‍යාපන හා වෙනත් විශේෂ සුදුසුකම් :-

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව, යන විෂයන් අතුරින් විෂයන් දෙකක් එකවර සමත්වීම.

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ වෙනත් උපාධිය ප්‍රදානය කිරීමේ ආයතනයක් මගින් ප්‍රදානය කරන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අවම ශාස්ත්‍රීය අගය 120කින් යුතු විද්‍යාවේදී (වෛද්‍ය රසායනාගාර විද්‍යා) (BSc in Medical Laboratory Science) විශේෂ උපාධිය ලබා තිබීම.

(ඇ) වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ වෘත්තිකයෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

03. අනෙකුත් පොදු සුදුසුකම් :-

(අ) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.
(ආ) තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.
(ඇ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
(ඈ) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(ඉ) 2026/08/07 දිනට වයස අවුරුදු 18ට නොඅඩු, වයස අවුරුදු 35ට නොවැඩි විය යුතු යි.
(ඊ) අදාළ උපාධිය බලපැවැත්වෙන දිනය අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර දිනයක් විය යුතු යි.
(උ) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට සඳහන් කරනු ලබන දිනට සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය. එමෙන්ම, අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල පිටපත් අයදුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය.

04. අයදුම් කළ යුතු ක්‍රමය : -

(අ) මේ සමග ඇති ආදර්ශ අයදුම්පතේ ආකෘතිය අනුව ස්වකීය අයදුම්පත සකස් කළ යුතු අතර ඒ සඳහා A4 ප්‍රමාණයේ කඩදාසි භාවිත කළ යුතු ය. (අංක 1 සිට 8 දක්වා පළමු පිටුවේ ද, 09 සිට 13 දක්වා දෙවන පිටුවේ ද, 14 සිට 15 දක්වා තුන්වන පිටුවේ ද) වන සේ අයදුම්පත සකස් කරගත යුතු ය.

(ආ) අයදුම්පතේ "ලදුපත" ස්ථානයේ, ලංකා බැංකුව, තැප්‍රොබේන් ශාඛාවේ අංක 7041318 දරන "සෞඛ්‍ය ලේකම් විභාග ගාස්තු රැස්කිරීම" යන ගිණුමට රු.1,000.00 බැරකර එම ලදුපත නොගැලවෙන සේ ඇලවිය යුතු ය. (ලදුපත ඇලවීමට පෙර එහි පිටපතක් තබා ගන්න)

(ඇ) අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු හෝ සාමදාන විනිශ්චකාරවරයෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු හෝ නීතිඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ *ගැසට්* කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු.854,880/-ට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කළ යුතු ය.

(ඈ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 9 x 4 ප්‍රමාණයේ ලියුම් කවරයක බහා එම කවරයේ ඉහළ කෙළවරේ **"වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුරේ අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2026"** වශයෙන් හා අදාළ උපාධිය හා අධ්‍යයන වර්ෂය ද සඳහන් කර **2026.08.07 දිනට පෙර අධ්‍යක්ෂ (පාලන) 02, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, අංක 106, ඩබ්ලි සේනානායක මාවත, කොළඹ 08** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

05. රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගේ අයදුම්පත්, ඔවුන්ගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් එවිය යුතු ය.

06. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලබන අතර නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු

ලැබේ. මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට හා අදාළ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. පුහුණු පාඨමාලාවට අදාළව ඉහතින් දක්වා ඇති උපාධිධාරීන්ගේ උපාධිය බලපවත්වන දිනය (Effective Date) හා උපාධියේ ශ්‍රේණියේ සාමාන්‍ය අගය (GPA) පදනම් කරගෙන කුසලතා ලේඛනය සකස් කර පුහුණු පාඨමාලාවට සුදුස්සන් තෝරාගනු ලැබේ. මෙම උපාධිධාරීන් බඳවා ගැනීමට අදාළව මීට පෙර නිකුත් කර ඇති *ගැසට්* නිවේදනයේ අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසන් දිනය වූ 2024/07/05 දිනට පසුව උපාධිය ලබා ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

08. පත්වීම් ලබාදීමට අනුමැතිය ලබා දී ඇති පුරප්පාඩු සංඛ්‍යාවට වඩා උපාධිධාරීන් අයදුම් කර තිබේ නම් අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාවට බඳවා ගැනීම සඳහා සාමාන්‍ය දැනීම හා අභියෝග්‍යතාව පිළිබඳ පැය 01 ක ප්‍රශ්න පත්‍රයකින් යුත් ලිඛිත විභාගයක් පවත්වා එම විභාගයේ දී දක්වන කුසලතාවය අනුව වෙන් කළ හැකි පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් පුහුණුවට බඳවා ගැනීම සිදු කෙරේ.

09. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් / අයදුම්කාරියන් විසින් පහත සඳහන් ලියවිලි වල මුල් පිටපත් හා එහි සහතික කරන ලද පිටපත බැගින් ඉදිරිපත් කළ යුතු ය :

I. උප්පැන්න සහතිකය
II. උපාධි සහතිකයේ මුල් පිටපත (මෙහි සහතික කළ පිටපතක් අයදුම්පත සමඟ ද අමුණා එවිය යුතු ය.)
III. විස්තරාත්මක උපාධි සහතිකයේ (Transcript) මුල් පිටපත
IV. අ.පො.ස (උ.පෙළ) විභාග ප්‍රතිඵල දැක්වෙන සහතිකයේ මුල් පිටපත.
V. ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය.
VI. වෛද්‍ය සභාවේ ලියාපදිංචිය (SLMC) සනාථ කිරීමේ සහතිකය

10. පුහුණු කිරීමේ පරිපාටිය :-

I. සම්මුඛ පරීක්ෂණයට ලක් කරන ලද අයදුම්කරුවන් අතරින් තෝරාගත් අයදුම්කරුවන් / අයදුම්කාරියන් අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරීමට මාස 06 කාලයක් සඳහා රෝහල් හා වෙනත් ආයතන වෙත අනුයුක්ත කරනු ලැබේ.

II. අභ්‍යාසලාභීන් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මඟින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත.

III. පුහුණුව ලබන කාලපරිච්ඡේදය අවසානයේ දී පුහුණුව සාර්ථකව නිම නොකරන, වැඩ හා හැසිරීම සතුටුදායක නොවන හෝ තමන් අනුයුක්ත කරනු ලබන ආයතනයේ පවතින කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව, ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැකිය.

IV. පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ දී අභ්‍යාසලාභීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 විධිවිධාන අනුව දීමනා ගෙවනු ලැබේ.

V. පුහුණුවට ඇතුළත් කරනු ලබන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණයෙන්ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම් ලදහොත් අවම වශයෙන් වර්ෂ පහක (05) කාල පරිච්ඡේදයක් අදාළ තනතුරේ සේවය කරන බවටත්, සෞඛ්‍ය ලේකම් සමඟ ගිවිසුමකට හා ඇපකරයකට එළඹිය යුතුය. පුහුණු කාලසීමාව තුළ දී පුහුණුව හැරගියහොත්, පුහුණුවෙන් පසු පත්වීම භාර නොගතහොත්, ඉහත III වගන්තියේ සඳහන් ආකාරයට පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් හෝ පත්වීම් ලැබ වර්ෂ (05) කාල පරිච්ඡේදයක් අදාළ තනතුරේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් යන ඕනෑම හේතුවක දී පුහුණු කාලය තුළදී ඔහුට / ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන වියහියදම් ගිවිසුමට හා ඇපකරයට අදාළ මුදල ඔහු / ඇය විසින් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත ගෙවිය යුතුය. එසේ නොමැති වුවහොත් එම මුදල් අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

11. සේවයේ නියුක්ත කරවීමේ නියමයන් :-

පුහුණුව අවසානයේ අදාළ තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීම සිදුකරන / නොකරන බව තීරණය කරනු ලබන්නේ එම අවස්ථාවේ පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පදනම්වය. ඒ අනුව අදාළ තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය තීරණය කළහොත් අපේක්ෂක/ අපේක්ෂිකාවන් තමන් පුහුණුවට බඳවාගත් පාඨමාලාවට අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ කොන්දේසි හා පුරප්පාඩු මත අදාළ තනතුරේ III වන පන්තියේ තනතුරට පත් කිරීමට කටයුතු කෙරේ. පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව MT-6-2025 හි පරිදි රු. 54,120 -10x800-11x1190-10x1320-10x1350 - රු. 101,910/- යන වැටුප් පරිමාණය හිමිවන අතර ගෙවීම් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි විධිවිධාන අනුව සිදු කරනු ලැබේ.

12. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතු ය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම ලැබීමෙන් පසු ඉහත සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/ තනතුරින් පහකර ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. තවද පුහුණු කාලය තුළ දී ඔහුට/ ඇයට ගෙවන දීමනාව, රජය විසින් දරන වියහියදම්හි ගිවිසුමට හා ඇපකරයට අදාළ මුදල ඔහුගෙන්/ඇයගෙන් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

13. තෝරාගත් අයදුම්කරුවන් අදාළ පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවීමේ පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේදී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

14. ඉහත පරිදි බඳවා ගන්නා ලද සියලුම දෙනා රජයේ නිලධාරින්ට අදාළවන සියලුම නීතිරීති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් රෙගුලාසි හා වෙනත් රෙගුලාසිවලට ද රජය විසින් වරින්වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ට ද යටත්වනු ඇත.

15. පුහුණුවට බඳවා ගනු ලබන අයදුම්කරුවන් සඳහා නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටියි. ලබාදෙන්නේ නම්, ඒ සඳහා තක්සේරු නිවාස කාමර කුලිය, ජල හා විදුලි බිල්පත් අය කරනු ලැබේ.

16. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම ගැසට් නිවේදනය මගින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටලු සහගත තත්වයක් උදා වුවහොත් ඒ පිළිබඳව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

**විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ,**
ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2026 ජූලි මස 20 දින,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

**ආදර්ශ අයදුම්පත**

***වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුරේ අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2026***

(අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර ගැසට් නිවේදනය හොඳින් කියවා බලන්න.)

1. (අ) මුලකුරු සමග අගට යෙදෙන නම :- ..........................................................................................

(ඉංග්‍රීසියෙන් කැපිටල් අකුරෙන්) උදා. A.B.C.SILVA

(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ..............................................................................

(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :- .......................................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය :- ........................................................................... (පිටපතක් අමුණන්න.)

3. තැපැල් ලිපිනය :- සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්

| | | |
|---|---|---|
| | ...................................... | ...................................... |
| | ...................................... | ...................................... |
| | ...................................... | ...................................... |
| | ...................................... | ...................................... |

4. (අ) ස්ථිර ලිපිනය :- සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්

...................................... ......................................

...................................... ......................................

...................................... ......................................

...................................... ......................................

(ආ) දුරකථන අංකය : ජංගම [ ]

ස්ථිර [ ]

(ඇ) පදිංචි දිස්ත්‍රික්කය :- සිංහලෙන්/දෙමළෙන් ....................... ඉංග්‍රීසියෙන් .................................

(ඈ) ඔබ මෙම දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවෙක්ද? ඔව්/නැත :- ..................................................

(ඉ) ඔව් නම් කොපමණ කලක පටන්ද? :- ...........................................................................

5. උපන් දිනය :- වර්ෂය ........................... මාසය ........................... දිනය ........................................

2026.08.07. දිනට වයස අවුරුදු ........................ මාස ......................... දින ...............................

6. ස්ත්‍රී/පුරුෂ භාවය :- ස්ත්‍රී [ ] පුරුෂ [ ] (අදාළ කොටුවේ √ ලකුණ යොදන්න.)

7. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග :- ඔව් [ ] නැත [ ] (අදාළ කොටුවේ √ ලකුණ යොදන්න.)

8. විවාහක/අවිවාහක බව :- විවාහක [ ] අවිවාහක [ ] (අදාළ කොටුවේ √ ලකුණ යොදන්න.)

9. අධ්‍යාපන සුදුසුකම් :-

| *අනු. අංකය* | *සමත් වූ උපාධිය* | *සාමාර්ථය* | *ශ්‍රේණියේ සාමාන්‍ය අගය (GPA)හා උපාධිය බල පවත්වන දිනය* | *විශ්වවිද්‍යාලය* | *අධ්‍යයන වර්ෂය* |
|---|---|---|---|---|---|
| | | | | | |

10. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ (SLMC) ලියාපදිංචි අංකය හා දිනය :-....................................................

11.ලිඛිත විභාගයක් පැවැත්වුවහොත් පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍ය :-................................

12. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේද? ඔව් [ ] නැත [ ]

(අදාළ කොටුවේ √ ලකුණ යොදන්න.)

"ඔව්" නම් විස්තර සපයන්න :- ...................................................................................................

13. **අයදුම්කරුගේ සහතිකය :-**

(අ) මා විසින් ගැසට් නිවේදනය හොඳින් කියවා බලා අවබෝධ කරගෙන එහි සඳහන් සියලු කොන්දේසිවලට යටත්ව මෙම අයදුම්පත සම්පූර්ණ කල බවත්, මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශකර සිටිමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය හෝ අයදුම්පතෙහි සඳහන් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් බව ද මම දැන සිටිමි.

| |
|---|
| ලංකා බැංකු තැප්‍රොබේන් ශාඛාවේ, අංක 7041318 දරන සෞඛ්‍ය ලේකම් විභාග ගාස්තු රැස්කිරීම යන ගිණුමට අදාල මුදල් ගෙවා එම ලදුපතෙහි මුල් පිටපත මෙම ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. |

………..............................                ................................................

දිනය                අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන

14. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :-**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .............................. මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලික දන්නා හඳුනන බවද, ඔහු/ඇය ............................... දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

........................................                ................................................,

දිනය                සහතික කරන්නාගේ අත්සන

සහතික කරන්නාගේ නිල මුද්‍රාව.

සහතික කරන නිලධරයාගේ සම්පූර්ණ නම :- ......................................................................................

තනතුර :- ...........................................................................................................................

ලිපිනය :- ...........................................................................................................................

15. **ඉල්ලුම් කරන අපේක්ෂකයා රාජ්‍ය සේවාවේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙක් නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අදාල නොවන වචන කපා හරින්න.)**

i. ඉහත අයදුම්කරු/අයදුම්කාරිය වන ......................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ ........ ......................................... තනතුර දරන බව මින් සහතික කරමි.

ii. ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු සත්‍ය තොරතුරු බව සහතික කරන අතර, මොහු/මැය තනතුර සඳහා තෝරා ගත හොත් ඔහු/ඇය දරන තනතුරට නිදහස් කළ හැකි/නොහැකි බව දන්වමි.

iii. එමෙන්ම මෙම බඳවා ගැනීම බාහිර බඳවා ගැනීමක් බවත්, ඔහු/ඇය අදාළ පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් හෝ නොකිරීමෙන් පසු කිසිඳු අයුරකින් දැනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත්, ඔහුට/ඇයට අවබෝධ කරදුන් බවත් දන්වා සිටිමි.

...............................................                ..............................................,

දිනය                දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම :- ..........................................................................................

තනතුර :-............................................................................................................................

ලිපිනය :- ...........................................................................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිල මුද්‍රාව.

07 - 433

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ භෞත චිකිත්සක තනතුර සඳහා අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2026

01. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ භෞත චිකිත්සක අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් හෝ ආයතනයක් මඟින් උපාධිය ලබා ඇති පහත සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. තනතුරට අදාළ අධ්‍යාපන හා වෙනත් විශේෂ සුදුසුකම් :-

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, රසායනික විද්‍යාව, කෘෂි විද්‍යාව, යන විෂයයන් අතුරින් විෂයන් දෙකක් එකවර සමත්වීම.

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ වෙනත් උපාධිය ප්‍රදානය කිරීමේ ආයතනයක් මගින් ප්‍රදානය කරන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අවම ශාස්ත්‍රීය අගය 120කින් යුතු භෞත චිකිත්සකවේදී (Bachelor in Physiotherapy)/ විද්‍යාවේදී (භෞත චිකිත්සක) (BSc in Physiotherapy) විශේෂ උපාධිය ලබා තිබීම.

(ඇ) භෞත චිකිත්සකයකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතු යි.

03. අනෙකුත් පොදු සුදුසුකම් :-

(අ) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

(ආ) තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(ඇ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

(ඈ) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

(ඉ) 2026/08/07 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු, වයස අවුරුදු 35ට නොවැඩි විය යුතුයි.

(ඊ) අදාළ උපාධිය බලපැවැත්වෙන දිනය අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර දිනයක් විය යුතු යි.

(උ) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට සඳහන් කරනු ලබන දිනට සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය. එමෙන්ම, අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල පිටපත් අයදුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය.

04. අයදුම් කළ යුතු ක්‍රමය : -

(අ) මේ සමග ඇති ආදර්ශ අයදුම්පතේ ආකෘතිය අනුව ස්වකීය අයදුම්පත සකස් කළ යුතු අතර ඒ සඳහා A4 ප්‍රමාණයේ කඩදාසි භාවිත කළ යුතු ය. (අංක 1 සිට 8 දක්වා පළමු පිටුවේද, 09 සිට 13 දක්වා දෙවන පිටුවේද, 14 සිට 15 දක්වා තුන්වන පිටුවේ ද) වන සේ අයදුම්පත සකස් කරගත යුතු ය.

(ආ) අයදුම්පතේ "ලදුපත" ස්ථානයේ, ලංකා බැංකුව, තැපොරොබේන් ශාඛාවේ අංක 7041318 දරන "සෞඛ්‍ය ලේකම් විභාග ගාස්තු රැස්කිරීම" යන ගිණුමට රු.1,000.00 බැරකර එම ලදුපත නොගැලවෙන සේ ඇලවිය යුතු ය. (ලදුපත ඇලවීමට පෙර එහි පිටපතක් තබා ගන්න)

(ඇ) අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු හෝ සාමදාන විනිශ්චකාරවරයෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු හෝ නීතිඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ *ගැසට්* කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු.854,880/- ට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කළ යුතු ය.

(ඈ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 9 x 4 ප්‍රමාණයේ ලියුම් කවරයක බහා එම කවරයේ ඉහළ කෙළවරේ **"වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ භෞත චිකිත්සක තනතුරේ අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2026"** වශයෙන් හා අදාළ උපාධිය හා අධ්‍යයන වර්ෂය ද සඳහන් කර **2026.08.07 දිනට පෙර අධ්‍යක්ෂ (පාලන) 02, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, අංක 106, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

05. රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරින්ගේ අයදුම්පත්, ඔවුන්ගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් එවිය යුතු ය.

06. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලබන අතර නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට හා අදාළ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. පුහුණු පාඨමාලාවට අදාළව ඉහතින් දක්වා ඇති උපාධිධාරින්ගේ උපාධිය බලපවත්වන දිනය (Effective Date) හා උපාධියේ ශ්‍රේණියේ සාමාන්‍ය අගය (GPA) පදනම් කරගෙන කුසලතා ලේඛනය සකස් කර පුහුණු පාඨමාලාවට සුදුස්සන් තෝරාගනු ලැබේ. මෙම උපාධිධාරීන් බඳවා ගැනීමට අදාළව මීට පෙර නිකුත් කර ඇති *ගැසට්* නිවේදනයේ අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසන් දිනය වූ 2024/07/05 දිනට පසුව උපාධිය ලබා ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

08. පත්වීම් ලබාදීමට අනුමැතිය ලබා දී ඇති පුරප්පාඩු සංඛ්‍යාවට වඩා උපාධිධාරීන් අයදුම් කර තිබේ නම් අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාවට බඳවා ගැනීම සඳහා සාමාන්‍ය දැනීම හා අභියෝග්‍යතාව පිළිබඳ පැය 01 ක ප්‍රශ්න පත්‍රයකින් යුත් ලිඛිත විභාගයක් පවත්වා එම විභාගයේ දී දක්වන කුසලතාවය අනුව වෙන් කළ හැකි පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් පුහුණුවට බඳවා ගැනීම සිදු කෙරේ.

09. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් / අයදුම්කාරියන් විසින් පහත සඳහන් ලියවිලිවල මුල් පිටපත් හා එහි සහතික කරන ලද පිටපත බැගින් ඉදිරිපත් කළ යුතු ය.

I. උප්පැන්න සහතිකය,
II. උපාධි සහතිකයේ මුල් පිටපත (මෙහි සහතික කළ පිටපතක් අයදුම්පත සමඟ ද අමුණා එවිය යුතු ය,
III. විස්තරාත්මක උපාධි සහතිකයේ (Transcript) මුල්පිටපත,
IV. අ.පො.ස (උ.පෙළ) විභාග ප්‍රතිඵල දැක්වෙන සහතිකයේ මුල් පිටපත,
V. ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය,
VI. වෛද්‍ය සභාවේ ලියාපදිංචිය (SLMC) සනාථ කිරීමේ සහතිකය.

10. පුහුණු කිරීමේ පරිපාටිය :-

I. සම්මුඛ පරීක්ෂණයට ලක් කරන ලද අයදුම්කරුවන් අතරින් තෝරාගත් අයදුම්කරුවන් / අයදුම්කාරියන් අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරීමට මාස 06ක කාලයක් සඳහා රෝහල් හා වෙනත් ආයතන වෙත අනුයුක්ත කරනු ලැබේ.

II. අභ්‍යාසලාභීන් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත.

III. පුහුණුව ලබන කාලපරිච්ඡේදය අවසානයේ දී පුහුණුව සාර්ථකව නිම නොකරන, වැඩ හා හැසිරීම සතුටුදායක නොවන හෝ තමන් අනුයුක්ත කරනු ලබන ආයතනයේ පවතින කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව, ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැකි ය.

IV. පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ දී අභ්‍යාසලාභීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 විධිවිධාන අනුව දීමනා ගෙවනු ලැබේ.

V. පුහුණුවට ඇතුළත් කරනු ලබන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණයෙන්ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම් ලදහොත් අවම වශයෙන් වර්ෂ පහක (05) කාල පරිච්ඡේදයක් අදාළ තනතුරේ සේවය කරන බවටත්, සෞඛ්‍ය ලේකම් සමග ගිවිසුමකට හා ඇපකරයකට එළඹිය යුතු ය. පුහුණු කාලසීමාව තුළ දී පුහුණුව හැරගියහොත්, පුහුණුවෙන් පසු පත්වීම භාර නොගතහොත්, ඉහත III වගන්තියේ සඳහන් ආකාරයට පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් හෝ පත්වීම් ලැබ වර්ෂ (05) කාල පරිච්ඡේදයක් අදාළ තනතුරේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් යන ඕනෑම හේතුවක දී පුහුණු කාලය තුළ දී ඔහුට / ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන වියහියදම් ගිවිසුමට හා ඇපකරයට අදාළ මුදල ඔහු / ඇය විසින් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත ගෙවිය යුතු ය. එසේ නොමැති වුවහොත් එම මුදල් අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

11. සේවයේ නියුක්ත කරවීමේ නියමයන් :-

පුහුණුව අවසානයේ අදාළ තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීම සිදුකරන / නොකරන බව තීරණය කරනු ලබන්නේ එම අවස්ථාවේ පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පදනම්වය. ඒ අනුව අදාළ තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය තීරණය කළහොත් අපේක්ෂක/ අපේක්ෂිකාවන් තමන් පුහුණුවට බඳවාගත් පාඨමාලාවට අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ කොන්දේසි හා පුරප්පාඩු

මත අදාළ තනතුරේ III වන පන්තියේ තනතුරට පත් කිරීමට කටයුතු කෙරේ. පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව MT-6-2025 හි පරිදි රු. 54,120 -10x800-11x1190-10x1320-10x1350 - රු. 101,910/- යන වැටුප් පරිමාණය හිමිවන අතර ගෙවීම් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි විධිවිධාන අනුව සිදු කරනු ලැබේ.

12. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතුය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම ලැබීමෙන් පසු ඉහත සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/තනතුරින් පහකර ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. තව ද පුහුණු කාලය තුළදී ඔහුට/ඇයට ගෙවන දීමනාව, රජය විසින් දරන වියහියදම්හි ගිවිසුමට හා ඇපකරයට අදාළ මුදල ඔහුගෙන්/ඇයගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

13. තෝරාගත් අයදුම්කරුවන් අදාළ පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවීමේ පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

14. ඉහත පරිදි බඳවා ගන්නා ලද සියලුම දෙනා රජයේ නිලධාරීන්ට අදාළ වන සියලුම නීතිරීති, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් රෙගුලාසි හා වෙනත් රෙගුලාසිවලටද රජය විසින් වරින් වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ට ද යටත් වනු ඇත.

15. පුහුණුවට බඳවා ගනු ලබන අයදුම්කරුවන් සඳහා නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටියි. ලබාදෙන්නේ නම්, ඒ සඳහා තක්සේරු නිවාස කාමර කුලිය, ජල හා විදුලි බිල්පත් අයකරනු ලැබේ.

16. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම *ගැසට්* නිවේදනය මගින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටලු සහගත තත්ත්වයක් උදා වුවහොත් ඒ පිළිබඳව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

**විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ,**
ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2026 ජූලි මස 20 වැනි දින,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

**ආදර්ශ අයදුම්පත**

***වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ භෞත චිකිත්සක තනතුරේ අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2026***

(අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර ගැසට් නිවේදනය හොඳින් කියවා බලන්න)

1. (අ) මුලකුරු සමග අගට යෙදෙන නම :- ..........................................................................................

(ඉංග්‍රීසියෙන් කැපිටල් අකුරෙන්) උදා. A.B.C.SILVA

(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ..............................................................................

(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :- .....................................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය :- ........................................................................... (පිටපතක් අමුණන්න)

3. තැපැල් ලිපිනය :-

| | සිංහලෙන්/දෙමළෙන් | ඉංග්‍රීසියෙන් |
|---|---|---|
| | ...................................... | ...................................... |
| | ...................................... | ...................................... |
| | ...................................... | ...................................... |
| | ...................................... | ...................................... |

4. (අ) ස්ථිර ලිපිනය :- සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්

....................................... .......................................

....................................... .......................................

....................................... .......................................

....................................... .......................................

(ආ) දුරකථන අංකය : ජංගම [ ]

ස්ථිර [ ]

(ඇ) පදිංචි දිස්ත්‍රික්කය :- සිංහලෙන්/දෙමළෙන් ........................ ඉංග්‍රීසියෙන් ..................................

(ඈ) ඔබ මෙම දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවෙක්ද? ඔව්/නැත :- ..................................................

(ඉ) ඔව් නම් කොපමණ කලක පටන්ද? :- ..........................................................................

5. උපන් දිනය :- වර්ෂය ............................ මාසය ............................ දිනය .........................................

2026.08.07. දිනට වයස අවුරුදු ......................... මාස .......................... දින .................................

6. ස්ත්‍රී/පුරුෂ භාවය :- ස්ත්‍රී [ ] පුරුෂ [ ] (අදාළ කොටුවේ √ ලකුණ යොදන්න.)

7. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග :- ඔව් [ ] නැත [ ] (අදාළ කොටුවේ √ ලකුණ යොදන්න.)

8. විවාහක/අවිවාහක බව :- විවාහක [ ] අවිවාහක [ ] (අදාළ කොටුවේ √ ලකුණ යොදන්න.)

9. අධ්‍යාපන සුදුසුකම් :-

| *අනු. අංකය* | *සමත් වූ උපාධිය* | *සාමාර්ථය* | *ශ්‍රේණියේ සාමාන්‍ය අගය (GPA)හා උපාධිය බල පවත්වන දිනය* | *විශ්වවිද්‍යාලය* | *අධ්‍යන වර්ෂය* |
|---|---|---|---|---|---|
| | | | | | |

10. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ (SLMC) ලියාපදිංචි අංකය හා දිනය :-.....................................................

11.ලිඛිත විභාගයක් පැවැත්වුවහොත් පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍ය :-................................

12. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේද? ඔව් [ ] නැත [ ]

(අදාළ කොටුවේ√ ලකුණ යොදන්න.)

“ඔව්” නම් විස්තර සපයන්න :- ..........................................................................................................

**13. අයදුම්කරුගේ සහතිකය :-**

(අ) මා විසින් *ගැසට්* නිවේදනය හොඳින් කියවා බලා අවබෝධ කරගෙන එහි සඳහන් සියලු කොන්දේසිවලට යටත්ව මෙම අයදුම්පත සම්පූර්ණ කළ බවත්, මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය හෝ අයදුම්පතෙහි සඳහන් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් බව ද මම දැන සිටිමි.

ලංකා බැංකු තැප්‍රොබේන් ශාඛාවේ, අංක 7041318 දරන සෞඛ්‍ය ලේකම් විභාග ගාස්තු රැස්කිරීම යන ගිණුමට අදාළ මුදල් ගෙවා එම ලදුපතෙහි මුල් පිටපත මෙම ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න.

……................................ ................................................

දිනය අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන

14. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :-**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .............................. මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලික දන්නා හඳුනන බවද, ඔහු/ඇය .............................. දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

......................................... ................................................,

දිනය සහතික කරන්නාගේ අත්සන

සහතික කරන්නාගේ නිල මුද්‍රාව.

සහතික කරන නිලධරයාගේ සම්පූර්ණ නම :- ........................................................................................

තනතුර :- ........................................................................................................................................

ලිපිනය :- ........................................................................................................................................

15. **ඉල්ලුම්කරන අපේක්ෂකයා රාජ්‍ය සේවාවේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙක් නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අදාළ නොවන වචන කපා හරින්න.)**

i. ඉහත අයදුම්කරු/අයදුම්කාරිය වන .......................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ ........ ........................................ තනතුර දරන බව මින් සහතික කරමි.

ii. ඉල්ලුම්පත්‍රයේ සඳහන් තොරතුරු සත්‍ය තොරතුරු බව සහතික කරන අතර, මොහු/මැය තනතුර සඳහා තෝරා ගත හොත් ඔහු/ඇය දරන තනතුරට නිදහස් කළ හැකි/නොහැකි බව දන්වමි.

iii. එමෙන්ම මෙම බඳවා ගැනීම බාහිර බඳවා ගැනීමක් බවත්, ඔහු/ඇය අදාළ පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් හෝ නොකිරීමෙන් පසු කිසිඳු අයුරකින් දැනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත්, ඔහුට/ඇයට අවබෝධ කරදුන් බවත් දන්වා සිටිමි.

................................................ ..............................................,

දිනය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම :- ........................................................................................

තනතුර :-........................................................................................................................................

ලිපිනය :- ........................................................................................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිල මුද්‍රාව.

07 - 434

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**සංශෝධනයයි**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය**

***සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරට විවෘත පදනමින් බඳවා ගැනීම***

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරට විවෘත පදනමින් බඳවා ගැනීම සම්බන්ධව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2,481 දරන හා 2026.03.20 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද *ගැසට්* නිවේදනයේ පහත 03 සහ 15 වගන්ති සංශෝධනයන් සිදු කිරීමට සහ එම නිවේදනයට 01(i) වගන්තිය ඇතුළත් කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියෝග කර ඇති බව එහි නියමය පරිදි කාරුණිකව දන්වමි.

**01.** **(I)** *සටහන:* අංක 2,392 දරන හා 2024.07.05 දිනැති රජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය සඳහා දැනටමත් අයදුම් කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

**03.** **වගන්තිය :** පත් කරනු ලබන මුළු පුරප්පාඩු සංඛ්‍යාව 02 කි. අවසාන පුරප්පාඩුව සඳහා හෝ පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවකදී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳව කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 92 වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ. පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

**15.** **වගන්තිය :** මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටලුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

**02.** ඉහත සංශෝධනයන් තුළින් මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු දිනය සහ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන 2026.04.20 දිනය වෙනස් නොවන බවත් වැඩිදුරටත් දන්වා සිටිමි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**කේ. ඒ. විමලේන්තිරරාජා,**
ලේකම්,
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ
සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය.

අංක 492,
ආර්. ඒ. ද මැල් මාවත,
කොළඹ 03.

07 - 327

---

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2026

2025 වර්ෂයට නියමිත කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලබන අතර, විභාගය 2026 ඔක්තෝබර් මස පැවැත්වීමට කටයුතු යොදා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. විභාග මධ්‍යස්ථාන :-

උප ලේඛනය 01 හි දක්වා ඇති සෑම නගරයකම අයදුම්කරුවන් සංඛ්‍යාව අනුව විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ඇත. එහෙත් යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවල දී එකී නගරයේ විභාග මධ්‍යස්ථාන අවලංගු කොට අදාළ අයදුම්කරුවන් ඊට ආසන්නව පිහිටි වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කිරීමට සිදුවනු ඇත.

03. භාෂා මාධ්‍යය :-

මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ. එහෙත් යම් අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු ලබන්නේ තමන් කැමති එක් භාෂා මාධ්‍යයකින් පමණි.

අයදුම්පතේ සඳහන් කරන ලද භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

04. සුදුසුකම් :-

මෙම විභාගය සඳහා අයදුම් කරන සෑම අයදුම්කරුවකුම පහත දක්වා ඇති සුදුසුකම් අතුරින් යටත් පිරිසෙයින් කවර හෝ එක් සුදුසුකමක් සපුරා තිබිය යුතුය.

4.1 ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කතෝලික දහම් පාසලක 10 වන ශ්‍රේණිය සමත් වී කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර පන්තියේ යටත් පිරිසෙයින් වර්ෂයක් හෝ ඉගෙනුම් කටයුතුවල නිරත වීම.

4.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ කතෝලික ධර්මය (ක්‍රිස්තු ධර්මය රෝ.ක.) විෂයයෙන් සමත්ව සිටීම.

4.3 ඒ ඒ රදගුරුවසම්වල පවත්වන වාර්ෂික ධර්මෝපදේශ විභාගයේ එකොළොස්වන ශ්‍රේණිය සමත්වීම.

05. අයදුම් කිරීම :-

5.1. කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය සඳහා ලියාපදිංචි වූ සියලුම දහම් පාසල්වලට අවශ්‍ය අයදුම්පත් හා උපදෙස් පත්‍රිකා තැපැල් මඟින් මේ වන විට යොමු කර ඇති අතර www.donets.lk වෙබ් අඩවිය මඟින් ද බාගත කර ගැනීමේ පහසුකම සලසා ඇත.

5.2 නව කතෝලික දහම් පාසලක් විසින් අයදුම්පත් ඉදිරිපත් කරන්නේ නම් ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති ලියාපදිංචි සහතිකයේ පිටපතක් අයදුම්පතට අමුණා එවිය යුතු ය.

5.3 කවර හෝ පුද්ගලයකුට බාහිර අයදුම්කරුවකු වශයෙන් විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. එසේ වුවත් 4 වැනි ඡේදයේ සුදුසුකම් සපුරා ඇති යම් විභාග අපේක්ෂකයකු වේ නම් තමන් පදිංචි ස්ථානයට ආසන්න දහම් පාසල මඟින් රුපියල් 200/-ක විභාග ගාස්තුවක් ගෙවා විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා අවශ්‍ය උපදෙස් සියලුම දහම් පාසල් ප්‍රධානීන් වෙත ලබා දී ඇත.

5.4 අදාළ දහම් පාසල් ප්‍රධානීන් විසින්ම ඉදිරිපත් කළ යුතු මෙම අයදුම්පත් පිටපත් දෙකකින් යුක්තව සකස් කර මුල් පිටපත විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු අතර දෙවන පිටපත ප්‍රධානාචාර්යවරයා වෙත තබා ගත යුතුය. අයදුම්පත් දෙකෙහිම ප්‍රධානාචාර්යවරයා අත්සන් කර තිබිය යුතු ය.

5.5 මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමඟ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

5.6 අයදුම්පත් භාර ගැනීම **2026.07.24** දිනෙන් ආරම්භවී **2026.08.24** දිනෙන් අවසන් වේ.

5.7 අයදුම්පතේ අපේක්ෂකයන්ගේ නම් ඇතුළත් කිරීමේදී ජාතික හැඳුනුම්පතේ සඳහන් ආකාරයටම වියයුතු අතර ජාතික හැඳුනුම්පතේ අංකය සටහන් කිරීම අනිවාර්ය වේ. ප්‍රතිඵල ලබාදීමෙන් පසුව නාම සංශෝධන සඳහා කරන ඉල්ලීම්වලදී මුද්‍රණ දෝෂ හැරුණු විට වෙනත් ඉල්ලීම් සම්බන්ධව සලකා බලනු නොලැබේ. අයදුම්පත් පැහැදිලිව ද නිවැරදිව ද සම්පූර්ණ කළ යුතුය. එසේ නොවන අයදුම්පත් සහ අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.8 විභාගයට ඉදිරිපත් කරන සියලුම අයදුම්කරුවන් විසින් අයදුම්පතේ සඳහන් සම්පූර්ණ කර ඇති තොරතුරු පෞද්ගලිකව පරික්ෂා කර බලා අත්සන් කළ යුතු අතර සියලු අයදුම්කරුවන්ගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක් විභාග ප්‍රතිඵල නිකුත් කරන තෙක් දහම් පාසල් ප්‍රධානාචාර්යවරයා ළඟ තබා ගත යුතු වේ.

5.9 අයදුම්කරුවන්ගේ අදාළ සහතික පිළිබඳවත්, සුදුසුකම් ලබා තිබීම පිළිබඳවත්, අයදුම්පත් සහතික කරන ප්‍රධානාචාර්යවරයා හෝ පූජාප්‍රසාදිතුමා හෝ වගකිව යුතු ය.

5.10 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් නිකුත් කර ඇති කතෝලික දහම් පාසලේ ලියාපදිංචි අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. දහම් පාසලේ ලිපිනය වෙනස් වී නම් එය දැන්විය යුතු අතර දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය ද සඳහන් කරන්න.

5.11 සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් **විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,**

**පැලවත්ත, බත්තරමුල්ල** ලිපිනයට ඉදිරිපත් කළ යුතු ය. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

අයදුම්පත බහා එවන කවරයේ වමත් පස කෙළවරේ **"කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය 2026"** යනුවෙන් ද ඉල්ලුම් කරන නගරය ද සඳහන් කළ යුතු ය.

5.12 තැපෑලේ දී යම් අයදුම්පතක් නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලබන අතර අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් පිළිබඳ වගකීම දහම් පාසල් ප්‍රධානාචාර්යවරයා විසින් බාර ගත යුතු ය.

06. විභාග ගාස්තු :-

මෙම විභාගය සඳහා නියමිත විභාග ගාස්තුව රු. 200/-කි. එහෙත් ප්‍රථම වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් මෙම විභාග ගාස්තුවෙන් නිදහස් කරනු ලැබේ. ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කිරීමට විභාග ගාස්තුව රු. 50/-කි.

6.1 *විභාග ගාස්තු ගෙවීම* .- ප්‍රධානාචාර්ය විසින් ගාස්තු ගෙවිය යුතු සියලුම අයදුම්කරුවන්ගේ විභාග ගාස්තු එකතු කර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආදායම් ශීර්ෂ අංක **20-03-02-13**ට **බැරවන සේ දිවයිනේ පිහිටි ඕනෑම** තැපැල් කාර්යාලයකට එම සම්පූර්ණ මුදල ගෙවා ලදුපතක් ලබාගෙන එම ලදුපත අයදුම්පතේ පසු පිටේ නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

6.2 කුමන කරුණක් නිසාවත් මෙම විභාගය සඳහා ගෙවන ගාස්තු වෙනත් විභාගයකට මාරු කිරීම හෝ ආපසු ගෙවීම හෝ සිදු කරනු නොලැබේ.

07. ප්‍රවේශ පත්‍ර :-

විභාගයට ඇතුළත් කර ගන්නා සෑම අයදුම්කරුවකු වෙතම, විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍රයක්, අයදුම්පත් ඉදිරිපත් කළ දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා වෙත නිකුත් කරනු ඇත.

7.1 විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකු විසින්ම ස්වකීය විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගෙන විභාගයට පෙනී සිටින ප්‍රථම අවස්ථාවේදීම විභාග ශාලාධිපති වෙත භාර දිය යුතු ය. යම් අයදුම්කරුවකු තම ප්‍රවේශ පත්‍රය භාර නොදී සිටී නම් හා විභාග කොමසාරිස් ජනරාල් විසින් තමාට නියම කරන විභාග මධ්‍යස්ථානය හැර වෙනත් විභාග මධ්‍යස්ථානයකදී විභාගයට පෙනී සිටී නම් ඔහුගේ හෝ ඇයගේ හෝ විභාග අපේක්ෂකත්වය අහෝසි කරනු ඇත.

7.2 විභාග ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන, දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා හෝ මීසම් භාර පූජ්‍යප්‍රසාදීතුමා හෝ ග්‍රාම නිලධාරි හෝ විසින් සහතික කළ යුතු ය.

7.3 විභාගය පැවැත්වීමට දින 07කට පෙර විභාග ප්‍රවේශ පත්‍ර නොලැබුණහොත් එම දහම් පාසලේ ප්‍රධානියා විසින් ඒ බව නොපමාව විභාග කොමසාරිස් ජනාරල් වෙත දැන්විය යුතු ය. එවැනි සෑම අවස්ථාවකම පහත සඳහන් විස්තර සැපයිය යුතු ය.

1. විභාගයේ නම;
2. දහම් පාසලේ නම හා දුරකථන අංකය;
3. දහම් පාසලට ලබාදී ඇති ලියාපදිංචි අංකය;
4. අයදුම්කරුගේ සම්පූර්ණ නම;
5. අයදුම් කළ විභාග මධ්‍යස්ථානය / නගරය;
6. අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය;
7. අයදුම්පත ලියාපදිංචි කළ කුවිතාන්සිය;
8. විභාග ගාස්තු ගෙවා ඇත්නම් එම ලදුපත;

08. අනන්‍යතාව :-

විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

- ජාතික හැඳුනුම්පත
- වලංගු විදේශ ගමන් බලපත්‍රය
- වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

09. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

10. සමත් බව තීරණය කිරීම හා ප්‍රතිඵල නිකුත් කිරීම :-

මෙම විභාගය සඳහා නියමිත විෂයයන් ගණන හතරක් වන අතර, විභාගයෙන් සාමර්ථ්‍යය ලැබීම සඳහා සෑම විභාග අපේක්ෂකයකුම එම විෂයයන් හතරෙන්ම සමත් විය යුතුය. කෙසේ වෙතත් එක් වතාවකදී අදාළ විෂයයන් හතරෙන් එක් විෂයයක් පමණක් අසමත් නම් එය ඌන සාමර්ථ්‍යයක් ලෙස සලකනු ලැබේ. විභාගයට පෙනී සිටි වර්ෂයේ සිට අනුගාමී ඉදිරි වර්ෂ දෙක (02) ඇතුළත දී එම ඌන සාමර්ථ්‍යය ලැබූ විෂයය සඳහා නැවත පෙනී සිට එය සමත් වී ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කළ යුතු ය. ඌන සාමර්ථ්‍යය ලබන සිසුන් ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කිරීමේ දී විභාගයට පෙනී සිටිය යුත්තේ අනිවාර්යයෙන්ම ඌන සාමර්ථ්‍යය ලැබූ විෂයයට පමණි.

10.1 සෑම විෂයයකම එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 100ක් හිමිවන අතර, සමත් වීමේ ශ්‍රේණිවලට අදාළ ලකුණු පරාස සහ සංකේත පහත දැක්වේ.

| *ලකුණු පරාසය* | *ශ්‍රේණිය* | *සංකේතය* |
|---|---|---|
| 0-34 | අසමත් | F |
| 35-54 | සමත් | S |
| 55-69 | සම්මාන | C |
| 70-100 | විශිෂ්ට සම්මාන | D |

10.2 අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලැයිස්තුව අදාළ දහම් පාසල් ප්‍රධානීන් වෙත තැපැල් මඟින් එවනු ලැබේ.

10.3 විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

11. සහතික පත්‍ර :-

මෙම විභාගයෙන් සමත් වන සෑම අයදුම්කරුවකුටම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් සහතික පත්‍රයක් නිකුත් කිරීමට විධිවිධාන යොදනු ලැබේ. අදාළ සහතික පත්‍ර දහම් පාසල් ප්‍රධානාචාර්යවරුන් වෙත තැපැල් මඟින් එවනු ලැබේ. විභාගය සමත්ව එහෙත් සහතික පත්‍රයක් නොලැබුණ යම් අපේක්ෂකයකු වේ නම්, ඒ පිළිබඳව දහම් පාසල් ප්‍රධානාචාර්ය මඟින් විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග ප්‍රතිඵල ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, **පැලවත්ත, බත්තරමුල්ල** යන **ලිපිනයෙන් ලිඛිතව විමසීම් කළ යුතු ය.**

12. **උත්තර පත්‍ර නැවත සමීක්ෂණය :-**

**දහම් පාසල් ප්‍රධානාචාර්යවරුන්ගේ ඉල්ලීම මත පමණක් උත්තර පත්‍ර නැවත සමීක්ෂණයට ඉඩදෙනු ලැබේ. විභාග දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයකින්, විභාග ප්‍රතිඵල නිකුත් වී දින 30 ක් ඇතුළත නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා වන ගාස්තු ප්‍රමාණයන් වරින් වර සංශෝධනය වීමට ඉඩ ඇති බැවින් එය අදාළ අයදුම්පතෙහි දක්වනු ලැබේ. කවර හේතුවක් නිසාවත් අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ උත්තර පත්‍ර පරීක්ෂා කිරීමට ඉඩදෙනු නොලැබේ.**

13. විෂය නිර්දේශය :-

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් සංවිධානය කොට පැවැත්වීමට නියමිත කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගයට අදාළ විෂය නිර්දේශය උප ලේඛන 02 ලෙස මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇත.

14. මූලාකෘති ප්‍රශ්න පත්‍ර :-

මූලාකෘති ප්‍රශ්න පත්‍ර සඳහා "අධ්‍යක්ෂ, ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය, බැල්කම් පෙදෙස, කොටා පාර, කොළඹ 08." යන ලිපිනයෙන් හෝ 0112685459 විමසන්න.

15. මෙම නිවේදනයේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට සියලුම විභාග අයදුම්කරුවන් බැඳී සිටින අතර, මෙහි විධිවිධාන සලසා නැති කවර හෝ යම් කරුණක් වෙතොත් එය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය වනු ඇත.

16. සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ,**
විභාග කොමසාරිස් ජනරාල්.

2026 ජූලි මස 24 වැනි දින,
පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය 01**

**ඒ ඒ දිස්ත්‍රික්කයන් හි විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර සහ නගර අංක**

| *දිස්ත්‍රික්ක අංකය* | *දිස්ත්‍රික්කය* | *නගර අංකය* | *නගරය* |
|---|---|---|---|
| 01 | කොළඹ | 101 | කොළඹ |
| | | 102 | මොරටුව |

| දිස්ත්‍රික්ක අංකය | දිස්ත්‍රික්කය | නගර අංකය | නගරය |
|---|---|---|---|
| 02 | ගම්පහ | 201 | ගම්පහ |
| | | 202 | මීගමුව |
| | | 203 | කඳාන |
| | | 204 | කැලණිය |
| 03 | කළුතර | 301 | කළුතර |
| 04 | මහනුවර | 401 | මහනුවර |
| 05 | මාතලේ | 501 | මාතලේ |
| 06 | නුවරඑළිය | 601 | නුවරඑළිය |
| 07 | ගාල්ල | 701 | ගාල්ල |
| 08 | මාතර | 801 | මාතර |
| 09 | හම්බන්තොට | 901 | හම්බන්තොට |
| 10 | යාපනය | 1001 | යාපනය |
| 11 | මන්නාරම | 1101 | මන්නාරම |
| 12 | වවුනියාව | 1201 | වවුනියාව |
| 13 | මුලතිව් | 1301 | මුලතිව් |
| 14 | කිළිනොච්චිය | 1401 | කිළිනොච්චිය |
| 15 | මඩකලපුව | 1501 | මඩකලපුව |
| 16 | අම්පාර | 1601 | අම්පාර |
| 17 | ත්‍රිකුණාමලය | 1701 | ත්‍රිකුණාමලය |
| 18 | කුරුණෑගල | 1801 | කුරුණෑගල |
| | | 1802 | කුලියාපිටිය |
| 19 | පුත්තලම | 1901 | පුත්තලම |
| | | 1902 | හලාවත |
| | | 1903 | වෙන්නප්පුව |
| 20 | අනුරාධපුරය | 2001 | අනුරාධපුරය |
| 21 | පොළොන්නරුව | 2101 | පොළොන්නරුව |
| 22 | බදුල්ල | 2201 | බදුල්ල |
| 23 | මොනරාගල | 2301 | මොනරාගල |
| 24 | රත්නපුර | 2401 | රත්නපුර |
| 25 | කෑගල්ල | 2501 | කෑගල්ල |

**උපලේඛනය 02**

**2007 සිට ඉදිරියට පැවැත්වෙන විභාග සඳහා විෂය නිර්දේශය**
**(මෙම විභාගය පැය 03 බැගින් වූ ප්‍රශ්න පත්‍ර 04කින් සමන්විතය.)**

**I වැනි ප්‍රශ්න පත්‍රය**

**කතෝලික විශ්වාසය**

**මෙම ප්‍රශ්න පත්‍රය සඳහා අපෝස්තුළුවරුන් ගේ විශ්වාස ලක්ෂණයේ එන මූලික ඉගැන්වීම් පදනම් වේ.**

- මැවුම්කරුවාණෝ
  - විශ්වයේ ප්‍රභවය
  - මැවිල්ලේ අසිරිය
  - මැවිල්ල සුරැකීම (උත්පත්ති 1,2,3)

- ගැලවුම්කරුවාණෝ
  - ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ (ජොහාන් 1 : 1-14)
  - දේව රාජ්‍ය පිළිබඳ ඉගැන්වීම් (මතෙවු 5,6,7)
  - උපමා (මතෙව් 13:1-52)
  - ප්‍රාතිහාර්ය (ජොහන් 11:38-45, ලූක් 8:26-39, මාක් 2:1-12, මාක් 4:35-41)

- ශුද්ධාත්මයාණෝ
  - ක්‍රියාකාරිත්වය (ජොහාන් 7:37-39, 14: 15-31, 16: 5-15, 1කොරින්ති 12: 4-11)

- කිතුනු සභාව
  - ඒකත්වය, ශුද්ධත්වය, සාධාරණත්වය සහ අපෝස්තලිකත්වය
  - සභාව ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය ලෙස
    *රෝම 12:4-1
    *1 කොරින්ති 12:12-31
  - සභාවේ පාලන සැලැස්ම
  - නිල බලය ලත් සේවය
  - පැවිදි සේවාවන්
  - ගිහි සේවාවන්

- රූපාන්තර පරිවර්තනය
  - මනුෂ්‍යයාගේ අවසාන සිද්ධි
  - අලුත් අහසක්, අලුත් පොළොවක් (එළිදරව්ව 21:1-4)

**II වැනි ප්‍රශ්න පත්‍රය**

**කතෝලික ජීවිත පැවැත්ම**

කතෝලික ජීවිත පැවැත්මට පන්නරය ලැබෙන ජනවන්දනාව

- දිව්‍ය පූජාව සහ පූජා පිළිවෙත
- පාස්කු අභිරහස
- දේව වරප්‍රසාද
- ප්‍රසාද නිධාන (පොදු ලක්ෂණ)
- ආරම්භක ප්‍රසාද නිධාන
  - ප්‍රසාද ස්නාපනය
  - අභිවෘද්ධි ආලේපය
  - දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ
- සුවය ලබාගැනීමේ ප්‍රසාද නිධාන
  - සමගි සන්ධානය
  - රෝගීන්ගේ ආලේපය
- සේවය සඳහා ස්ථාපිත ප්‍රසාද නිධාන
  - පූජකවරය
  - ආශිර්වාදකාර බන්ධනය

**III වැනි ප්‍රශ්න පත්‍රය**

**කතෝලික සදාචාරාත්මක ජීවිතය**

කතෝලික සදාචාරය
- දස පනත සහ ප්‍රේමයේ පනතේ පැතිකඩ දෙක
- දස පනත පූර්ණත්වයට පත් කළ ක්‍රිස්තුන් වහන්සේ (මතෙව් 5:21-47)
- තැනිතලා ස්ථානයේ දේශනය (ලූක් 6:17-49)
- බුද්ධිය, නිදහස් කැමැත්ත සහ හැඟීම්
- දේව සම්බන්ධ ධර්ම ගුණ
- හෘද සාක්ෂිය
- දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම (1-3 පනත්)
- අසල්වැසියාට ප්‍රේම කිරීම (4-10 පනත්)
- දස පනත තුළින් මතුවිය යුතු සාරධර්ම
- කතෝලික අනන්‍යතා

**IV වැනි ප්‍රශ්න පත්‍රය**

**යාච්ඤාවේ ජීවිතය**

දේව සබඳතා ගොඩනැගෙන යාච්ඤාව
- පුරාණ ගිවිසුමේ යාච්ඤාව
  - ආබ්‍රහම්
  - මෝසෙස්
- නව ගිවිසුමේ යාච්ඤාව
  - ක්‍රිස්තුන් වහන්සේ යාච්ඤා කළ විශේෂ අවස්ථා
  - යාච්ඤාව පිළිබඳ විශේෂ ඉගැන්වීම් (ලූක් 11:1-3)
- සභා ජීවිතය තුළ යාච්ඤාව
  - ප්‍රශංසාව
  - තුති පිදීම
  - යැදුම
  - මැදිහත් යැදුම
  - භාවනාත්මක යාච්ඤාව
- ස්වාමිවාක් ආරාධනයේ ඉල්ලීම් හත
  - ඔබගේ නාමයට ප්‍රශංසා වේවා
  - ඔබගේ රාජ්‍යය පැමිණේවා
  - ඔබගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් මෙලොවෙහි ඉටුවේවා
  - අපගේ එදිනෙදා භෝජනය අද අපට දානය කළ මැනව
  - අපට වැරදි කරන අයගේ වැරදි අප කමා කරන්නාක් මෙන් අපගේ වැරදි ද කමා කළ මැනව.
  - පාප අවස්ථාවන්ට අසුවීමට අපට ඉඩ නොදුන මැනව
  - අයහපතින් අප මුදා ගත මැනව.

විවිධ භක්ති අභ්‍යාස
- ජපමාලය
- නුවාන
- ශුද්ධ පැය

**පරිශීලනය කළ යුතු ග්‍රන්ථ**

- **නව කතෝලික ධර්මෝපදේශය**
- **මහෝපදේශය**
- **ශුද්ධ බයිබලය (නියමිත කොටස්)**
- **II වැනි වතිකාන ප්‍රකාශන**
- **ජනවන්දනාව**
- **වර්තමාන ලෝකයේ ශුද්ධ සභාව**
- **ක්‍රිස්තුන් වහන්සේගේ සභාව**
- **ගිහි ධර්මදූත සේවය**

**හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීම සඳහා වූ තෙවන විභාගය 2026**

2016 අංක 10 දරන හෝමියෝපති පනතේ 30(3) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

හෝමියෝපති පනතේ 30(1) වගන්තිය යටතේ හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින් වශයෙන් ලියාපදිංචි වීම සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් අතරින් සුදුසුකම් ලත් අයදුම්කරුවන් හට 2016 අංක 10 දරන හෝමියෝපති පනතේ 30(2) වගන්තිය යටතේ පැවැත්වීමට නියමිත තෙවන ලිඛිත විභාගය 2026 ජූලි මස 27, 28 සහ 30 යන දිනයන්වල සිරි ධම්මාරාමය, අංක 144, හයිලෙවල් පාර, නුගේගොඩ දී පෙ. ව. 9.00 සිට ප. ව. 3.00 දක්වා පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙමි.

**ලේඛකාධිකාරී (වැ. බ.),**
හෝමියෝපති වෛද්‍ය සභාව.

හෝමියෝපති වෛද්‍ය සභාව,
අංක 94, ෂෙල්ටන් ජයසිංහ මාවත,
වැලිසර,
රාගම.

07 - 379

---

**වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ පවතින වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් **2026 ඔක්තෝබර් මස කොළඹ දිස්ත්‍රික්කයේ දී** පවත්වනු ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත.

- අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.donets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams/E.B.Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 ජූලි මස 27 දින පෙ.ව. 9.00**ට විවෘත වන අතර **2026 අගෝස්තු 25 වැනි දින ප.ව. 9.00 ට අවසන් වේ.**
- දැනට රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානියා වෙත භාර දිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.
- අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

1.0 බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *බඳවා ගන්නා ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | සැලසුම් ශිල්පී | 91 | පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් වසරක පුහුණුව සඳහා) |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | බඳවා ගන්නා ශ්‍රේණිය |
|---|---|---|---|
| 2. | විදුම් සහකාර | 06 | පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෙවසරක පුහුණුව සඳහා) |
| 3. | පර්යේෂණ සහකාර (සාමාන්‍ය) | 02 | |
| 4. | සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂක | 13 | |
| 5. | පාංශු ප්‍රස්ථාරක | 02 | |
| 6. | ජල විද්‍යා සහකාර | 06 | |
| 7. | ජල විද්‍යා ක්ෂේත්‍ර සහකාර | 03 | |
| 8. | පර්යේෂණ සහකාර (ඉංජිනේරුමය ද්‍රව්‍ය) | 03 | |
| 9. | පස් සමීක්ෂක | 10 | |
| 10. | පර්යේෂණ සහකාර (ජල ශක්ති) | 03 | |
| 11. | යාන්ත්‍රික මූලික | 10 | III වන ශ්‍රේණියට බඳවා ගැනේ. එහෙත් බඳවා ගැනීමෙන් අනතුරුව මුල් මාස 06 තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික වැඩපලක සේවාස්ථ පුහුණුවක් ලබා දෙනු ලැබේ. |

1.1. තනතුරුවල රාජකාරි ස්වභාවය

| අනු. අංකය | තනතුරු නාමය | පැවරෙන කාර්යයන් |
|---|---|---|
| 1. | සැලසුම් ශිල්පී | (1) ඉංජිනේරු කාර්ය මණ්ඩලය විසින් දෙනු ලබන නිර්මාණ සටහන්, මූලික පරාමිති, කෙටුම්පත් සටහන් ඇසුරෙන් විස්තරාත්මක සැලසුම්පත් පිළියෙල කිරීම/ පරීක්ෂා කිරීම : බිම් මැනුම් තලමිති මැනුම් ආශ්‍රයෙන් පිඹුරුපත්, සමෝච්ච රේඛා සිතියම්, දික්කඩ හරස්කඩ සැලසුම්පත් පිළියෙල කිරීම/පරීක්ෂා කිරීම, වාරිමාර්ග ව්‍යාපාරවල ඉඩම් කට්ටි කිරීමේ සැලසුම්පත්, ඉඩම් පවරා ගැනීමේ සැලසුම්පත්, මෙහෙයුම් නඩත්තු සැලසුම්පත් ආදිය පිළියෙල කිරීම/ පරීක්ෂා කිරීම.<br><br>(2) ප්‍රමාණ ගණනය : ගාස්තු සඳහා මිල විශ්ලේෂණය : ප්‍රමාණ බිල්පත් පිළියෙල කිරීම/ පරීක්ෂා කිරීම<br><br>(3) වැඩ ඇස්තමේන්තු පරීක්ෂා කිරීම. වැඩ ඇස්තමේන්තු අනුසාරයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළ පෝරම, උප ලේඛනය පිළියෙල කිරීම/ පරීක්ෂා කිරීම : වැඩ සඳහා ගෙවීම් කිරීමට අදාළ මිනුම් පොත්, ගෙවීම් බිල්පත්, අවසන් ගෙවීම් වාර්තා හා සැලසුම්පත් පරීක්ෂා කිරීම.<br><br>(4) වාරිමාර්ග ව්‍යාපාරවල තාක්ෂණික මෙහෙයුම් හා මනා දත්ත පිළිබඳ ලේඛන නඩත්තුව : ප්‍රගති වාර්තා සටහන් පිළියෙල කිරීම/පරීක්ෂා කිරීම.<br><br>(5) සැලසුම්පත්, පිඹුරුපත් සහ අනෙකුත් සැලසුම් කාර්යාලීය ලේඛන ද්‍රව්‍ය හා උපකරණවල භාරකාරත්වය හා නඩත්තුව.<br>විධායකය/ කළමනාකරණය විසින් පවරනු ලබන අනෙකුත් සැලසුම් ශිල්පීමය රාජකාරී |

| අනු. අංකය | තනතුරු නාමය | පැවරෙන කාර්යයන් |
|---|---|---|
| 2. | විදුම් සහකාර | • මධ්‍යම හා මහා පරිමාණ ඉදිකිරීම් සඳහා භූමියේ ශක්තිමත්භාවය, භූගත ජල කාන්දුවීම් ආදිය පරීක්ෂා කිරීමේ කටයුතු.<br>• විශාල ඉදිකිරීම්වල අත්තිකාරම් සඳහා විවිධ ගැඹුරු මට්ටම්වලින් පාෂාණ හා පස් තට්ටුවල සාම්පල ලබා ගැනීම.<br>• පාෂාණ ස්ථරවල කාන්දුවීම නැවැත්වීම හා ඒවා ශක්තිමත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.<br>• නිම කරන ලද ඉදිකිරීම්වල සිමෙන්ති හා රසායනික ද්‍රව්‍ය කාවැද්දීම මඟින් ද මතුපිට යන්ත්‍ර මඟින් කොන්ක්‍රීට් ආස්තරණ යෙදීම මඟින් ද ජල කාන්දුවීම හා වෙනත් දුර්වලතාවලට පිළියම් යොදා ශක්තිමත් කිරීමේ කටයුතු කිරීම.<br>• ඉහත කාර්යයන්ට අදාළ වාර්තා ඉදිරිපත් කිරීම.<br>ඉහත කාර්යයන්ට අවශ්‍ය වන විදුම් යන්ත්‍ර, ජල පොම්ප හා වෙනත් උපකරණ ද ඒවාට අදාළ ඩීසල් හා පෙට්‍රල් යන්ත්‍ර ක්‍රියාකරවීම, නඩත්තු කිරීම හා අලුත්වැඩියා කිරීම. |
| 3. | පර්යේෂණ සහකාර (සාමාන්‍ය) | (1) දැනට කෙරෙමින් පවතින හා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන වාරිමාර්ග හා වෙනත් සංවර්ධන ව්‍යාපෘතිවල ශක්‍යතා අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය වන පස් හා ජල සාම්පලවල භෞතික හා රසායන ගතිගුණ නිර්ණය සඳහා විශ්ලේෂණ කිරීම.<br>(2) ද්‍රාවන හා ප්‍රතිකාරක නිරවද්‍ය ලෙස පිළියෙල කිරීම, එදිනෙදා විශ්ලේෂණ කාර්යන්හිදී භාවිත වන නවීන සූක්ෂම ඉලෙක්ට්‍රොනික් විද්‍යුත් හා විද්‍යුත් යාන්ත්‍රික උපකරණ නිසි ලෙස භාවිත කිරීම, නිරවද්‍යව අංක ශෝධනය කිරීම හා මැනවින් නඩත්තු කිරීම, විශ්ලේෂණ මඟින් ලබා ගන්නා දත්ත සම්පාදනය කිරීම. |
| 4. | සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂක | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාරි ව්‍යාපෘති ඉදිකිරීම් සඳහා අවශ්‍ය ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂණ කටයුතු කිරීම, එම ක්ෂේත්‍රයේ ඉංජිනේරුමය ද්‍රව්‍ය සඳහා තත්ත්ව පාලන කටයුතුවල (පස් සහ කොන්ක්‍රීට් ද්‍රව්‍යන්හි ගතිගුණ හා ශක්තීන් පිළිබඳ) නිරතවීම හා එම ප්‍රමිතීන් සහතික කිරීම.<br>රාජ්‍ය හා පුද්ගලික ආයතනවල ඉල්ලීම මත කෙරෙන ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ඉංජිනේරුමය ද්‍රව්‍ය පර්යේෂණ කටයුතුවල නිරතවීම. |
| 5. | පාංශු ප්‍රස්ථාරක | • පාංශු සමීක්ෂණ හා පාංශු පරිශීලන සිතියම් ඒකාබද්ධ කිරීම හා රාශිභූත කිරීම.<br>• ලබා දෙන්නා වූ දත්ත ආශ්‍රයෙන් සිතියම් ඇඳීම හා සිතියම් වර්ණ ගැන්වීම.<br>• දළ පාංශු සිතියමට (Draft Soil Map) පාංශු සිතියම (Final Soil Map) පිළියෙල කිරීම.<br>• ගුවන් ඡායාරූප, ඉංජිනේරු මිනුම්පත් ආදිය ඇසුරෙන් ඉඩම් වර්ගීකරණ පාංශු හා ඉඩම් පරිහරණය ආදී සිතියම් පිළියෙල කිරීම, සිතියම් වර්ණ කිරීම හා ක්ෂේත්‍ර ඵලයන් ගණනය කිරීම, සිතියම් විශාල කර ඇඳීම සහ කුඩා කර ඇඳීම, විවිධ පස් පැතිකඩ හු දර්ශන ඇඳීම, මෙම අංශයෙන් නිකුත් කළ වාර්තාවලට රූප සටහන් ප්‍රස්ථාර ආදිය ඇඳීම, වර්ණ සිතියම් නිෂ්පාදනයට අවශ්‍ය දෑ පිළියෙල කිරීම.<br>• පරිගණක ආශ්‍රිත මෘදුකාංග භාවිතයෙන් පාංශු සිතියම් පිළියෙල කිරීම. |

| අනු. අංකය | තනතුරු නාමය | පැවරෙන කාර්යයන් |
|---|---|---|
| 6. | ජල විද්‍යා සහකාර | ශ්‍රී ලංකාවේ දිවයින පුරා ජල ද්‍රෝණි හා ජලාශ ආශ්‍රිතව එක් රැස් කර ගන්නා වූ මූලික ජල විද්‍යාත්මක හා කාලගුණික දත්ත, විද්‍යාත්මක සිද්ධාන්ත ප්‍රායෝගිකව උපයෝගී කොට ගෙන ජල විද්‍යාත්මක අවශ්‍යතාව සඳහා ගණනය කිරීම, විශ්ලේෂණය කිරීම, දත්ත පරිගණකගත කිරීම, පරිගණක භාවිතයෙන් විශ්ලේෂණය කිරීම, දෛනික, මාසික, වාර්ෂික හා දිගුකාලීන වාර්තා පිළියෙල කිරීම හා පවත්වාගෙන යාම, මහජනතාවට හා අදාළ ආයතනවලට එම තොරතුරු පිළියෙල කිරීම.<br><br>• එක් රැස් කර ගන්නා ජල විද්‍යාත්මක හා කාලගුණ දත්තවල නිරවද්‍යතාව ආරක්ෂා කිරීම හා ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම සහ සහතික කර දත්ත බැංකුව නිරතුරුව පවත්වාගෙන යාම.<br>• ගංගාවල ගංවතුර මට්ටම ඉහළ යාම නිර්ණය කිරීම සඳහා අවශ්‍ය දත්ත ලබාගෙන පරිගණකගත කිරීම හා නව ගණිතමය මාදිලි භාවිතයෙන් ගංවතුරට ලක්විය හැකි ප්‍රදේශ අධ්‍යයන කිරීම.<br>• ක්ෂේත්‍ර පරීක්ෂණ මඟින් ගංවතුර හානි මට්ටම් හා එම හානිවලට ලක්විය හැකි ප්‍රදේශ මිනුම්ගත කිරීම හා සිතියම් ගත කිරීම.<br>• එම ප්‍රධාන ගංගාවල එවැනි ගංවතුරක් ඇතිවිය හැකි හෝ ඊට ආසන්න වන සෑම අවස්ථාවකදීම එම දත්ත නිරතුරුවම ලබා ගැනීම හා ඒ අනුව අනතුරු ඇඟවීම. |
| 7. | ජල විද්‍යා ක්ෂේත්‍ර සහකාර | ජල විද්‍යා අංශය මගින් තෝරා ගත් ගංගා නිම්න සඳහා ජල විද්‍යා ක්ෂේත්‍ර මිනුම් ඒකක පවත්වා ගෙන යාම හා අවශ්‍ය වන කාලගුණ දත්ත, වර්ෂාපතනය, ගංගාවල ගලා යන ජල මට්ටම සහ අවට ඇති වැව්වල ජල ධාරිතාවන්හි වෙනස්වීම් ආදිය පිළිබඳ දත්ත එක් රැස් කිරීම.<br><br>• එසේ ලබා ගන්නා ලද සියලුම ජල විද්‍යා හා කාලගුණ දත්ත පරීක්ෂා කර ලේඛන ගත කිරීම සඳහා මාසය අවසානයේ දී ප්‍රධාන කාර්යාලට ඉදිරිපත් කිරීම.<br>• ගංගාවල හා අතු ගංගාවල එම ජල මට්ටම පවතින අවස්ථාවල දී ගලා යන ජල ධාරිතාව මිනුම් ගැනීම.<br><br>ගංවතුර අනතුරක් ඇති විය හැකි අවස්ථාවලදී හෝ ඊට ආසන්න අවස්ථාවේදී ඒ සඳහා අනතුරු ඇඟවීම අවශ්‍ය වන ක්ෂේත්‍ර දත්ත නිරතුරුවම ප්‍රධාන කාර්යාලයට වාර්තා කිරීම, ප්‍රධාන ගංවතුර අවස්ථාවල දී එම වේලාවන් සමග ගංවතුර මට්ටම් වෙනස්වීම් සටහන් කර ගැනීම. |
| 8. | පර්යේෂණ සහකාර (ඉංජිනේරුමය ද්‍රව්‍ය) | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාරි ව්‍යාපෘති ඉදිකිරීම් සඳහා අවශ්‍ය ඉංජිනේරුමය ද්‍රව්‍යවල යෝග්‍යතාව පිළිබඳව දී ඇති පිරිවිතරවලට අනුව පර්යේෂණ කටයුතුවල නිරත වීම හා පර්යේෂණාත්මක සාධක මත ප්‍රමිතීන් සහතික කිරීම, එම ක්ෂේත්‍රයේ ඉංජිනේරුමය ද්‍රව්‍ය සඳහා තත්ත්ව පාලන කටයුතුවල (පස් සහ කොන්ක්‍රීට් ද්‍රව්‍යයන්හි ගතිගුණ හා ශක්තීන් පිළිබඳ) සේවයේ අවශ්‍යතාව මත නිරත වීම.<br><br>රජයේ හා පුද්ගලික ආයතනවල ඉල්ලීම් මත කෙරෙන ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ඉංජිනේරුමය ද්‍රව්‍ය පර්යේෂණ කටයුතුවල නිරත වීම හා එම ප්‍රමිතීන් සහතික කිරීම. |
| 9. | පස් සමීක්ෂක | (1) දැනට කෙරෙමින් පවතින හා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන වාරිමාර්ග හා වෙනත් සංවර්ධන ව්‍යාපෘති මෙම අංශය මගින් සිදු කරනු ලබන පස් සමීක්ෂණ කටයුතු ඉඩම් පරිහරණ කටයුතු සඳහා අවශ්‍ය වන ක්ෂේත්‍ර දත්ත හා අනෙකුත් දත්ත ලබා ගැනීම සහ අන්තර්ජාතික වර්ගීකරණයට අනුකූලව එක් එක් පස් වර්ග වර්ගීකරණය කිරීම.<br>(2) පස නිර්මාණය වීමේ සාධක (දේශගුණය, භූ විෂමතාව, භූ විද්‍යාත්මක කරුණු යනාදිය) සැලකිල්ලට ගනිමින් ඒ ඒ පාංශු ගණ හෝ ශ්‍රේණිවල පිහිටීම හා පැතිරීම තීරණය කිරීම. |

| අනු. අංකය | තනතුරු නාමය | පැවරෙන කාර්යයන් |
|---|---|---|
| | | (3) අන්තර්ජාතික සම්මතයන්ට අනුකූලව පාංශු පැතිකඩයන්හි සවිස්තරාත්මක සටහනක් සකස් කිරීම සඳහා අවශ්‍ය වන පරිද්දෙන් පාංශු නියැදි ලබා ගැනීම. එම පාංශු නියැදි විශ්ලේෂණය සඳහා රසායානාගාරයට භාර දීම, එම විශ්ලේෂණ දත්ත හා ක්ෂේත්‍ර නිරීක්ෂණ දත්ත පදනම් කරගනිමින් අවසාන පාංශු සිතියම්හි නිරවද්‍යතාව තහවුරු කරගැනීම සහ පාංශු යතුර පිළියෙල කර ගැනීම.<br>(4) අදාළ ප්‍රදේශවල ගුවන් ඡායාරූප ත්‍රිමානේක්ෂය උපයෝගී කරගනිමින් ගුවන් ඡායාරූප විශ්ලේෂණය කිරීම.<br>(5) දත්ත අවශ්‍ය වන තීව්‍රතාව අනුව පාංශු සමීක්ෂණ කටයුතු සිදු කර ක්ෂේත්‍ර දත්ත ලබා ගැනීම, පස් පැතිකඩ අනුව පස් වර්ග හඳුනාගැනීම.<br>(6) ක්ෂේත්‍රයේදී ලබාගන්නා වූ නිරීක්ෂණ දත්ත මත දළ පාංශු සිතියම (Draft Soil Map) පිළියෙල කිරීම සහ පෙන්ටොග්‍රාස් යන්ත්‍රය භාවිත කරමින් අවශ්‍ය පරිමාණයට සකස් කිරීම.<br>(7) ක්ෂේත්‍රයේදී ලබාගන්නා වූ නිරීක්ෂණ දත්ත හා අන්තර්ජාලය උපයෝගී කරගෙන ඉඩම් පරිහරණ සිතියම් පිළියෙල කිරීම.<br>(8) ජී.පී.එස්. (ජී.පී.එස් - Global Position System) උපකරණ මඟින් දත්ත ලබාගැනීම.<br>(9) පසේ ජල සන්නායකතාව පිළිබඳ දත්ත ලබා ගැනීම.<br>(10) ක්ෂේත්‍රයේදී ක්ෂේත්‍ර කම්කරු මුරකරු සහ රියදුරන්ගේ පාලන කටයුතු (අධීක්ෂණ කටයුතු) සිදු කිරීම සහ ඔවුන්ගේ මූල්‍යමය රාජකාරී කටයුතු සෘජුවම සිදු කිරීම |
| 10. | පර්යේෂණ සහකාර (ජල ශක්ති) | ජල ශක්ති අංශයේ ඉංජිනේරුවරුන්ගේ කටයුතුවලට සහාය වීම, ජල ශක්ති අංශයට අදාළ ඉදිකිරීම් වැඩවලට සියලුම ක්ෂේත්‍ර කටයුතු උපකරණ, ද්‍රව්‍ය, කම්කරු පාලනය, ජලශක්ති ආදර්ශන මෙහෙය වීම, ගොඩනැගිලි හා අනෙකුත් යටිතල පහසුකම් නඩත්තුව, ජල ශක්ති අංශයේ ඉදිකිරීම් වැඩවලට අදාළ ඇස්තමේන්තු, සැලසුම්පත් සකස් කිරීම, දෙපාර්තමේන්තුවට අදාළ සියලුම යාන්ත්‍රික හා ඉලෙක්ට්‍රොනික උපකරණ අලුත්වැඩියාවන්ට සම්බන්ධ වීම, එම උපකරණ මිලදී ගැනීමට අදාළ පිරිවිතර සකස් කිරීම සහ ඒවා මිලදී ගැනීමේදී හා තත්ත්ව වාර්තා සකස් කිරීමේදී අදාළ කටයුතුවලට සහාය වීම. |
| 11. | යාන්ත්‍රික මූලික | සුළු සේවකයන් පාලනය කිරීමේදී සහ රථ වාහන, යන්ත්‍ර ආදිය සඳහා ලදුපත් පිළියෙල කිරීමේදී යාන්ත්‍රික ඉංජිනේරුවරයාට සහාය වීම, තාක්ෂණ සහායක (යාන්ත්‍රික) හෝ වැඩ ලිපිකරු සමඟ වැඩ ආරම්භ කිරීම, ගබඩා භාරකරු නොමැති අවස්ථාවලදී අලුත්වැඩියාව සඳහා පැමිණෙන අයිතමයන් තමන් භාරයට ගැනීම, අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය අමතර කොටස් ආයුධ සහ ද්‍රව්‍ය ආදිය ලබා ගැනීම, ගබඩා පොත් නඩත්තු කිරීම, ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී යාන්ත්‍රික ඉංජිනේරුවරයාට සහාය වීම, අලුත්වැඩියා කිරීමෙන් පසු නිසි පරිදි ආපසු භාර දීම සහ අබලි අමතර කොටස් ද්‍රව්‍ය සහ භාණ්ඩ ආපසු ගබඩාවට භාරදීම කරන ලද අලුත්වැඩියාවන් ලොග් පොත්වල ඇතුළත් කිරීම, තාක්ෂණ සහායක (යාන්ත්‍රික) හෝ පිරිවැය ලිපිකරු සමඟ මුළු පිරිවැය (බිල්පත්) පිළියෙල කිරීම, පාවිච්චි කරන ලද අමතර කොටස් ඉන්ධන ලිහිසි තෙල් සහ අනෙකුත් දේ වෙනුවෙන් ද්‍රව්‍ය වාර්තාව ඉදිරිපත් කිරීම.<br><br>අලුත්වැඩියාවලට යාන්ත්‍රික වැඩපොලට රැගෙන එන යන්ත්‍ර හා වාහන, ගබඩා භාරකරුගෙන් යාන්ත්‍රික වැඩපොලට භාරගෙන, අලුත්වැඩියාව නිම වීමෙන් පසු නැවත ගබඩා භාරකරු වෙත භාර දීම. |

2. බඳවා ගැනීමේ ක්‍රමය :

2.1. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

2.2. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය අයදුම්කරුවන්ගේ ශාරීරික යෝග්‍යතාව හා සහතික පත්‍ර පරීක්ෂා කර බැලීම සඳහා වන අතර, සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

2.3. වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ එකඟතාව ලද පසු විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව හෝ මාර්ගගතව හෝ ප්‍රතිඵල නිකුත් කරනු ලැබේ.

3. වැටුප් පරිමාණය :

පුහුණු කිරීමේ ශ්‍රේණිය - රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025(I) හි උපලේඛන VI අනුව මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

III වන ශ්‍රේණිය - රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන II අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 52,250-10X800-11X1,190-10X1,320-10X1,350- 1,00,040/- වේ. ( MN3 -2025)

4. සේවා ගණය - අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික

4.1. ශ්‍රේණි - III ශ්‍රේණිය
II ශ්‍රේණිය
I ශ්‍රේණිය

4.2. තනතුරෙහි ස්වභාවය - මෙම පත්වීම ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.

5. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි -

5.1. පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කර ගනු ලබන අයදුම්කරුවන් අදාළ පුහුණු කාලසීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලබන විභාගය සමත් බවට නිකුත් කරනු ලබන සහතිකය ඉදිරිපත් කිරීමෙන් පසුව පමණක් සේවයේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

5.2. පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත් වීමට අපොහොසත් වන ආධුනිකයන් වෙතොත් ඔවුනට මාස 06 කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාලසීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ලැබේ.

5.3. III ශ්‍රේණියේ පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ. III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය. එසේ නොවන්නේ නම් තනතුරෙහි සේවය අවසන් කරනු ලැබීමට යටත් විය යුතුය.

5.4. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව නියමිත කාලය තුළ ලබාගැනීම අනිවාර්ය වේ.

5.5. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යපරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, මුදල් රෙගුලාසි සංග්‍රහයට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

5.6. තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක පිහිටි ක්ෂේත්‍රයේ වැඩබිම්වල සේවයේ යෙදීමට හැකියාව තිබිය යුතු ය.

6. වයස් සීමාව :
අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

(ඒ අනුව 2008.08.25 දිනට හෝ ඊට පෙර හා 1996.08.25 දිනට හෝ ඊට පසු උපන්දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

7. අවශ්‍ය සුදුසුකම් :

7.1. අධ්‍යාපන සුදුසුකම්

7.1.1. සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සහිතව විෂයයන් හය (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම;

*සහ*

**7.1.2. සැලසුම් ශිල්පී, විදුම් සහකාර, සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂක, පාංශු ප්‍රස්ථාරක, ජල විද්‍යා සහකාර, ජල විද්‍යා ක්ෂේත්‍ර සහකාර, පර්යේෂණ සහකාර (ඉංජිනේරුමය ද්‍රව්‍ය), පර්යේෂණ සහකාර (ජල ශක්ති), යාන්ත්‍රික මූලික යන තනතුරු සඳහා**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ව්‍යවහාරික ගණිතය / ශුද්ධ ගණිතය / සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව සහිතව විද්‍යා විෂයයන් තුනකින් (03) එකවර සමත්ව තිබීම

**7.1.3. පර්යේෂණ සහකාර (සාමාන්‍ය) සහ පස් සමීක්ෂක තනතුරු සඳහා**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ තවත් එක් විද්‍යා හෝ ගණිත විෂයය සහිතව විද්‍යා විෂයයන් තුනකින් (03) එකවර සමත්ව තිබීම.

7.2. වෘත්තීය සුදුසුකම්

සැලසුම් ශිල්පී තනතුර සහ යාන්ත්‍රික මූලික තනතුර සඳහා ඉහත 7.1 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව පහත සඳහන් වෘත්තීය සුදුසුකම් තිබිය යුතුය.

**සැලසුම් ශිල්පී**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම.

**යාන්ත්‍රික මූලික**

I. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව;

*හෝ*

III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

IV. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව ලබා තිබීම;

හෝ

V. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම;

*හෝ*

VI. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

*හෝ*

VII. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

7.3. කායික සුදුසුකම්:

සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

7.4. වෙනත් සුදුසුකම් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
III. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.
IV. සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

8. විභාග පරිපාටිය :

විභාගය විෂයයන් දෙකකින් යුත් ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල සහ දෙමළ මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 03 | 100 | 40 |

8.1. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

1. බුද්ධි පරීක්ෂණය (සෑම තනතුරක් සඳහාම පොදු වේ)

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලභාවයත් සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත් තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත වේ. |

2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය

- සැලසුම් ශිල්පී තනතුර සඳහා

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | දෙන ලද නිර්මිතයක ප්‍රමාණය ගණනය කිරීම සහ ඉදිකිරීම් ද්‍රව්‍යවල ගුණාත්මක ස්වභාවය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සහ ඇඳීමේ මූලධර්ම පාවිච්චි කර දෙන ලද සටහන් අනුව වස්තුවක හෝ කොටසක හරස්කඩක් සහ පෙර හෝ පසු පෙනුමක් ඇඳීම. |

- සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂක/විදුම් සහකාර/පර්යේෂණ සහකාර (ඉංජිනේරුමය ද්‍රව්‍ය)/පර්යේෂණ සහකාර (ජල ශක්ති)/පාංශු ප්‍රස්ථාරක තනතුරු සඳහා

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | වීජ ගණිතය, ජ්‍යාමිතිය, ත්‍රිකෝණමිතිය, ද්‍රව සහ ද්‍රවවල භෞතික ගුණ, ද්‍රවස්ථිති විද්‍යාව, මිනුම් ඒකක, පරිමාණ සිතියම් කියවීම, විද්‍යාත්මක ගණනය කිරීම ආදී විෂයයන් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. |

- පස් සමීක්ෂක /පර්යේෂණ සහකාර (සාමාන්‍ය) තනතුර සඳහා

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | I කොටස (භෞතික විද්‍යාව)<br><br>a) ආලෝකය<br>b) තාපය<br>c) යන්ත්‍ර විද්‍යාව<br>d) විද්‍යුතය හා චුම්භකත්වය<br><br>II කොටස (රසායන විද්‍යාව)<br><br>a) කාබනික රසායනය<br>b) ප්‍රමාණාත්මක හා ගුණාත්මක විශ්ලේෂණය<br>c) අකාබනික රසායනය<br>d) සාමාන්‍ය රසායන විද්‍යාව |

- ජල විද්‍යා ක්ෂේත්‍ර සහකාර /ජල විද්‍යා සහකාර තනතුර සඳහා

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | ඛණ්ඩාංක ජ්‍යාමිතිය, ගති විද්‍යාව, ස්ථිති විද්‍යාව, ත්‍රිකෝණමිතිය, ද්‍රවස්ථිති විද්‍යාව, සංඛ්‍යානය, යාන්ත්‍ර විද්‍යාව, ආලෝකය (වර්තනය සහ පරාවර්තනය පිළිබඳ නියමයන්) තාපය, ආර්ද්‍රතාව, විදුලිය, ඉලෙක්ට්‍රොනික විද්‍යාව ආදී විෂයයන් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. |

- යාන්ත්‍රික මූලික තනතුර සඳහා

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | ඇඳීමේ මූලධර්ම පාවිච්චි කරගෙන දෙන ලද රූපසටහන් අනුව යන්ත්‍රයක හෝ කොටසක හරස්කඩක් හෝ පෙර හෝ පසු පෙනීමක් ඇඳීම සහ භෞතික විද්‍යාව, යාන්ත්‍රික විද්‍යාව හා ව්‍යවහාරික ගණිතය යන විෂයයන් පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්න පත්‍ර පිළියෙල කරනු ලැබේ. |

9. අයදුම් කිරීමේ ක්‍රමය:

9.1 මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත් හා වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා

බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිතා කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-Mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.2 අයදුම් කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ඉහත කුමන තනතුරට ද යන්න අදාළ ස්ථානයෙහි (√) සලකුණ මගින් පැහැදිලිව සලකුණු කිරීම අනිවාර්ය වේ. යම් අයදුම්කරුවකු තනතුරු කිහිපයක් සඳහා අයදුම් කරන්නේ නම් ප්‍රමුඛතාවය අනුව පිළිවෙළ සඳහන් කළ යුතු වේ. එක් අයදුම්කරුවකුට අයදුම් කළ හැකි උපරිම තනතුරු සංඛ්‍යාව තුනකි (03).

9.3 අයදුම්කරු විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගත යුතු අතර විභාග දිනයේ ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුත්තේ එසේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයයි. අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට අවසර ලබා දෙනු නොලැබේ.

9.4 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් මගින් අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

9.5 අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් කිරීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු වේ.

9.6 ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කරගත යුතු ය. විභාග ශාලාවේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.7 සියලුම අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

10. විභාග ගාස්තු

❖ **විභාග ගාස්තුව රු. 1,200/- කි**. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත සඳහන් ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදු කළ යුතු ය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card);
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the facility of internet transactions);
iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මගින් (Online Banking Method of Bank of Ceylon);
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank Of Ceylon).

*සටහන-*

(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර, විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු

ගෙවීමේදී සිදු වන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඈ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිදු හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

11. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව:

11.1 විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපතිවරයා සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

i. ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එසේම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කරගත හැකි වන පරිදි මුහුණ සහ දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කරගනු නොලැබේ. තව ද, විභාග ශාලාවට ඇතුළත් වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

12. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

12.1 අපේක්ෂකයකුට අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරේ. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු / ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු / ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කෙරේ.

13. පොදු කරුණු:

13.1 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවේ. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණ අවසන් තීරණය වේ.

13.2 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ පිළිබඳව හා මෙම පුරප්පාඩු පිරවීම සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත.

13.3 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළකරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

ආචාර්ය. (ඉංජි.) **කිත්සිරි වැලිගෙපොලගේ,**
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව.

2026 ජූලි මස 13 වැනි දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව.
කොළඹ 07.

07 - 380

---

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

**සීමිත පදනම මත අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සාමාන්‍ය අධ්‍යාපන අංශයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ - 02 සේවා ගණයේ සහකාර ශිෂ්‍යා නිවාස අධිකාරි III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන තරග විභාගය - 2026**

01. අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ **www. doenets.lk** වෙබ් අඩවියේ “Our Service” යටතේ ඇති “Online Applications – Recruitment Exams/E.B. Exams”ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 ජූලි මස 20 වැනි දින පෙ.ව. 9.00ට විවෘත වන අතර 2026 අගෝස්තු මස 17 වැනි දින ප.ව. 9.00 ට අවසන් වේ.**

නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාර දිය යුතු අතර සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

02. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව සහකාර ශිෂ්‍ය නිවාසාධිකාරි III ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ලැබේ.

03. පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය අමාත්‍යාංශ ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ.

(අ) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය **අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ - 02 සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පටිපාටිය අනුව සහ 2022.12.14 දිනැති අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු** සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරි III ශ්‍රේණියේ **තනතුරට** පත් කරනු ලැබේ.

(ආ) පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර තුන (03) ක් අනිවාර්යෙන්ම සේවය කළ යුතු ය. කෙසේ වෙතත් අමාත්‍යාංශ ලේකම් විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතු මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, අමාත්‍යාංශ ලේකම් හට ඒ සඳහා බලය ඇත.

(ඇ) මෙම පත්වීම එක් අවුරුදු වැඩබැලීමේ කාලයකට යටත් වේ. **කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ - 02 සේවා ගණය**යේ බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් පරිදි බඳවාගෙන වසර තුන (03) ක් ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුයි.

(ඉ) පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔබ සුදුසුකම් සපුරාලු භාෂා මාධ්‍යයට අනුව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන අංක 18/2020 සහ ඊට ආනුෂංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව ඔබ විසින් අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු වේ.

**04. 2025.03.25 දිනැති 10/2025** දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි **MN 01-2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි වන අතර එයට අදාළ වැටුප් පරිමාණය රු.45,230 -10x540 -11 x 630 -10 x 890 - 10 x1,190 - රු. 78,360 ක් වන අතර එම වැටුප ඔබට හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. පත්වීම ක්‍රියාත්මක වන දින සිට ඔබට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.**

**05. මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිත වේ. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් වේ.)**

06. තනතුරට අයත් කාර්ය භාරය :

I. නේවාසික සිසුන්ගේ විනය, ආරක්ෂාව, සුභසාධනය හා ආහාර සැපයීම යන කටයුතු කරගෙන යාම හා එම කටයුතු ඉටුකරලීමේදී ශිෂ්‍ය නිවාසාධිකාරිට සහාය දැක්වීම, නේවාසික ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සුභසිද්ධිය, නේවාසික ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ භාරකරු ලෙස කටයුතු කිරීම, විනය පවත්වාගෙන යාම, ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීමට අදාළ පොත්පත් ලේඛන පවත්වාගෙන යාම, ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම, ආරක්ෂා කිරීම, මුළුතැන්ගෙට නිකුත්කිරීම පිළිබඳ කටයුතු, ආහාරපාන පිසීම පිළිබඳ පරීක්ෂා කිරීම, මුළුතැන්ගෙයි මෙවලම් පිළිබඳ පවිත්‍රතාව, නේවාසිකාගාර පිරිසිදුව තැබීමට විධිවිධාන යෙදීම, නේවාසික සිසුන්ගේ ආරක්ෂාව, රෝගාතුර වූ සිසුන් පිළිබඳව කටයුතු, රජය සතු දේ සහ සිසුන් සතු දේ ආරක්ෂා කිරීම පිළිබඳ කටයුතු, පවිත්‍රතාව පවත්වා ගැනීමට අදාළ කටයුතු, රෝගී සිසුන් පිළිබඳ සොයා බැලීම, ආහාර පාන පිළියෙල කිරීම පිළිබඳ කටයුතු, ආහාර ගන්නා අවස්ථාව පිළිබඳ අධීක්ෂණ කටයුතු, නේවාසිකාගාරවල ජලය, විදුලිය විධිමත්ව සැපයීමට අදාළ කටයුතු, නේවාසිකයන් නේවාසිකාගාරයෙන් බැහැරවීම හා පැමිණීම පිළිබඳ අදාළ කාර්යයන්

II. තනතුරට අදාළව ආයතන ප්‍රධානීන් පවරනු ලබන වෙනත් රාකාරී

07. **සුදුසුකම් : -**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන **අමාත්‍යාංශයේ ජාතික පාසල්, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සහ ගුරුවිද්‍යාලයන්හී සේවයේ නියුතු ප්‍රාථමික ශිල්පීය නොවන හා ප්‍රාථමික අර්ධ ශිල්පීය** සේවා ගණයට අයත් තනතුරුධාරීන්ට සීමිත පදනම මත සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරි තනතුරට අයදුම් කිරීමට,

**(අ) අධ්‍යාපන සුදුසුකම් : -**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී මව් භාෂාව, ගණිතය යන විෂයයන් සහ තවත් එක් විෂයයකට සම්මාන සාමර්ථ්‍යයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත්ව තිබිය යුතුය.

**(ආ) පළපුරුද්ද : -**

නියමිත දිනට අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය **අධ්‍යාපන අමාත්‍යාංශය** යටතේ ජාතික පාසල්, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, ගුරු විද්‍යාල, ගුරු මධ්‍යස්ථාන ඇතුළු සාමාන්‍ය අධ්‍යාපන අංශයට අයත් ආයතනයන්හි ප්‍රාථමික සේවා ගණයේ ස්ථිර තනතුරක යටත් පිරිසෙයින් වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

**(ඇ) වෙනත් සුදුසුකම් : -**

I. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය **අධ්‍යාපන අමාත්‍යාංශය** යටතේ ජාතික පාසල්, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, ගුරු විද්‍යාල, ගුරු මධ්‍යස්ථාන ඇතුළු සාමාන්‍ය අධ්‍යාපන අංශයට අයත් ආයතනයන්හි ප්‍රාථමික සේවා ගණයේ ස්ථිර පත්වීමක් දැරිය යුතු අතර එම පත්වීම්වල ස්ථිර කර තිබිය යුතු ය.

II. යම් තනතුරකට ස්ථිරව පත්කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික/අනියම්/ කොන්ත්‍රාත් පදනම මත සේවා කාල පරිච්ඡේදයන් සහ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇති පුහුණුවීම් කාල පරිච්ඡේද ගණන් ගනු නොලැබේ.

III. සුදුසුකම් සපුරා තිබිය යුතු දිනට පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොමැති විය යුතු ය.

V. නියමිත දිනට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කර තිබිය යුතු ය.

VI. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් මානසික හා ශාරීරික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

උපරිම වයස් සීමාවක් අදාළ නොවේ.

08. *විභාග පටිපාටිය .-* මෙම විභාගය සිංහල, දෙමළ මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අයදුම්කරුවකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර විභාගයට නියමිත සියලු ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතු ය. ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

09. ඇගයීමේ ක්‍රමවේදය

| | මුළු ලකුණු |
|---|---|
| සාමාන්‍ය දැනීම (ලිඛිත පරීක්ෂණය) | 100 (කාලය පැය 01) |
| බුද්ධි පරීක්ෂණය (ලිඛිත පරීක්ෂණය) | 100 (කාලය පැය 01) |
| යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය | 50 |

**I සාමාන්‍ය දැනීම (කාලය පැය 01යි ලකුණු 100 )**

තනතුරට අදාළ කාර්යභාරය හා ආයතන ප්‍රධානීන් පවරනු ලබන වෙනත් රාජකාරි ඉටු කිරීමට අවශ්‍ය සාමාන්‍ය දැනීම පරීක්ෂා කිරීම සඳහා සකස් කරනු ලබන බහුවරණ මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි.

**II බුද්ධි පරීක්ෂණය (කාලය පැය 01යි ලකුණු 100 )**

අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාව, තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සකස් කර ඇති බහුවරණ මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි.

**III යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය (ලකුණු 50 )**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයන් විසින් මෙහි 10 ඡේදයේ යටතේ දැක්වෙන ප්‍රධාන ක්ෂේත්‍ර යටතේ ලකුණු ලබා දීම සිදු කරනු ලැබේ. ලකුණු ලබා දීම සඳහා සලකා බලනු ලබන සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතුයි. මෙහිදී සිතාමතා අසත්‍ය තොරතුරු ඇතුළත් කරන ලද බව පෙනී ගියහොත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව අයදුම්කරුවන්ට සහ එම අයදුම්පත් සහතික කරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට එරෙහිව කටයුතු කරනු ලැබේ.

මෙම තරග විභාගය මගින් පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය යන එක් එක් විෂයය සඳහා අවම වශයෙන් ලකුණු 40ක් බැගින් ලබා සමත් විය යුතු ය. ලිඛිත විභාගයේ

කුසලතා අනුපිළිවෙල අනුව සම්පූර්ණ කිරීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාව අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. (ලිඛිත පරීක්ෂණයේ ලකුණු හෝ කුසලතා අනුපිළිවෙල යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ලබා දෙනු නොලැබේ). ඒ අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අනුමත ලකුණු ලබා දීමේ පටිපාටිය අනුව ලකුණු ලබාදෙන අතර මූලික සුදුසුකම් ද පරීක්ෂා කරනු ලැබේ. ලබාගත් ලකුණු සහ යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණුවල එකතුව මත එක් එක් අයදුම්කරුවන්ගේ කුසලතාව නිර්ණය කරනු ලැබේ.

**10. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ - 02 සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පටිපාටිය අනුව සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරී තනතුරට සීමිත පදනම මත බඳවා ගැනීම සඳහා වන යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය - ලකුණු ලබා දීමේ පටිපාටිය - 2025**

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර* | *ලකුණු ලබා දෙන ආකාරය* | *උපරිම ලකුණු* | |
|---|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් i අ.පො.ස (සා.පෙළ) | • විශිෂ්ට සමාර්ථය - එක් විෂයයකට ලකුණු 02 බැගින්<br>• අධි සම්මාන - එක් විෂයයකට ලකුණු 01 බැගින්<br>• සම්මාන - එක් විෂයයකට ලකුණු 0.5 බැගින් (ගණිතය, මව්බස, ඉංග්‍රීසි තවත් එක් විෂයකට සම්මාන සමාර්ථය ලබා තිබීමට අමතරව ) | 10 | 15 |
| ii . අ.පො.ස (උ.පෙළ) | • විශිෂ්ට සමාර්ථය - එක් විෂයයකට ලකුණු 2 බැගින්<br>• අධි සම්මාන - එක් විෂයයකට ලකුණු 1 බැගින්<br>• සම්මාන - එක් විෂයයකට ලකුණු 0.5 බැගින් | 5 | |
| iii . උපාධි | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම. | 15 | |
| 02. අතිරේක සේවා පළපුරුද්ද | අවුරුදු 05න් පසු වැඩිවන සෑම වර්ෂයකටම ලකුණු 02 බැගින් | 15 | 15 |
| 03. පරිගණක හැකියාව<br><br>• රජයේ ලියාපදිංචි අංකය සහතික පත්‍රයේ සඳහන් නොවේ නම් රජයේ ලියාපදිංචි බවට අදාළ ආයතනයෙන් ලිඛිත ලියවිල්ලක් ලබා ගෙන ඉදිරිපත් කළ යුතුයි | රජයේ ලියාපදිංචි ආයතනයකින් පිරිනමන ලද පරිගණක පිළිබඳ ඩිප්ලෝමාව හෝ ඊට ඉහළ සහතිකයක් | 3 | 5 |
| | රජයේ ලියාපදිංචි ආයතනයක පරිගණක පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම. | 2 | |
| 04. මව් භාෂාව හා දෙවන භාෂාව හැර වෙනත් භාෂාවක ප්‍රවීණතාව (සහතික මඟින් සනාථ කළ යුතුය) | ඉංග්‍රීසි හෝ වෙනත් භාෂාවක් පිළිබඳව අවම වශයෙන් ඩිප්ලෝමාවක් සම්පූර්ණ කිරීම | 5 | 5 |
| | අ.පො.ස. (උ.පෙළ) විෂයක් ලෙස ඉංග්‍රීසි හෝ වෙනත් භාෂාවක් හදාරා තිබීම (01 යටතේ ලකුණු ලබා දුන්නේ නම් මේ සඳහා සලකා බලනු නොලැබේ.) | 2 | |
| 05. ආයතනයේ අභිවෘද්ධියට දක්වන ලද දායකත්වය | ප්‍රශංසා ලිපි - එක් ලිපියකට ලකුණු 2.5 බැගින්<br><br>• ආයතන ප්‍රධානියා විසින් නිකුත් කර තිබිය යුතු යි. | 5 | 5 |

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර* | *ලකුණු ලබා දෙන ආකාරය* | *උපරිම ලකුණු* | |
|---|---|---|---|
| 05. ආයතනයේ අභිවෘද්ධියට දක්වන ලද දායකත්වය | • ඇගයීම් එක් ලිපියකට - එක් ලකුණ බැගින්<br>• ආයතන ප්‍රධානියා විසින් නිකුත් කර තිබිය යුතු යි. | 5 | 5 |
| 06. සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතාව | පෞරුෂත්වය | 3 | 5 |
| | සන්නිවේදන කුසලතා | 2 | |
| | භාෂා හැසිරවීම | 1 | |

(සියලුම සුදුසුකම් අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.)

***සටහන 1***

සහතිකය ඉදිරිපත් කරනු ලබන ආයතනයේ රජයේ ලියාපදිංචි අංකය සහතික පත්‍රයේ සඳහන් විය යුතු අතර එසේ සඳහන් නොවේ නම් රජයේ ලියාපදිංචි බවට ලියාපදිංචි අංකය සඳහන් ලිඛිත තහවුරු කිරීමක් අදාළ ආයතනය වෙතින් ලබාගෙන ඉදිරිපත් කිරීම අයදුම්කරු විසින් සිදු කළ යුතු ය.

11. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් -

I. අයදුම්පත් පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවකදී වුව ද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

II. අපේක්ෂකයකු විසින් සපයන ලද තොරතුරු පසු කලකදී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු /ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහුට/ඇයට තවදුරටත් පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බලනු නොලබන අතර මෙම විභාගය හේතුකොටගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රාජ්‍ය සේවයෙන් පහ කිරීමට වුව ද යටත්වේ.

III. විභාග කොන්දේසි

12. **මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය.**

**අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවිඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail)ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instruction) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින්** තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

13. විභාග ගාස්තුව රු. 600.00කි. විභාග ගාස්තුව ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් සිදු කළ යුතුය.

(*අ*) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
(*ආ*) අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card With the Facility of Internet Transactions)
(*ඇ*) ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/ Flex යෙදවුම මගින් (Online Banking Method / Flex App of Bank of Ceylon )
(*ඈ*) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් ( Any Branch of the Bank of Ceylon)

*සටහන :-*

ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

14. ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවිඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් වශයෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

15. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

16. අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයන් අයදුම්කරු විසින් විඳ දරා ගත යුතු ය.

17. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යනු පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින්/ අයදුම්කරුවන් වෙත කෙටි පණිවිඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් වෙබ් නිවේදනයේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම , ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡයා පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී/ සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

18. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවෙක් තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු, විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි, සමාදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ කොමසාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍යාගමික පූජ්‍ය ස්ථානය භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

19. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට/ඇයට සිදුවනු ඇත.

20. අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබා ගත් ලකුණු / මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත්වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මගින් යැවීමට හෝ www.results.exams.gov.lk හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත.

21. විභාගයට ඇතුළත් කර ගැනීම.

(*අ*) විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින විභාග දිනයේ දී එහි විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

(*ආ*) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* මුල පළකර ඇත.

*සටහන* - අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

22. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපකරණ පැළඳගෙන නොමැති බව තහවුරුකර ගත හැකිවන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

23. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**නාලක කලුවැව,**
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

2026 ජුනි මස 30 වැනි දින,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය",
බත්තරමුල්ල.

07 - 398

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

ඉංග්‍රීසි විෂයය සහිතව, සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය/ ශාස්ත්‍රවේදී (බාහිර) පළමු පරීක්ෂණ සහ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත් ගුරුවරුන් රජයේ විශ්ව විද්‍යාලවලට ඇතුළත් කිරීම 2025/ 2026 අධ්‍යයන වර්ෂය

2025/ 2026 අධ්‍යයන වර්ෂයෙන් ආරම්භ කරනු ලබන පහත සඳහන් පාඨමාලා හැදෑරීම පිණිස ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්ව විද්‍යාලවලට ඇතුළත් කර ගැනීම සඳහා ඉංග්‍රීසි විෂය සහිතව, සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය/ ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සහ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත් රජයේ හෝ රජය විසින් අනුමත කරන ලද පෞද්ගලික පාසල්වල සේවය කරන ගුරුවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

I. කලා උපාධි පාඨමාලාව (ඉංග්‍රීසි විෂයය සහිතව)
II. විද්‍යාවේදී උපාධි පාඨමාලාව (ජෛවීය විද්‍යා/ භෞතීය විද්‍යා/ ව්‍යවහාරික විද්‍යා)

02. අයදුම්කරුවන් මේ සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය :

I. (*අ*) කලා පාඨමාලාවට අයදුම් කිරීම සඳහා, 2021 වර්ෂයේ හෝ ඊට පසු වර්ෂයක දී ඉංග්‍රීසි විෂය සහිතව, සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය/ ශාස්ත්‍රවේදී (බාහිර) පළමු පරීක්ෂණය සමත්ව තිබීම.

(*ආ*) ජෛවීය විද්‍යා, භෞතීය විද්‍යා හෝ ව්‍යවහාරික විද්‍යා යන පාඨමාලාවට අයදුම් කිරීම සඳහා, 2021 වර්ෂයේ හෝ ඊට පසු වර්ෂයක දී විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත්ව තිබීම.

II. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ගුරුවරයකු වශයෙන් අවුරුදු 05ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර අදාළ ගුරු පත්වීම ස්ථිර කර තිබිය යුතු ය.

III. තෝරාගනු ලබන අවස්ථාවේ දී ගුරු අභ්‍යාස විද්‍යාලයක, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක, ජාතික අධ්‍යාපන ආයතනයේ උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ලියාපදිංචි වී නොසිටීම;

*හෝ*

ශ්‍රී ලංකා රජයේ විශ්වවිද්‍යාලයක අභ්‍යන්තර උපාධි පාඨමාලාවක් (මුදල් ගෙවීමකින් තොරව) හැදෑරීම සඳහා ලියාපදිංචි වී නොසිටීම.

IV. යම් විශ්වවිද්‍යාලයක පවත්නා ජෛවීය විද්‍යා, භෞතිය විද්‍යා හෝ ව්‍යවහාරික විද්‍යා පාඨමාලාවක් සම්බන්ධයෙන් වූ විට, අදාළ පාඨමාලාවට සුදුසුකම් ලැබීම පිණිස අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී හෝ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණයේ දී හෝ අදාළ විශ්ව විද්‍යාලය විසින් පූර්ව අවශ්‍යතාවක් ලෙස දක්වන ලබන විෂයයන් සඳහා සාමාර්ථ ලබා තිබීම.

**V. පූර්ණ කාලීන පාඨමාලාව සඳහා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා ගැනීමට හිමිකම ඇති ගුරුවරයෙක් විය යුතු ය. (වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා ගැනීමට ඇති හිමිකම් පිළිබඳ සම්මුඛ පරීක්ෂණයේ දී විමසා බලනු ලැබේ.)**

03. රජයේ ගුරුවරුන්ගේ අයදුම්පත් විදුහල්පති, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කළ යුතු අතර, රජය විසින් අනුමත කරන ලද පෞද්ගලික පාසල්වල ගුරුවරුන්ගේ අයදුම්පත් අදාළ විදුහල්පති/කළමනාකරු විසින් සහතික කළ යුතු ය. එකී අයදුම්පත්වල පාසලේ විදුහල්පති/කළමනාකරු විසින් අදාළ ගුරුවරයා/ගුරුවරිය සඳහා අධ්‍යයන නිවාඩු අනුමත කළ හැකි/ නොහැකි බව සඳහන් කළ යුතු ය.

04. සෑම අයදුම්පතක් ම මෙහි සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට පිටපත් දෙකකින් (02) යුතුව **2026.08.30** දිනට පෙර **"අධ්‍යාපන අධ්‍යක්ෂ, මානව සම්පත් සංවර්ධන ශාඛාව, අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල."** ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ **"ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීම සඳහා අයදුම් පත් 2025/2026 (ගුරුභවතුන් සඳහා)"** යනුවෙන් සඳහන් කළ යුතු ය.

05. මෙම ප්‍රවේශය යටතේ සිසුන් තෝරා ගනු ලබනුයේ ඉංග්‍රීසි විෂය සහිතව, සාමාන්‍ය කලා යෝජ්‍යතා (බාහිර) පරීක්ෂණයේදී/ශාස්ත්‍රවේදී (බාහිර) පළමු පරීක්ෂණයේදී හෝ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණයේදී ලබාගත් මුළු ලකුණු, අදාළ විෂයට ලබා ගත් ලකුණු සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පවත්වන සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු පදනම් කරගෙන ය.

06. මෙම උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසුව, මෙකී සුදුසුකම පදනම් කරගෙන උපාධි ගුරු පත්වීම් ලබාදීම පිළිබඳ වගකීමට මෙම අමාත්‍යාංශය බැඳී නොමැත.

07. අයදුම් පත්‍රය, මාධ්‍ය තුනෙන්ම (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි) අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ (www.moe.gov.lk) විශේෂ දැන්වීම් තීරයේ පළ කර ඇත.

08. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**නාලක කලුවැව,**
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය",
බත්තරමුල්ල.

07 - 348

---

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

### පරිවෙණාචාර්යවරුන්, රජයේ අනුමත පෞද්ගලික පාසල්වල අනුමත පත්වීම්ධාරී ගුරුවරුන් සහ උපකෘත විශේෂ පාසල්වල අනුමත පත්වීම්ලාභී ගුරුවරුන් සඳහා II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026

1.0 ඉහත සඳහන් සේවාවන්ට අයත් නිලධාරීන්ගේ වැටුප් ගෙවීම්, ශ්‍රේණි උසස් කිරීම් හා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ ආදී සියලුම ආයතනික කටයුතු අංක 1885/38 හා 2014.10.23 දින නිකුත් කර ඇති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධාන අනුව සිදු කරනු ලබයි. ඒ අනුව අංක 2444/21 හා 2025.07.08 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පළ කර ඇති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ තෙවන සංශෝධනය සහ අංක 2493/61 හා 2026.06.19 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පළ කර ඇති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ සිව්වන සංශෝධනයේ විධිවිධානයන්ට අනුකූලව II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2026 සැප්තැම්බර් මස පවත්වනු ලබන බවත් ඉහත විභාගය සඳහා පිරිවෙන්වල සේවය කරනු ලබන පරිවෙණාචාර්යවරුන්, රජයේ අනුමත පෞද්ගලික පාසල්වල අනුමත පත්වීම්ධාරී ගුරුවරුන් සහ උපකෘත විශේෂ පාසල්වල අනුමත පත්වීම්ලාභී ගුරුවරුන්හට පෙනී සිටීමට අවස්ථාව සලසා

දෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම විභාගය උපලේඛනය I හි සඳහන් නගරවල පිහිටුවන ලබන විභාග මධ්‍යස්ථානවලදී පමණක් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන ලද නගරය / නගර පසුව වෙනස් කිරීමට ඉඩ ලබා දෙනු නොලැබේ. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කර නොමැති නම් එම අයදුම්කරුවන් ඔවුන්ගේ දෙවන මනාපය ලෙස දක්වන ලද නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කර නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

අයදුම්පත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doents.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams /E.B. Exams" ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 ජූලි මස 27 වැනි දින පෙ.ව.09.00 ට විවෘත වන අතර 2026 අගෝස්තු මස 17 වැනි දින ප.ව. 09.00 ට අවසන් වේ.** අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපත් දෙකක් (02) ලබාගෙන එම පිටපත් දෙකෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ සහතිකය සමග ඉන් එක් පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කළ යුතු ය. අනෙක් පිටපත අවශ්‍ය විටක ඉදිරිපත් කිරීම සඳහා තමන් භාරයේ තබා ගත යුතුය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරා ගත යුතුය.

2.0

I. මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ.

II. විභාග අපේක්ෂකත්වය ලැබීම සඳහා පනවා ඇති නීති, *ගැසට් පත්‍රයේ* වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුන්ට සිදුවනු ඇත.

III. මෙම විභාගය සඳහා අයදුම් කළ හැක්කේ පරිවේණාචාර්යවරුන්, රජයේ අනුමත පෞද්ගලික පාසල්වල අනුමත පත්වීම්ධාරී ගුරුවරුන් සහ උපකෘත විශේෂ පාසල්වල අනුමත පත්වීම්ලාභී ගුරුවරුන්ට පමණි.

IV. මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමග ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

3.0 විභාග ගාස්තු:-

මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාග පළමු වරට පවත්වනු ලබන බැවින් ගාස්තු අයකරනු නොලැබේ.

4.0 අයදුම්පත් යොමු කිරීම:-

මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E -mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.0 විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

I. ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

6.0 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත.

විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මඟින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දක්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත, ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වේනොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

7.0 අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ අදාළ කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතාව සම්පූර්ණ කර ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

8.0 විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු ය.

9.0 විභාග අයදුම්කරුවන් තමන්ට නියම කරන විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු ය.

10.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අවශ්‍ය පරිදි රාජකාරි නිවාඩු ලබා දිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

11.0 විභාගය පැවැත්වෙන්නේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණි. ඒ අතුරින් තම පත්වීම් විෂයයට අදාළ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකි අතර, පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයකටම පිළිතුරු සැපයිය යුත්තේ එකම මාධ්‍යයෙනි. අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

12.0 අධ්‍යාපනවේදී උපාධි සුදුසුකම් මත 2 පන්තියේ II ශ්‍රේණියට සෘජුවම බඳවාගත් ගුරුවරුන් හැර, ඉහත සේවාවන්වල 2 පන්තියේ II ශ්‍රේණියට උසස් කරන ලද අනෙකුත් ගුරුවන් 2-II ශ්‍රේණියට උසස්වීම් ලබා වසර හතරක් (4) ගතවීමට පෙර II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කළ යුතු ය.

13.0 විභාග පරිපාටිය :

13.1 ප්‍රශ්න සැකැස්ම :

අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශය විසින් e-thaksalawa නිල වෙබ් අඩවියේ පළ කරන ලද පහත 13.2හි දක්වා ඇති ස්වයං අධ්‍යයන මොඩියුල සම්බන්ධ විෂය නිර්දේශය ආශ්‍රයෙන් සකස් වේ. මෙම කාර්යක්ෂමතා කඩඉම සඳහා වන ලිඛිත පරීක්ෂණය එම අදාළ මොඩියුල සියල්ලම ආවරණය වන සේ පහත පරිදි පැවැත්වේ.

| *ව්‍යුහය* | *ප්‍රශ්න සැකැස්ම* | *කාලය* | *ලකුණු* |
|---|---|---|---|
| I පත්‍රය | බහුවරණ | පැය 01 | 40 |
| IIපත්‍රය | ව්‍යුහගත ප්‍රශ්න හෝ අර්ධ ව්‍යුහගත ප්‍රශ්න | පැය 02 | 60 |

***සටහන 1 -*** I පත්‍රය ලෙස විෂයානුබද්ධ දැනුම I පත්‍රය නිකුත් කරන අතර එය බහුවරණ ප්‍රශ්න 40 කින් සමන්විත වේ. II පත්‍රය ලෙස විෂයානුබද්ධ දැනුම II පත්‍රය නිකුත් කරන අතර එය අර්ධ ව්‍යුහගත ප්‍රශ්න 04 කින් සමන්විතය. එම ප්‍රශ්න පත්‍ර දෙකෙහිම අන්තර්ගත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

13.2 විභාගය සඳහා විෂය නිර්දේශය :

| *කාර්යක්ෂමතා කඩඉම* | *අදාළ වන මොඩියුල* |
|---|---|
| I වන කාර්යක්ෂමතා කඩඉම | 1. නායකත්ව සංවර්ධනය හා කළමනාකරණය |
| | 2. ක්‍රියාකාරකම් සැලසුම් සකස් කිරීමේ ඵලදායී ක්‍රම ශිල්ප |
| | 3. පන්ති කාමර කළමනාකරණය සහ අන්තර්කරණ අධ්‍යාපනය |

*සටහන 2 -* සාමාර්ථ්‍යය සඳහා ඉහත 13.1 වගුව මඟින් දක්වන ලද I පත්‍රයේ සහ II පත්‍රයේ ලකුණුවල මුළු එකතුව 40% ක් හෝ ඊට වැඩිවන සේ ලබා ගත යුතු ය.

14.0 විභාග ප්‍රතිඵල නිකුත් කිරීම :- විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ ක්‍රමවේදය පහත පරිදි වේ.

I. විභාගයට පෙනී සිටින සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල පළාත් අනුව වෙන් වෙන් වශයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පිටපත් දෙකක් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරනු ලබයි.

II. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරනු ලබන එකී විභාග ප්‍රතිඵල ලේඛන පිටපත් දෙකෙන් එක් පිටපතක් අදාළ ගුරුවරුන්ගේ විභාග ප්‍රතිඵල සත්‍යාපනය කිරීමට හැකිවන පරිදි පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් කටයුතු කරනු ලැබේ.

III. එසේම, පරිවේණාචාර්යවරුන්, රජයේ අනුමත පෞද්ගලික පාසල්වල අනුමත පත්වීම්ධාරී ගුරුවරුන් සහ උපකෘත විශේෂ පාසල්වල අනුමත පත්වීම්ලාභී ගුරුවරුන්ගේ පත්වීම ස්ථිර කිරීමට හා ශ්‍රේණි උසස්වීම්වලට අදාළ වන කාර්යක්ෂමතා කඩඉම් විභාග ප්‍රතිඵල, විභාග දෙපාර්තමේන්තුව විසින් අයදුම්කරුට ද බාගත කිරීමට අවස්ථාව සලසා දෙනු ලැබේ. එසේ බාගත කර ගන්නා ප්‍රතිඵල ලේඛනය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත අයදුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු අතර, එම ප්‍රතිඵල ලේඛන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් සත්‍යාපනය කරගෙන අදාළ නිලධරයාගේ පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කළ යුතුය.

IV. එකී සත්‍යාපනය කරන ලද ප්‍රතිඵල පදනම් කරගෙන පළාත්/කලාප අධ්‍යාපන බලධරයන් විසින් අදාළ ගුරුවරුන්ගේ පත්වීම ස්ථිර කිරීම හා ශ්‍රේණි උසස් කිරීම සඳහා අදාළ කටයුතු කළ යුතුවේ.

V. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

15.0 මෙම විභාග නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

16.0 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**නාලක කලුවැව,**
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

2026 ජූනි මස 20 වැනි දින,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය",
බත්තරමුල්ල.

**උප ලේඛනය I**

| *දිස්ත්‍රික්කය / නගරය* | *දිස්ත්‍රික් / නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වවුනියාව | 12 |
| මුලතිව් | 13 |
| කිළිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොනරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

07 - 429

**හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීම සඳහා වූ තෙවන විභාගය - 2026**

2016 අංක 10 දරන හෝමියෝපති පනතේ 30(3) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

2016 අංක 10 දරන හෝමියෝපති පනතේ 30(1) වගන්තිය යටතේ හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලෙස ලියාපදිංචි වීම සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් අතරින් සුදුසුකම් ලත් අයදුම්කරුවන් අතරින් සුදුසුකම් ලත් අයදුම්කරුවන් වෙනුවෙන්, එම පනතේ 30(2) වගන්තිය යටතේ පැවැත්වීමට නියමිත තෙවන ලිඛිත විභාගය 2026 අගෝස්තු මස 03, 04 සහ 05 යන දිනවල පෙ. ව. 9.00 සිට ප. ව. 3.00 දක්වා නුගේගොඩ, හයිලෙවල් පාර, අංක 144 හි පිහිටි ශ්‍රී ධර්මාරාමයේ දී පැවැත්වීමට තීරණය කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ. මෙම විභාගය මීට පෙර 2026 ජූලි මස 27,28 සහ 30 යන දිනවල පැවැත්වීමට සැලසුම් කර තිබූ නමුත්, නොවැලැක්විය හැකි හේතූන් මත එම විභාගය අගෝස්තු මස 3, 4, 5 යන දින සඳහා කල් තැබූ බව තවදුරටත් දන්වා සිටිමි.

මෙම විභාගයෙහි 2026 ජූලි මස 27, 28 සහ 30 දින උදෙසා මීට පෙර නිකුත් කරන ලද විභාග ප්‍රවේශ පත්‍ර මින් ඉදිරියට වලංගු නොවන බවත්, නව විභාග දින සඳහන් කරමින් සකස් කරන ලද නව විභාග ප්‍රවේශපත්‍ර අයදුම්කරුවන් වෙත තැපැල් මගින් එවීමට කටයුතු කරන බවත් කරුණාවෙන් සලකන්න.

**ලේඛකාධිකාරි (වැ. බ.),**
හෝමියෝපති වෛද්‍ය සභාව.

හෝමියෝපති වෛද්‍ය සභාව,
අංක 94, ෂෙල්ටන් ජයසිංහ මාවත,
වැලිසර,
රාගම.

07 - 428

---

**අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය**

බන්ධනාගාර දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ, ප්‍රාථමික - ශිල්පීය සේවා ගණය (III ශ්‍රේණිය) රියදුරු (දෙපාර්තමේන්තුගත) හා ගිලන්රථ රියදුරු තනතුරු සඳහා වන විවෘත තරග විභාගය - 2026**

ඉහත විභාගයේ අයදුම්පත් කැඳවීම සඳහා 2026.07.17 දින රජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයේ 07 වන වගන්තිය පහත පරිදි සංශෝධනය විය යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

07. විභාග ගාස්තු :

විභාග ගාස්තුව රු. 600/-කි. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ නිල ගිණුම වන ලංකා බැංකුවේ බොරැල්ල අධිශ්‍රේණි ශාඛාවේ අංක 7041491 දරන ගිණුමට දිවයිනේ පිහිටි ඕනෑම ලංකා බැංකු ශාඛාවක් වෙත මුදල් ගෙවා අයදුම්කරු නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ ඇලවිය යුතු ය. කිසිම හේතුවක් නිසා විභාග ගාස්තු ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයකට මාරු කිරීමක් නොකෙරේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

**ආර්. ප්‍රසාද් හේමන්ත කුමාර,**
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රා. ආ.).

2026 ජූලි මස 21 වැනි දින.

07 - 437

---

**සංශෝධනයයි**

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

2026.07.03 දින පළවූ අංක 2496 *ගැසට් පත්‍රයේ* නිවේදන අංක 07-45 යටතේ වූ දැන්වීමෙහි අංක 09-111 ඡේදයේ අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් 2026.07.27 දිනට පෙර ලැබෙන සේ එවිය යුතු බව සඳහන් කර ඇත. එම දිනය 2026.08.03 ලෙස නිවැරදි විය යුතු ය.

එම නිවේදනයේ සඳහන් අනෙකුත් වගන්ති නොවෙනස්ව පවතී.

**ලේකම්,**
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික
කටයුතු අමාත්‍යාංශය,

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
ජාතික උරුම අංශය,
04 වැනි මහල,
සෙත්සිරිපාය - 11 අදියර,
බත්තරමුල්ල.

07 - 498

**ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) වෙත 2026 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීමේ අවසාන දිනය දීර්ඝ කිරීම.**

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ (SLIATE) 2026 අධ්‍යයන වර්ෂය සඳහා නවක සිසුන් බඳවා ගැනීමට අදාළව 2026 ජූලි මස 03 වන දින ප්‍රකාශයට පත් කළ ගැසට් නිවේදනය හා බැඳේ. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයෙහි උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා අයදුම් කිරීමේ අවසන් දිනය 2026 අගෝස්තු මස 17 වන දින දක්වා දීර්ඝ කර ඇත. වැඩි විස්තර නිල වෙබ් අඩවිය වන www.sliate.ac.lk හෝ apply.sliate.ac.lk වෙත පිවිසෙන්න.

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය.

07 - 451

---

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

අහදියියා දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2026

2025 වර්ෂයට නියමිත අහදියියා දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලබන අතර, විභාගය 2026 **ඔක්තෝබර් මස** පැවැත්වීමට කටයුතු යොදා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. **විභාග මධ්‍යස්ථාන :-** උපලේඛනය - 01 හි දක්වා ඇති සෑම දිස්ත්‍රික්කයකම පිහිටි නගරවල අයදුම්කරුවන් සංඛ්‍යාව අනුව විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ඇත. එහෙත් යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවලදී එකී නගරයේ විභාග මධ්‍යස්ථාන අවලංගු කොට අදාළ අයදුම්කරුවන් ඊට ආසන්නව පිහිටි වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කිරීමට සිදුවනු ඇත.

03. **භාෂා මාධ්‍යය :-** මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. එහෙත් යම් අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු ලබන්නේ තමන් කැමති එක් භාෂා මාධ්‍යයකින් පමණි. අයදුම්පතේ සඳහන් කරන ලද භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

04. **සුදුසුකම් :-** මෙම විභාගය සඳහා අයදුම් කරන සෑම අයදුම්කරුවකුම පහත දක්වා ඇති සුදුසුකම් අතුරින් යටත් පිරිසයින් කවර හෝ එක් සුදුසුකමක් සපුරා තිබිය යුතුය.

4.1. මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අහදියියා දහම් පාසලක 10 වන ශ්‍රේණිය සමත් වී අහදියියා දහම් පාසල් අවසාන සහතික පත්‍ර පන්තියේ යටත් පිරිසයින් වර්ෂයක් හෝ ඉගනුම් කටයුතුවල නිරත වීම.

4.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ඉස්ලාම් ධර්මය විෂයයෙන් සමත්ව සිටීම හෝ ජොෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් ඉස්ලාම් සහ අරාබි විෂයයන්ගෙන් සමත්ව සිටීම.

05. අයදුම් කිරීම :

5.1 ලියාපදිංචි අහදියියා දහම් පාසල්/ අරාබි විද්‍යාල ප්‍රධානීන් විසින්ම ඉදිරිපත් කළ යුතු මෙම අයදුම්පත් තැපැල් මගින් මේ වන විට අහදියියා දහම් පාසල්/ අරාබි විද්‍යාල වෙත යොමුකර ඇති අතර www.doenets.lk වෙබ් අඩවිය මගින් ද බාගත කර ගැනීමේ පහසුකම් සලසා ඇත.

5.2 නව අහදියියා දහම් පාසලක්/ අරාබි විද්‍යාලයක් විසින් අයදුම්පත් ඉදිරිපත් කරන්නේ නම් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සහතිකයේ පිටපතක් අයදුම්පතට අමුණා එවිය යුතු ය.

5.3 කවර හෝ අයදුම්කරුවකුට බාහිර අයදුම්කරුවකු වශයෙන් විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. එසේ වුවත් 4 වැනි ඡේදයේ සුදුසුකම් සපුරා ඇති යම් විභාග අපේක්ෂකයකු වේ නම් තමන් පදිංචි ස්ථානයට ආසන්න අහදියියා දහම් පාසල හෝ අරාබි විද්‍යාල මගින් රුපියල් 200/-ක විභාග ගාස්තුවක් ගෙවා විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා අවශ්‍ය උපදෙස් සියලුම අහදියියා දහම් පාසල් විද්‍යාලපති/ අරාබි විද්‍යාල විද්‍යාලපති වෙත ලබා දී ඇත.

5.4 අදාළ අහදියියා දහම් පාසල්/ අරාබි විද්‍යාල ප්‍රධානීන් විසින්ම ඉදිරිපත් කළ යුතු මෙම අයදුම්පත් පිටපත් දෙකකින් යුක්තව සකස් කර මුල් පිටපත විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු අතර දෙවන පිටපත අහදියියා දහම් පාසල්/ අරාබි විද්‍යාල ප්‍රධානීන් වෙත තබා ගත යුතු ය. අයදුම්පත් දෙකෙහිම අයදියියා දහම් පාසල්/ අරාබි විද්‍යාල ප්‍රධානීන් අත්සන් කර තිබිය යුතු ය.

5.5 මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව

අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමග ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

5.6 අයදුම්පත් භාරගැනීම **2026.07.24** දිනෙන් ආරම්භ වී **2026.08.24** දිනෙන් අවසන් වේ.

5.7 අයදුම්පත්වල අපේක්ෂකයන්ගේ නම් ඇතුළත් කිරීමේදී උප්පැන්න සහතිකයේ සහ ජාතික හැඳුනුම්පතේ සඳහන් ආකාරයටම විය යුතු අතර ජාතික හැඳුනුම්පත් අංකය සටහන් කිරීම අනිවාර්යය වේ. ප්‍රතිපල ලබාදීමෙන් පසුව නාම සංශෝධන සඳහා කරන ඉල්ලීම්වලදී මුද්‍රණ දෝෂ හැරුණු විට වෙනත් ඉල්ලීම් සම්බන්ධව සලකා බලනු නොලැබේ. අයදුම්පත් පැහැදිළිව ද, නිවැරදිව ද සම්පූර්ණ කළ යුතු ය. එසේ නොවන අයදුම්පත් සහ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.8 විභාගයට ඉදිරිපත් කරන සියලුම අයදුම්පකරුවන් විසින් අයදුම්පතේ සඳහන් සම්පූර්ණ කර ඇති තොරතුරු පෞද්ගලිකව පරීක්ෂා කර බලා අත්සන් කළ යුතු අතර, සියලු අයදුම්කරුවන්ගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක් විභාග ප්‍රතිඵල නිකුත් කරන තෙක් අහදියියා දහම් පාසල් විදුහල්පතිවරයා ළඟ තබා ගත යුතු ය.

5.9 අයදුම්කරුවන්ගේ අදාළ සහතික පිළිබඳවත්, සුදුසුකම් ලබා තිබීම පිළිබඳවත්, අයදුම්පත් සහතික කරන විදුහල්පතිවරයා වගකිව යුතු ය.

5.10 ශ්‍රී ලකා විභාග දෙපාර්තමේන්තුවෙන් නිකුත් කර ඇති අහදියියා දහම් පාසලේ/ අරාබි විදුහලේ පරිගණක අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු අතර, අහදියියා දහම් පාසලේ/ අරාබි විදුහලේ ලිපිනය වෙනස් වී නම් එය දැන්විය යුතු අතර අහදියියා දහම් පාසලේ/ අරාබි විදුහලේ විදුහල්පතිවරයා සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය ද සඳහන් කරන්න.

5.11 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් **"විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල"** යන ලිපිනයට එවිය යුතු වේ. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ. අයදුම්පත බහා එවන කවරයේ වමත්පස කෙළවරේ **"අහදියියා දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2026"** යනුවෙන් ද ඉල්ලුම් කරන නගරය ද සඳහන් කළ යුතු ය.

5.12 තැපෑලේ දී යම් අයදුම්පතක් නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබෙන අතර අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් පිළිබඳ වගකීම අහදියියා දහම් පාසල් / අරාබි විදුහල් ප්‍රධානීන් විසින් භාර ගත යුතු ය.

06. *විභාග ගාස්තු :-* මෙම විභාගය සඳහා නියමිත විභාග ගාස්තුව රු. 200කි. එහෙත් ප්‍රථම වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් මෙම විභාග ගාස්තුවෙන් නිදහස් කරනු ලැබේ. ඌන සාමාර්ථ්‍යය සම්පූර්ණ කිරීම සඳහා විභාග ගාස්තු රු. 50 කි.

6.1 *විභාග ගාස්තු ගෙවීම :-* අදාළ අහදියියා දහම් පාසලේ විදුහල්පති විසින්/ අරාබි විදුහලේ විදුහල්පති විසින් විභාග ගාස්තු ගෙවීමට නියමිත සියලුම අයදුම්කරුවන්ගේ විභාග ගාස්තු එකතු කර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආදායම් ශීර්ෂ අංක 20-03-02-13ට බැරවන සේ දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට එම සම්පූර්ණ මුදල ගෙවා ලදුපතක් ලබාගෙන එම ලදුපත අයදුම්පතේ පසු පිටේ නොගැලවෙන සේ අලවා එවිය යුතු ය. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

6.2 කුමන කරුණක් නිසාවත් මෙම විභාගය සඳහා ගෙවන ගාස්තු වෙනත් විභාගයකට මාරු කිරීම හෝ ආපසු ගෙවීම හෝ සිදු කරනු නොලැබේ.

07. *විභාග ප්‍රවේශ පත්‍ර :-* විභාගයට ඇතුළත් කර ගන්නා සෑම අයදුම්කරුවකු වෙතම, විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍රයක් අයදුම්පත් ඉදිරිපත් කළ අහදියියා දහම් පාසල්/ අරාබි විදුහල් ප්‍රධානීන් වෙත නිකුත් කරනු ඇත.

7.1 විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකුම ස්වකීය විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගෙන විභාගයට පෙනී සිටින ප්‍රථම අවස්ථාවේ දී ම විභාග ශාලාධිපති වෙත භාර දිය යුතු ය. යම් අයදුම්කරුවකු තම විභාග ප්‍රවේශ පත්‍රය භාර නොදී සිටී නම් හෝ විභාග කොමසාරිස් ජනරාල් විසින් තමාට නියම කරන විභාග මධ්‍යස්ථාන හැර වෙනත් විභාග මධ්‍යස්ථානයකදී විභාගයට පෙනී සිටී නම් ඔහුගේ හෝ ඇයගේ හෝ විභාග අපේක්ෂකත්වය අහෝසි කරනු ඇත.

7.2 ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන, අහදියියා දහම් පාසලේ විදුහල්පති/ අරාබි විදුහලේ විදුහල්පති විසින් හෝ ග්‍රාම නිලධාරි විසින් සහතික කළ යුතු ය.

7.3 විභාගය පැවැත්වීමට දින 07කට පෙර විභාග ප්‍රවේශ පත්‍ර නොලැබුණහොත් එම අහදියියා දහම් පාසලේ විදුහල්පති/ අරාබි විදුහලේ විදුහල්පති විසින් ඒ

බව නොපමාව විභාග කොමසාරිස් ජනරාල් වෙත දැන්විය යුතු ය. එවැනි සෑම අවස්ථාවකම පහත සඳහන් විස්තර සැපයිය යුතු ය.

1. විභාගයේ නම
2. අහදියියා දහම් පාසලේ / අරාබි විදුහලේ නම හා දුරකථන අංකය
3. අහදියියා දහම් පාසලේ / අරාබි විදුහලේ ලිපිනය
4. අහදියියා දහම් පාසලට / අරාබි විදුහලට ලබාදී ඇති පරිගණක අංකය
5. අයදුම්කරුගේ සම්පූර්ණ නම
6. අයදුම් කළ විභාග මධ්‍යස්ථානය/ නගරය
7. අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය
8. අයදුම්පත ලියාපදිංචි කළ කුවිතාන්සිය
9. විභාග ගාස්තු ගෙවා ඇත්නම් එම ලදුපතේ පිටපත ;

08. *අනන්‍යතාව :-* විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

ජාතික හැඳුනුම්පත්;
වලංගු විදේශ ගමන් බලපත්‍රය;
වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණු ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කරගත හැකි වන රිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

09. විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

10. සමත් බව තීරණය කිරීම හා ප්‍රතිඵල නිකුත් කිරීම :-

මෙම විභාගය සඳහා නියමිත විෂයයන් ගණන හතරක් (04) වන අතර, විභාගයෙන් සාමර්ථ්‍යය ලැබීම සඳහා සෑම විභාග අපේක්ෂකයකුම එම විෂයයන් හතරෙන්ම සමත් විය යුතු ය. කෙසේ වෙතත් එක් වතාවකදී අදාළ විෂයයන් හතරෙන් එක් විෂයයක් පමණක් අසමත් නම් එය ඌන සාමාර්ථ්‍යයක් ලෙස සලකනු ලැබේ. විභාගයට පෙනී සිටි වර්ෂයේ සිට අනුගාමී ඉදිරි විභාග වර්ෂ දෙක (02) ඇතුළත දී එම ඌන සාමර්ථ්‍යය ලැබූ විෂයය සඳහා නැවත පෙනී සිට එය සමත් වී ඌන සාමාර්ථ්‍යය සම්පූර්ණ කළ යුතු ය. ඌන සාමාර්ථ්‍යය ලබන සිසුන් ඌන සාමාර්ථ්‍ය සම්පූර්ණ කිරීමේදී විභාගයට පෙනී සිටිය යුත්තේ අනිවාර්යයෙන්ම ඌන සාමාර්ථය ලැබූ විෂයයට පමණි.

10.1 සෑම විෂයයකම එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 100ක් හිමිවන අතර සමත්වීමේ ශ්‍රේණිවලට අදාළ ලකුණු පරාස සහ සංකේත පහත දැක්වේ :-

| *ලකුණු පරාසය* | *ශ්‍රේණිය* | *සංකේතය* |
|---|---|---|
| 0-34 | අසමත් | F |
| 35-54 | සමත් | S |
| 55-69 | සම්මාන | C |
| 70-100 | විශිෂ්ට සම්මාන | D |

10.2 අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලැයිස්තුව අදාළ අහදියියා දහම් පාසලේ විදුහල්පති/ අරාබි විදුහලේ විදුහල්පති වෙත තැපැල් මගින් එවනු ලැබේ.

10.3 විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

11. *සහතික පත්‍ර :-* මෙම විභාගයෙන් සමත් වන සෑම අයදුම්කරුවකුටම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සහතික පත්‍රයක් නිකුත් කිරීමට විධිවිධාන යොදනු ලැබේ. අදාළ සහතික පත්‍ර අහදියියා දහම් පාසල් විදුහල්පති / අරාබි විදුහලේ විදුහල්පති වෙත තැපැල් මගින් එවනු ලැබේ. විභාගය සමත්ව එහෙත් සහතික පත්‍රයක් නොලැබුණු යම් අපේක්ෂකයකු වේ නම්, ඒ පිළිබඳ අහදියියා දහම් පාසල් විදුහල්පති මගින් හෝ අරාබි විදුහලේ විදුහල්පති මගින් විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග ප්‍රතිඵල ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයෙන් ලිඛිතව විමසීම් කළ යුතු ය.

12. *උත්තර පත්‍ර නැවත සමීක්ෂණය :-* අහදියියා දහම් පාසල් විදුහල්පති/ අරාබි විදුහලේ විදුහල්පතිගේ ඉල්ලීම මත පමණක් උත්තර පත්‍ර නැවත සමීක්ෂණයට ඉඩදෙනු ලැබේ. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයකින්, විභාග ප්‍රතිඵල නිකුත් වී දින 30ක් ඇතුළත නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා වන ගාස්තු වරින් වර සංශෝධනය වීමට ඉඩ ඇති බැවින් එය අදාළ අයදුම්පතෙහි දක්වනු ලැබේ. කවර හේතුවක් නිසාවත් අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ උත්තර පත්‍ර පරීක්ෂා කිරීමට ඉඩදෙනු නොලැබේ.

13. විෂය නිර්දේශය :-

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කොට පැවැත්වීමට නියමිත අහදියියා දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගයට අදාළ විෂය නිර්දේශය උපලේඛනය - 02 ලෙස මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇත.

14. මූලාකෘති ප්‍රශ්න පත්‍ර :-

මූලාකෘති ප්‍රශ්න පත්‍ර සඳහා "අධ්‍යක්ෂ, මුස්ලිම් ආගමික හා සංස්කෘතික දෙපාර්තමේන්තුව, 180 , ටී. බී. ජායා මාවත, කොළඹ 10." යන ලිපිනයෙන් හෝ 011-2667909 / 011- 266994 විමසන්න.

15. මෙම නිවේදනයේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට සියලුම විභාග අයදුම්කරුවන් බැඳී සිටින අතර, මෙහි විධිවිධාන සලසා නැති කවර හෝ යම් කරුණක් වෙතොත් එය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය වනු ඇත.

16. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

## උපලේඛනය - 01

### දිස්ත්‍රික්කයට අනුව විභාග පැවැත්වෙන නගර හා නගර අංකය

| දිස්ත්‍රික් අංකය | නගර අංකය | නගරයේ නම |
|---|---|---|
| 01 - කොළඹ | 101 | මරදාන |
| | 102 | බම්බලපිටිය |
| 02-ගම්පහ | 201 | මීගමුව |
| | 202 | නිට්ටඹුව |
| 03-කළුතර | 301 | කළුතර |
| | 302 | පානදුර |
| | 303 | අලුත්ගම |
| 04 - මහනුවර | 401 | මහනුවර |
| | 402 | නාවලපිටිය |
| 05 - මාතලේ | 501 | මාතලේ |
| 06 - නුවරඑළිය | 601 | නුවරඑළිය |
| | 602 | හැටන් |
| 07 - ගාල්ල | 701 | ගාල්ල |
| 08 - මාතර | 801 | මාතර |
| | 802 | අකුරැස්ස |
| 09 - හම්බන්තොට | 901 | හම්බන්තොට |
| | 902 | වීරකැටිය |
| 10 - යාපනය | 1001 | යාපනය |
| 11 - මන්නාරම | 1101 | මන්නාරම |
| 12 - වව්නියාව | 1201 | වව්නියාව |
| 13 - මුලතිව් | 1301 | මුලතිව් |
| 14 - කිලිනොච්චි | 1401 | කිලිනොච්චි |
| 15 - මඩකලපුව | 1501 | කාත්තන්කුඩි |
| | 1502 | වාලච්චේන |
| | 1503 | එරාවූර් |
| 16 - අම්පාර | 1601 | අම්පාර |
| | 1602 | සමන්තුරේ |
| | 1603 | ඉරක්කාමම් |
| | 1604 | පොතුවිල් |
| | 1605 | කල්මුනේ |
| | 1606 | නින්තවූර් |
| | 1607 | අක්කරෙපත්තු |
| 17 - ත්‍රිකුණාමලය | 1701 | ත්‍රිකුණාමලය |
| | 1702 | මූතූර් |
| | 1703 | කින්නියා |
| 18 - කුරුණෑගල | 1801 | කුරුණෑගල |
| | 1802 | නාරම්මල |
| | 1803 | කුලියාපිටිය |
| | 1804 | සියඹලාගස්කොටුව |
| 19 - පුත්තලම | 1901 | පුත්තලම |
| | 1902 | මදුරන්කුලිය |
| | 1903 | නොරොච්චෝලය |
| | 1904 | කනමූලෙයි |
| | 1905 | හලාවත |
| 20 - අනුරාධපුරය | 2001 | අනුරාධපුර |
| | 2002 | කැකිරාව |
| | 2003 | හොරොව්පොතාන |
| 21 - පොළොන්නරුව | 2101 | පොොන්නරුව |
| | 2102 | කදුරුවෙල |
| 22 - බදුල්ල | 2201 | බදුල්ල |
| | 2202 | හාලිඇළ |
| | 2203 | බණ්ඩාරවෙල |
| | 2204 | වැලිමඩ |

| *දිස්ත්‍රික් අංකය* | *නගර අංකය* | *නගරයේ නම* |
|---|---|---|
| 23 - මොනරාගල | 2301 | බිබිල |
| 24 - රත්නපුර | 2401 | රත්නපුර |
| | 2402 | ඇහැලියගොඩ |
| | 2403 | රක්වාන |
| 25 - කෑගල්ල | 2501 | මාවනැල්ල |
| | 2502 | වරකාපොල |
| | 2503 | කන්නන්තොට |

### උපලේඛනය - 02

**මෙම විභාගය පැය තුනක් (03) බැගින් වූ ප්‍රශ්න පත්‍ර හතරකින් (04) සමන්විත වේ.**

### පළමුවන ප්‍රශ්න පත්‍රය

01. ඉස්ලාමීය සිද්ධාන්ත හා මූලිකාංග (අල් අකීදා වෂ්ෂරීආ) සහ අරාබි භාෂාව

1.1. අකීදා පොදු පැහැදිලි කිරීම් (අල් ඉලාහියයාත්, අන්නුබුව්වත්, අර්රුහානියත්, අස්සම් ඉය්යාත්)

1.2. අකීදාවේ කොටස්
අහුලුස්සුන්නා වල්ජමා අත්හි අකීදා
අනිකුත් අකීදා කොටස් කිහිපයක් : ජබරිය්යා, කදරිය්යා, මුර්ජියා, මු:තසීලා, ෂියා

1.3 තෞහිද් හා ෂිර්ක්කු

ඊමාන් හා කුෆ්රු
රිද්දත්, නිෆාක්
අල්කුර්ආණය පහල කර එය සම්පාදනය කරන ලද ආකාරය පිළිබඳ ඉතිහාසය
නීති මූලධර්මයන් වශයෙන් අල්කුරාණයේ උපයෝජනය
සුන්නාවේ බිහිවීම හා එය සම්පාදනය කළ ඉතිහාසය
නෛතික මූලධර්ම වශයෙන් සුන්නාවේ උපයෝජනය
හදීස් කලා ඉතිහාසය හා ප්‍රධාන මුහද්දීස්වරුන්ගේ දායකත්වය
ඉජ්තිහාද් පිළිබඳ විස්තර
ආධාරක මූලධර්මයන් වශයෙන් ඉජ්මා
අධාරක මූලධර්මයන් වශයෙන් කියාස්
ෆික්හයේ ඉතිහාසය හා ප්‍රධාන ඉමාම්වරු

1.4 අරාබි භාෂාව

හැඩහුරු සහිතව ලිවීම
කුඩා වාක්‍යයන් ලිවීම
ඉස්ලාම් විෂයයට අදාළ අරාබි වචන ලිවීම
ප්‍රධාන සූරා, ආයත්, හදීස් ආදිය නිවැරදිව ලිවීම

### දෙවන ප්‍රශ්න පත්‍රය

02. ඉස්ලාමීය නීති පද්ධතිය (අල් ෆික්හුල් ඉස්ලාම් )

2.1 ඉබාදත් පිළිබඳ විස්තර
ඉබාදතයේ කොටස්
තහාරත්

2.2 නජීසය හා එහි කොටස්

නජීසය පිරිසිදු කිරීමේ ක්‍රම
ජලය හා එහි වර්ග
වුලූ, තයම්මුම්, ස්නානය පිළිබඳ පවතින ක්‍රියාදාමයන්

2.3 සකාත්

වැදගත්කම
විධි හා ක්‍රම
එක්රැස් කිරීම හා බෙදා හැරීම
සකාත් මගින් දිළිඳුකම තුරන් කිරීම සහ සම්පත් බෙදීම

2.4 නෝම්බිය (උපවාසය)

වැදගත්කම
විධි ක්‍රම හා ප්‍රයෝජන

2.5 හජ්

වැදගත්කම
විධි ක්‍රම හා ප්‍රයෝජන

2.6 හජ් ඉටුකරන ක්‍රම

පරලු වාජිබ් සුන්නත්
පරලු හජ් යට අමතරව ඉටුකරන හජ්

2.7 ඉස්ලාම්හි ආහාර, ඇඳුම්, වාසස්ථාන පිළිබඳ අවධානය හා ක්‍රියාදාම

2.8 ජිහාද් පිළිබඳ පැහැදිලි කිරීම

2.9 කුර්බානි හා කැපුම් ක්‍රමයන්

2.10 දිවුරුම් හා භාරවීම

2.11 මුආමලාත් පිළිබඳ විස්තර
ඉපයීමේ වැදගත්කම
ප්‍රධාන ගනුදෙනු (වෙළඳාම)
අනෙකුත් ගනුදෙනු (උදා :- තාවකාලිකව ඉල්ලා ගැනීම, බදු ගැනීම)
වක්ෆු, වසීය්‍යත්, වරාසත් (පොදු දේපළ, මුදල් දේපළ, පරම්පරා දේපළ)

2.12 ඉස්ලාමිහි ස්ත්‍රී, පුරුෂ තත්ත්වයන්

නිකායේ විධි හා ප්‍රයෝජන
පවුල් ජීවිතය
අඹුසැමියන්
දෙමාපිය, දූදරු අයිතිවාසිකම් හා යුතුකම්
තලාක් හා ඉද්දා

2.13 ජිනායත්
හුදූද්, කියාස්, ත:සීර්

**තුන්වන ප්‍රශ්න පත්‍රය**

03. ඉස්ලාමීය ඉතිහාසය (අස්සීරා වත්තාරික්)

3.1.1 නබි (සල්) තුමා

නුබුව්වතයට පෙර ජීවිතය
පවුල, පරම්පරාව
තරුණ විය
උතුම් ගුණාංග
විවාහය

නුබුව්වත් හා හිජ්රත් අතර ජීවිතය
නුබුව්වත් ලැබීම
ඉස්ලාමීය ප්‍රචාරයන් හා එහි ප්‍රතිඵල
මි:රාජ්
හිජ්රත්

මදීනා ජීවිතය
සමාජ දේශපාලන ක්‍රියාකාරකම්
ආත්මාරක්ෂා යුද්ධයන් හා සාම ගිවිසුම්
ඉස්ලාම් සම්පූර්ණ වීම
සහාබාවරුන්ගේ තත්ත්වයන් හා ඉස්ලාමය වෙනුවෙන් එතුමන්ලාගේ දායකත්වයන්
කුලපාඋර්රා සීදූන් යන අයගේ ඉතිහාසය හා දේශපාලන දායකත්වය
උමය්‍යා අබ්බාසිය්‍යා පාලන කාලය
බයිතුල් මුකද්දසයේ ඉතිහාසය
ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය හා දායකත්වය

පහත සඳහන් අය පිළිබඳ ඉතිහාසය

ඉමාම් බුහාරි (රහ්)
ඉමාම් ෂාපිර් (රහ්)
ඉමාම් ගස්සාලි (රහ්)
ඉමාම් අබ්දුල් කාදර් පිලාන් (රහ්)
ඉමාම් ෂාදුලි (රහ්)

**හතරවන ප්‍රශ්න පත්‍රය**

04. ඉස්ලාමීය සාරධර්මය (අල් අහ්ලාක්)

4.1 අක්ලාක් පිළිබඳ ඉස්ලාමයේ අවධානය

අක්ලාක් පිළිබඳ විස්තර
ඊමාන් සහ අක්ලාක් අතර පවතින සම්බන්ධතා
අක්ලාක් හා ඉබාදත් අතර තිබෙන සම්බන්ධතා
හෘද පවිත්‍රත්වය (ඉක්ලාස්)

4.2 තක්වා

වරඋසුන්ද්
මුරාකබා, මුහාසබා
ෂවුක් (දේව කාරුණාව)

4.3 දන්දීම

කැපවීම
කෘතඥභාවය
ඉවසීම, හික්මීම, ඉඩදීම, සමාවීම
බැගෑපත්වීම
කාලය අගය කිරීම
අවයවයන් රැකගැනීම කට, ඇස, කණ, ලිංගික අංගය
අන් අයට ගෞරව කිරීම
යුක්තිය හා අවංකභාවය
තරුණ තරුණියන් අතර දක්නට ලැබිය යුතු වැදගත් සදාචාර ගුණාංගය
නිකුත් ආගමික අය අතර වූ සහජීවනය

4.4 ඉස්ලාමීය නීති පද්ධතිය

07 - 336

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.